# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 155/7 — 1975 මාර්තු 19 වැනි බදාදා — 1975.03.19

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබ්ලිව්. 68(49)/75.

**මහාජන ආරක්ෂක ආඥාපනත (40 වන අධිකාරය)**

අගමැතිගේ නිර්දේශය අනුව, මහාජන ආරක්ෂක ආඥාපනතේ 5 වෙනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝග.

වි. ගොපල්ලව,
ජනාධිපතිවරයා.

ජනාධිපති කාර්යාලය,
කොළඹ, 1975 මාර්තු මස 19 වන දින.

### නියෝග

**I වන කොටස—සාමාන්‍ය**

1. මේ නියෝග 1975 අංක 3 දරන හදිසි අවස්ථා (විවිධ විධිවිධාන හා බලතල) නියෝග නමින් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (1) යම් හදිසි අවස්ථා නියෝගයක වෙනත් නිරූපණයක් පැහැදිලිව එහි සඳහන් කොට නොමැති විටක හෝ අන් ලෙසකින් එහි ප්‍රකාශිතවම විධිවිධාන සලස්වනු නොලැබූ විටක හෝ පද සම්බන්ධයෙන් විරුද්ධ අර්ථයක් අවශ්‍ය නොවූ විටක— — හදිසි අවස්ථා නියෝගවල අර්ථ නිරූපණය.

යම් හදිසි අවස්ථා නියෝගයක් සම්බන්ධයෙන් ''නීතිපති'' යන්නට නියෝජ්‍ය නීතිපති සහ උප නීතිපති, රජයේ අපරාධ නඩු අධ්‍යක්ෂ සහ රජයේ නියෝජ්‍ය අපරාධ නඩු අධ්‍යක්ෂ හෝ ඒ නියෝගයෙහි කාර්යය සඳහා ඒ වෙනුවෙන් නීතිපති විසින් බලය පවරනු ලැබූ රජයේ නීතිඥයකු වූ රජයේ යම් නීතිඥයෙක් අදහස් වේ.

යම් හදිසි අවස්ථා නියෝගයක වෙනත් අන්දමකින් විධිවිධාන සලස්වනු ලැබුවහොත් මිස, '' නියම බලධරයා '' යන්නෙන්, ඒ නියෝගයෙහි කාර්යය සඳහා නියම බලධරයකු වශයෙන් අගමැති විසින් නමින් හෝ නිලයෙන් පත් කරනු ලැබූ යම් තැනැත්තෙක් අදහස් වේ ;

'' හදිසි අවස්ථා නියෝගය '' යන්නෙන්, මේ නියෝගවලින් යමක් හෝ මහාජන ආරක්ෂක ආඥාපනත යටතේ පනවනු ලැබ එවකට බලපැවැත්වෙන අන්කිසි නියෝගයක් අදහස් වේ ;

'' අත්‍යවශ්‍ය සේවය '' යන්නෙන්, මහාජන ප්‍රයෝජනය සඳහා විය යුතුයයි හෝ මහාජන ආරක්ෂාවට හෝ ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය විය යුතුයයි ජනාධිපතිවරයාගේ ආඥාවකින් ප්‍රකාශ කරනු ලබන යම් සේවයක් අදහස් වේ. තවද එබඳු සේවයක් ලෙස ප්‍රකාශ කරනු ලැබූ රජයේ දෙපාර්තමේන්තුවක් හෝ එහි ශාඛාවක් ද එයට ඇතුළත් වේ ;

'' පුපුරණ ද්‍රව්‍ය '' යන්නෙහි පුපුරණ ද්‍රව්‍ය ආඥාපනතෙහි එයට දී තිබෙන අර්ථයම ඇත්තේය ; — 183 අධි.

'' තුවක්කුව '' යන්නෙහි තුවක්කු ආඥාපනතෙහි එයට දී ඇති අර්ථයම තිබිය යුතුය ; — 182 අධි.

'' පොලිස්පති '' යන්නට යම් නියෝජ්‍ය පොලිස්පතිවරයෙක් ද ඇතුළත් විය යුතුය ;

''ඉඩම'' යන්නට ජලයෙන් වැසුනු ඉඩම් ද ගෙවල්වල හෝ ගොඩනැගිලිවල කොටස් ද ඇතුළත් වේ ;

53 අධි.

" පොලිස් නිලධරයා " යන්නෙන්, පොලිස් ආඥාපනත යටතේ පිහිටුවන ලද යම් පොලිස් හමුදවක සාමාජිකයෙක් අදහස් වෙයි ;

යම් දේපළක් සම්බන්ධයෙන් " බලයෙන් ගැනීම " යන්නෙන්, යම් දේපළක් ස්වාමිත්වයට ගැනීම හෝ බලයෙන් හිමිකර ගැනීමේ බලධරයාට කැමැත්තක් කිරීම සඳහා දේපළ භාරදෙන ලෙස නියම කිරීම අදහස් වේ. තවද එහි ව්‍යාකරණ ප්‍රභේද හෝ ඒක වර්ගීය පාඨ ඒ අනුව තේරුම් ගත යුතුය ;

" ශ්‍රී ලංකා " යන්නට, එහි දේශීය ජල තීරය ඇතුළත් වේ ;

" රාජ්‍ය නිලධරයා " යන්නට, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එයට දී ඇති අර්ථයම තිබිය යුතුය;

" දේශීය ජල තීරය " යන්නෙන්, සාමාන්‍ය මහ වඩ දියෙහි ඇති බාදිය ඉමේ සිට මනිනු ලැබූ විට ශ්‍රී ලංකාවේ වෙරළෙහි සිට නාවික සැතපුම් 12ක දුර ප්‍රමාණයක් ඇතුළත පිහිටි මුහුදේ කොටස අදහස් වේ ;

" යාත්‍රාව " යන්නට, සෑම වර්ගයකම බෝට්ටු, ඔරු, පහුරු හා යාත්‍රා විශේෂ ඇතුළත් වේ.

2 අධි.

(2) අර්ථ නිරූපණ ආඥාපනත, පනතක හෝ ආඥාපනතක හෝ නීතියක අර්ථ නිරූපණය සඳහා අදළ වන්නාසේම, හදිසි අවස්ථා නියෝගයක හා එය යටතේ පනවනු ලැබූ ආඥාවල හෝ රීතිවල අර්ථ නිරූපණය සඳහා ද ඒ ආඥාපනත අදළ විය යුතුය.

(3) යම් හදිසි අවස්ථා නියෝගයක් පිළිබඳව, යම් ලේඛනයක හෝ වෙන යම් ලිඛිත නීතියක ඇති සෑම සඳහන් කිරීමක් ම විරුද්ධාර්ථයක් නොදක්වෙන විටක, මහජන ආරක්ෂක පනත යටතේ සාදනු ලැබූ ඉක්බිති නියෝගයකින් සංශෝධනය කරනු ලැබ එවකට බල පැවැත්වෙන ඒ නියෝගය සඳහන් කරනු ලැබූ ලෙස තේරුම්ගත යුතුය.

(4) මහජන ප්‍රයෝජනයට යම් සේවයක් විය යුතුයයි හෝ මහජන ආරක්ෂාවට හෝ ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය විය යුතු යයි ප්‍රකාශ කෙරෙන, ජනාධිපතිවරයා විසින් මේ නියෝගයෙහි (1) වෙනි ඡේදය යටතෙහි කරනු ලැබූ ආඥාවක් සාමාන්‍යයෙන් මුළු ශ්‍රී ලංකාව සඳහා හෝ ඒ ආඥාවෙහි නියමිත ප්‍රදේශයක් හෝ ස්ථානයක් සඳහා කරනු ලැබිය හැකිය.

(5) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ කරනු ලැබූ යම් විධානයක හෝ නියමයක කාලසීමාවක් සඳහන් කළයුතු බව ඒ නියෝගයෙන් නියම කෙරෙන අවස්ථාවක හෝ එසේ සඳහන් කළ යුතු බව එම නියෝගයෙන් හැකි කරවන අවස්ථාවක, සහ එවැනි යම් කාලසීමාවක් ඒ විධානයෙහි හෝ නියමයෙහි සඳහන් නොවන අවස්ථාවක, ඒ කාලසීමාව, එම විධානය හෝ නියෝගය දෙනු ලැබුවේ හෝ කරනු ලැබුවේ යම් නියෝගයක් යටතේ ද ඒ නියෝගය බලපවත්නා කාලසීමාව වශයෙන් සැළකිය යුතුය.

ජනාධිපතිවරයාගේ බලතල.

3. වෙනත් ආකාරයක්ට පැහැදිලිවම විධිවිධාන සලස්වනු ලැබූ විටක හැර, යම් හදිසි අවස්ථා නියෝගයක් මගින් පවරනු ලැබූ බලතල, ජනාධිපතිවරයා වෙත හෝ වෙනත් බලධරයකු හෝ තැනැත්තකු වෙත නීති මගින් පවරනු ලැබූ වෙනත් යම් අයිතිවාසිකම් හා බලතල හීන කිරීම සඳහා නොව ඊට අතිරේකව විය යුතුය.

හදිසි අවස්ථා නියෝග යටතෙහි අගමැතිගේ බලතල, යුතුකම් හා කාර්යයන් නියෝජනය කිරීම.

4. යම් හදිසි අවස්ථා නියෝගයකින් අගමැති වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ යම් බලයක්, යුතුකමක් හෝ කාර්යයක්, අගමැති විසින් ඒ වෙනුවෙන් බලය පවරනු ලැබූ වෙන යම් ඇමතිවරයකු විසින් ක්‍රියාවේ යෙදවීම හෝ ඉෂ්ට කිරීම කළ හැකිය.

නියම බලධරයා.

5. (1) යම් හදිසි අවස්ථා නියෝගයක කාර්ය සඳහා යම් තැනැත්තකු නියම බලධරයා වශයෙන් පත් කරනු ලැබීම සාමාන්‍යයෙන් මුළු ශ්‍රී ලංකාවටම හෝ ඒ තැනැත්තා පත් කරනු ලබන ලේඛනයෙහි නියමිත යම් ප්‍රදේශයකට හෝ ස්ථානයකට විය හැකිය. තවද ඒ ලේඛනයෙහි නියමිත යම් කාර්යවලට ඒ පත් කිරීම සීමා කළ හැකිය :

එසේ වුවද, එකී නියෝගයක යම් කාර්යයක් සඳහා හෝ නියමිත ප්‍රදේශයක් හෝ ස්ථානයක් සඳහා, නියම බලධරයන් දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් පත් කරනු ලැබීමට මේ ඡේදයේ පෙරාතුව වූ විධිවිධානවල කිසිවකින් අවහිර කරන ලෙස නොසැලකිය යුතුය.

(2) නම් කරනු ලැබූ නිලයක් දරන්නකු නියම බලධරයකු ලෙස පත්කරනු ලැබූ කල්හි, විරුද්ධාකාරයට විධිවිධාන පැහැදිලි ලෙස සලස්වා නොමැති අවස්ථාවකදී, නම් කරනු ලැබූ නිලයෙහි එවකට යුතුකම් ඉටු කරන තැනැත්තා ද ඒ පත්වීමට ඇතුළත් වන ලෙස සැලකිය යුතුය.

දැන්වීම් භාරදීම.

6. යම් හදිසි අවස්ථා නියෝගයක ඇතුළත් කරනු ලැබූ යම් විශේෂ විධිවිධානවලට හානියක් නොමැතිව, යම් හදිසි අවස්ථා නියෝගයක කාර්යය සඳහා යම් තැනැත්තකු වෙත භාරදිය යුතු දැන්වීමක්, ඒ තැනැත්තාගේ අන්තිම හෝ සිරිත් පරිදි වූ වාසස්ථානය හෝ ව්‍යාපාරික ස්ථානය වෙත ලියුමක මාර්ගයෙන් තැපැලෙන් යැවීමෙන් භාර දිය හැකිය.

ආඥා ආදිය අවලංගු කිරීම හා වෙනස් කිරීම.

7. යම් ආඥාවක් හෝ රීතියක් සෑදීම සඳහා යම් හදිසි අවස්ථා නියෝගයකින් පැවරුණු යම් බලයක, ඒ ආකාරයට හා යම් කොන්දේසි වෙතහොත්, ඒ කොන්දේසිවලට යටත්ව, ආඥාව හෝ රීතිය අවලංගු කිරීම හෝ වෙනස් කිරීම සඳහා පාවිච්චි කළ හැකි බලයක් ඇතුළත්වූ ලෙස තේරුම් ගත යුතුය.

## 2 වන කොටස—දේපළ අත්කර ගැනීම හා බලයෙන් ගැනීම හා පෞද්ගලික සේවාවන් බලයෙන් ගැනීම

දේපළ බලයෙන් ගැනීම හා අත්කර ගැනීම.

8. (1) මහජන ආරක්ෂාව, මහජන සාමය රැක ගැනීම හෝ ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය සැපයීම් හා සේවා පවත්වාගෙන යාම සඳහා නියම බලධරයකුට අවශ්‍ය යයි හෝ අවස්ථෝචිත යයි අදහස් වන්නේ නම්, ඒ නියම බලධරයා විසින් මෙහි මින්මතු සලස්වනු ලබන විධිවිධානවලට යටත්ව (ශ්‍රී ලංකාවේ නේවාසික යම් තැනැත්තකුට අයිති හෝ ශ්‍රී ලංකාවෙහි තිබෙන හෝ ශ්‍රී ලංකාවෙහි යම් තොටුපළක තිබෙන යම් යාත්‍රාවක් හෝ ගගන යානයක් ඇතුළුව) ශ්‍රී ලංකාවේ යම් භාණ්ඩයක් බලයෙන් ගත හැකිය. තවද බලයෙන් ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය යයි හෝ අවස්ථෝචිත යයි පෙනී යන නියමයන් නියම බලධරයා විසින් කළ හැකිය.

(2) මේ නියෝගයෙහි (1) වෙනි ඡේදය යටතෙහි නියම බලධරයා විසින් යම් දේපළක් බලයෙන් ගන්නා අවස්ථාවක හෝ ජනරජයේ වරප්‍රසාද හා අයිතිවාසිකම් ප්‍රකාර හෝ විදුලි සන්දේශ ආඥාපනතේ 7 වෙනි වගන්තියෙන් හෝ ගගන යාත්‍රා පනතෙහි 7 වෙනි වගන්තියෙන් පවරනු ලැබූ යම් බලය ප්‍රකාර ක්‍රියාවේ යෙදවිය හැකි යම් බලයක් ක්‍රියාවේ යෙදවීමේ හේතුවෙන් (ඉඩම් හැර) යම් දේපළක් නියම බලධරයාගේ ස්වාමිත්වයට පත් වූ හෝ ඔහුට සුදුස්සක් කළ හැකි අවස්ථාවක, මහජන ආරක්ෂාව, මහජන සාමය රැක ගැනීම හෝ ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය සැපයීම් හා සේවා පවත්වාගෙන යාම සඳහා නියම බලධරයකුට අවස්ථෝචිත යයි හැඟෙන ඒ කාර්‍යය සඳහා ඒ අන්දමකින් නියම බලධරයා විසින් දේපළ පාවිච්චි කළ හැකිය ; නැතහොත් ඒ සම්බන්ධයෙන් ක්‍රියා කළ හැකිය ; නැතහොත් පාවිච්චි කිරීම හා ක්‍රියාකිරීම සම්බන්ධයෙන් බලය පැවරිය හැකිය. දේපළ යම් උකසකින්, ඔඩපනයකින්, තබා ගැනීමේ අයිතියකින් හෝ වෙන යම් බැඳීමකින් නිදහස් වූවාක් මෙන්ද නියම බලධරයා එහි අයිතිකරු වූවාක් මෙන්ද ඔහු විසින් දේපළ තබා ගැනීම, විකිණීම හෝ වෙන යම් අන්දමකින් යමක් කිරීම කළ හැකිය. බලයෙන් ගනු ලැබූ දේපළ, යාත්‍රාවක්, වාහනයක්, ගගන යානයක්, භාරන යන්ත්‍රයක්, දෙඹකරයක්, කෘෂිකර්ම උපකරණයක් හෝ කෘෂිකර්ම යන්ත්‍රයක් වූ අවස්ථාවක, යාත්‍රාව, වාහනය, ගගන යානය, භාරන යන්ත්‍රය, දෙඹකරය, කෘෂිකර්ම උපකරණය හෝ කෘෂිකර්ම යන්ත්‍රය හිමි තැනැත්තාට නියම බලධරයා විසින් මේ නියෝගය ප්‍රකාර එය අත්කර ගත් බව සඳහන් දැන්වීමක් දීමෙන් එය අත්කර ගත හැකිය. අධි. 192. අධි. 365.

(3) මේ නියෝගයෙහි (2) වෙනි ඡේදය යටතේ යම් යාත්‍රාවක, වාහනයක, ගගන යානයක, භාරන යන්ත්‍රයක, දෙඹකරයක, කෘෂිකර්ම උපකරණයක හෝ කෘෂිකර්ම යන්ත්‍රයක අයිතිකරුවකුට අත්කර ගැනීමේ දැන්වීමක් භාර දෙනු ලැබූ අවස්ථාවක, දැන්වීම භාර දුන් දවස ආරම්භයේදී—

(අ) යාත්‍රාව, වාහනය, ගගන යානය, භාරන යන්ත්‍රය, දෙඹකරය, කෘෂිකර්ම උපකරණය හෝ කෘෂිකර්ම යන්ත්‍රය යම් උකසකින්, ඔඩපනයකින්, තබා ගැනීමේ අයිතියකින් හෝ වෙන් යම් බැඳීමකින් නිදහස්ව නියම බලධරයා සතු විය යුතුය ;

(ආ) තවද එය බලයෙන් ගැනීමේ කාලසීමාව කෙළවර විය යුතුය.

(4) මේ නියෝගයෙහි (1) වෙනි ඡේදයෙන් පවරනු ලැබූ බලතල බලාන්විත ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා එසේ කිරීම අවශ්‍ය යයි නියම බලධරයකුට අදහස් වන්නේ නම් ඒ නියම බලධරයා විසින් මුළු ශ්‍රී ලංකාව හෝ එහි යම් නියමිත ප්‍රදේශයක් සම්බන්ධයෙන් ආඥාවකින්—

(අ) ආඥාව ක්‍රියාත්මක වන අවස්ථාවෙහි ආඥාව අදාළ වන ප්‍රදේශයෙහි යම් භූමියක ආඥාවෙහි විස්තර කරනු ලැබූ යම් භාණ්ඩයක් ස්වාමිත්වයෙහි හෝ පාලනය යටතෙහි තබා ගෙන සිටින කිසිම තැනැත්තකු, ආඥාවෙහි නියම කරනු ලැබූ තැනැත්තකු හෝ බලධරයකු ඒ භූමියෙන් භාණ්ඩ ඉවත් කිරීමට අවසර දෙන තුරු, භාණ්ඩය ඉවත් කිරීම, ඉවත් කරවීම හෝ ඉවත් කිරීමට අවසරදීම නො කළ යුතු යයි නියම කළ හැකිය ;

(ආ) නියෝගයෙහි නියම කරනු ලබන දිනයක ඉහත සඳහන් පරිදි ඒ භාණ්ඩය භූමියෙහි තිබුණේ ද නැද්ද නැතහොත් තිබෙන්නේ ද නැද්ද, තවද එසේ නම් ආඥාවෙහි නියම කරන පරිදි ඒ දිනයෙහි භූමියෙහි තිබුන හෝ තිබෙන්නා වූ භාණ්ඩ ගණන හෝ ප්‍රමාණය සඳහන් ලිඛිත ප්‍රකාශයක් ආඥාවෙහි නියමිත තැනැත්තාට හෝ බලධරයාට යවන ලෙස එකී ප්‍රදේශයෙහි යම් භූමියක අයිතිකරුට හෝ පදිංචිකරුට නියම කළ හැකිය ; නැතහොත්

(ඇ) ආඥාවේ සඳහන් එකී ප්‍රදේශය තුළ යම් වාහනයක් කලින් කලට අයිතිව සිටින හෝ ස්වකීය අයිතියෙහි හෝ භාරයෙහි හෝ ස්වකීය අයිතිය හෝ භාරය යටතෙහි හෝ ස්වකීය පාලනය යටතෙහි වූ තැනැත්තකු විසින් (අමතර කොටස් ඇතුළුව) වාහනයට හා එහි කොටස්වලට ද එසේ නියම කරනු ලබන අමතර උපකරණවලට ද අදාළ තොරතුරු ආඥාවේ නියමිත ඒ බලධරයාට හෝ තැනැත්තාට ලියවිල්ලකින් සපයන ලෙස නියම කළ හැකිය.

(5) මේ නියෝගයෙහි පෙරාතුව විධිවිධාන යටතෙහි පවරනු ලැබූ බලතල, වලංගු මුදල්, රත්රන්, සුරකුම්පත් හෝ හුවමාරු පත්‍ර සම්බන්ධයෙන් ක්‍රියාවෙහි නොයෙදවිය යුතුය.

(6) මේ නියෝගයෙහි භාණ්ඩ සම්බන්ධයෙන් යම් සඳහන් කිරීමක ද්‍රව්‍ය, වාහන හෝ සතුන් සම්බන්ධ සඳහන් කිරීමක් අන්තර්ගත ලෙස තේරුම් ගත යුතුය.

(7) මහජන ආරක්ෂාව, මහජන සාමය රැක ගැනීම හෝ ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය සැපයීම් හා සේවාවන් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය හෝ අවස්ථෝචිත යයි අදහස් වන්නේ නම්, ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් ශ්‍රී ලංකාවේ යම් නිශ්චල දේපළක් බලයෙන් ගෙන එසේ බලයෙන් ගැනීම සම්බන්ධයෙන්, අවශ්‍ය හෝ අවස්ථෝචිත යයි ඔහුට පෙනී යන නියමයන් කළ හැකිය.

(8) මේ නියෝගයෙහි (7) වෙනි ඡේදය යටතෙහි යම් නිශ්චල දේපළක් බලයෙන් ගනු ලැබූ අවස්ථාවක මහජන ආරක්ෂාව, මහජන සාමය රැක ගැනීම හෝ ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය සැපයීම් හා සේවාවන් පවත්වාගෙන යාම සඳහා අවස්ථෝචිත යයි පෙනී යන කාර්‍යය සඳහා, එවැනි අන්දමකින් ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් ඒ දේපළ පාවිච්චි කිරීම හෝ ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීම කළ හැකිය ; නැතහොත් එය පාවිච්චි කිරීම හෝ ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා බලය පැවරිය හැකිය.

(9) මේ නියෝගයෙහි පෙරාතුව විධිවිධානවලින් යම් තැනැත්තකුට පවරනු ලැබූ බලතල ක්‍රියාවේ යෙදීම සම්බන්ධයෙන් එසේ කිරීමට ඉල්ලුම් කළ අවස්ථාවක, යම් පොලිස් නිලධරයකු හා රජයේ වෙන යම් නිලධරයකු ඒ තැනැත්තාට ආධාර හා සහාය දිය යුතුය.

(10) මේ නියෝගයෙහි කාර්‍යයන් සඳහා " නියම බලධරයා " යන්නෙන්—

(අ) මගීන්ගේ ගමනාගමන සේවය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය (අමතර කොටස් ඇතුළුව) වාහන බලයෙන් ගැනීම හා මහජන ආරක්ෂාව, මහජන සාමය රැක ගැනීම හෝ ජනතාවගේ ජීවිතයට අවශ්‍ය සැපයීම් හා සේවාවන් පවත්වාගෙන යාමට අවශ්‍ය යාත්‍රා බලයෙන් ගැනීම සම්බන්ධයෙන් අගමැති විසින් නමින් හෝ නිලයෙන් එසේ පත් කරනු ලැබූ තැනැත්තෙක් හෝ එක් එක් තැනැත්තෙකු අදහස් වේ ;

(ආ) ආහාර ද්‍රව්‍ය ගෙනයාම සඳහා අවශ්‍ය (අමතර කොටස් ඇතුළුව) වාහන බලයෙන් ගැනීම සම්බන්ධයෙන් අගමැති විසින් නමින් හෝ නිලයෙන් එසේ පත් කරනු ලැබූ තැනැත්තකු හෝ එක් එක් තැනැත්තෙක් අදහස් වේ ;

(ඇ) සෞඛ්‍ය හා වෛද්‍ය කටයුතු සැලැස්වීම සඳහා අවශ්‍ය (වාහන ඇතුළුව) භාණ්ඩ බලයෙන් ගැනීම සම්බන්ධයෙන් අගමැති විසින් නමින් හෝ නිලයෙන් එසේ පත් කරනු ලැබූ තැනැත්තෙක් හෝ එක් එක් තැනැත්තෙක් අදහස් වේ ;

(ඈ) මහජන සාමය රැක ගැනීම සඳහා අවශ්‍ය වාහන බලයෙන් ගැනීම සම්බන්ධයෙන් යුද්ධ හමුදාධිපති, නාවික හමුදාධිපති, ගුවන් හමුදාධිපති හෝ පොලිස්පති අදහස් වේ ;

(ඉ) කෘෂිකර්ම කටයුතු සඳහා අවශ්‍ය භාණ්ඩ බලයෙන් ගැනීම සම්බන්ධයෙන් අගමැති විසින් නමින් හෝ නිලයෙන් එසේ පත් කරනු ලැබූ තැනැත්තෙක් හෝ එක් එක් තැනැත්තෙක් අදහස් වේ ; තවද

(ඊ) වෙන යම් භාණ්ඩයක් බලයෙන් ගැනීම සම්බන්ධයෙන් අගමැති විසින් නමින් හෝ නිලයෙන් එසේ පත් කරනු ලැබූ තැනැත්තෙක් හෝ එක් එක් තැනැත්තෙක් අදහස් වේ.

(11) මේ නියෝගයෙහි කාර්යය සඳහා "භාණ්ඩ" යන පාඨයට ඛනිජ තෙල්වල නිෂ්පාදනයක් හෝ අතුරු නිෂ්පාදනයක් ඇතුළු වේ.

වාහන බලයෙන් ගැනීම.

9. (1) මහජන ආරක්ෂාව සඳහාත්, මහජන සාමය පවත්වා ගැනීම සඳහාත්, ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය සැපයීම් හා සේවා පවත්වා ගෙන යාම සඳහාත්, ශ්‍රී ලංකාවෙහි යම් වාහනයක් බලයෙන් ගැනීම අවශ්‍ය යයි හෝ යෝග්‍ය යයි නියම බලධරයකුට අදහස් වුවහොත්, එබඳු වාහනයක් ඒ බලධරයාට බලයෙන් ගත හැකිය. ඒ බලයෙන් ගැනීම සම්බන්ධයෙන් අවශ්‍යයයි හෝ යෝග්‍යයයි නියම බලධරයාට හැඟෙන, නියමයන් ඔහු විසින් කළ හැකිය.

(2) මේ නියෝගයෙහි (1) වෙනි ඡෙදය යටතේ යම් වාහනයක්, නියම බලධරයා විසින් බලයෙන් ගනු ලැබූ විට, මහජන ආරක්ෂාව සඳහාත්, මහජන සාමය පවත්වා ගැනීම සඳහාත්, ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය සැපයීම් හා සේවා පවත්වා ගෙන යාම සඳහාත් යෝග්‍ය යයි, නියම බලධරයාට හැඟෙන කාර්යවලට හා ආකාරයට ඒ වාහනය ඔහු විසින් පාවිච්චි කළ හැකිය. නැතහොත් යෙදිය හැකිය. එසේ ම ඒ කාර්යවලට හා ආකාරයට පාවිච්චි කරන ලෙස හෝ යොදන ලෙස බලය දිය හැකිය.

(3) මේ නියෝගයේ (1) වෙනි ඡෙදයෙන් පවරනු ලැබූ බලතල ප්‍රබල ලෙස පාවිච්චි කිරීම සඳහා එසේ කිරීම අවශ්‍ය යයි නියම බලධරයාට අදහස් වුවහොත්, මුළු ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් හෝ එහි නියමිත ප්‍රදේශයක් සම්බන්ධයෙන් හෝ කරනු ලැබූ ආඥාවකින්, ඒ ආඥාව ක්‍රියාත්මක වන අවස්ථාවෙහි, ආඥාවට සම්බන්ධ වූ ප්‍රදේශයක, යම් භූමියක, ආඥාවෙහි විස්තර කරනු ලබන අන්දමේ වාහනයක් තම ස්වාමිත්වයෙහි හෝ තම පාලනයෙහි ඇති කිසිම තැනැත්තකු විසින් ආඥාවෙහි නියමිත තැනැත්තා හෝ බලධරයා විසින් ඒ වාහනය ඉවත් කිරීමට අවසර දෙන තෙක්, ඒ භූමියෙන් ඉවත් නොකරන ලෙස හෝ ඉවත් නොකරවන ලෙස හෝ එබන්දකට ඉඩ නොහරින ලෙස, නියම කළ හැකිය.

(4) මේ නියෝගයෙහි පෙරාතුව වූ විධිවිධානවලින් යම් තැනැත්තකු වෙත පවරනු ලැබූ බලතල පාවිච්චි කරනු ලැබීමෙහිදී, ඔහු විසින් ඉල්ලා සිටිය හොත්, පොලිස් නිලධරයකු හෝ රජයේ වෙනත් නිලධරයකු ඔහුට ඒ සඳහා ආධාර හා සහාය දිය යුතුය.

(5) මේ නියෝගයේ කාර්ය සඳහා, "නියම බලධරයා" යන්නෙන්, යුද්ධ හමුදාධිපති, නාවික හමුදාධිපති, ගුවන් හමුදාධිපති, පොලිස්පති හෝ සෑම පාලන දිස්ත්‍රික්කයකම දිසාපති අදහස්වේ.

පුද්ගලික සේවාවන් බලයෙන් ගැනීම.

10. මහජන ආරක්ෂාව පවත්වාගෙන යාම හෝ අත්‍යවශ්‍ය සේවා පවත්වාගෙන යාම සඳහා ආධාර වශයෙන් හෝ ඒ සම්බන්ධයෙන් යම් වැඩක් කිරීමට හෝ පුද්ගලික සේවයක් කිරීමට ස්වකීය අත්සන යටතේ ආඥාවකින් යම් තැනැත්තකුට නියම කිරීම හෝ ඒ ආකාරයෙන් නියම කිරීමට ඒ වෙනුවෙන් නියමිත බලධරයන් හෝ නිලධරයන් එක්කෙනෙකුට හෝ ඊට වැඩි දෙනෙකුට බලය පැවරීම අගමැති විසින් කළ හැකිය.

### 3 වන කොටස—රැස්වීම්, පෙරහැරවල්, ප්‍රකාශන, තුවක්කු හා ඇතුළුවීමේ අයිතිවාසිකම් යනාදිය පාලනය කිරීම

සීමා කරනු ලැබූ ස්ථාන.

11. (1) අත්‍යවශ්‍ය සේවාවන් පවත්වා ගෙන යෑම සඳහා සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් අත්කර ගනු ලබන හෝ පාවිච්චි කරනු ලබන යම් ප්‍රදේශයකට, ස්ථානයකට හෝ භූමියකට බලය නො ලත් තැනැත්තන් ඇතුළුවීම වැළැක්වීම සඳහා විශේෂ ආරක්ෂා මාර්ග යෙදිය යුතුය යනු නියම බලධරයෙකුගේ මතය වුවහොත්, ආඥාවේ නියම කරනු ලැබිය හැකි අන්දමේ බලධරයාගේ හෝ තැනැත්තාගේ අවසරය නොමැතිව ඒ ප්‍රදේශයට හෝ ස්ථානයට හෝ ඒ භූමියට ආඥාවෙහි නියම කරනු ලැබිය හැකි අන්දමේ නිදහස් කිරීම්වලට යටත්ව හැර, කිසිම තැනැත්තකු ඇතුළු නො විය යුතුයයි හෝ එහි රැඳී නොසිටිය යුතුයයි ඒ නියම බලධරයා විසින් ආඥාවකින් විධිවිධාන සැලැස්විය හැකිය.

(2) මේ නියෝගය යටතේ පනවනු ලැබූ යම් ආඥාවක් කඩකිරීම් වශයෙන් යම් තැනැත්තකු යම් ප්‍රදේශයක, ස්ථානයක හෝ භූමියක සිටියහොත්, ඔහුට විරුද්ධව පවත්වනු ලැබිය හැකි අන් කිසි නීති කෘත්‍යයකට හානි නොවන පරිදි, යම් පොලිස් නිලධාරියකු විසින් හෝ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ යම් සාමාජිකයකු විසින් හෝ ඒ සඳහා නියම බලධරයකු විසින් බලය පවරනු ලැබූ අන් කිසි තැනැත්තකු විසින් ඔහු එතැනින් ඉවත් කළ හැකිය.

(3) මේ නියෝගයෙහි, "නියම බලධරයා" යන්නෙන්, යම් අත්‍යවශ්‍ය සේවයක් සම්බන්ධව, ඒ සේවයෙහි කාර්යය සඳහා අගමැති විසින්, නමින් හෝ නිලයෙන්, නියම බලධරයකු වශයෙන් පත් කරනු ලැබූ යම් තැනැත්තෙක් අදහස් වේ.

පෙරහැරවල් හා රැස්වීම තහනම් කිරීම.

12. (1) ආඥාවෙන් හෝ මේ නියෝගය යටතේ අනතුරුව පනවනු ලබන යම් ආඥාවකින් කරනු ලබන යම් නිදහස් කිරීම්වලට යටත්ව, ආඥාවේ නියම කරනු ලබන එබඳු කාල සීමාවකට ශ්‍රී ලංකාවෙහි නියමිත යම් ප්‍රදේශයක ප්‍රසිද්ධ පෙරහැරවල්, මහජන රැස්වීම් හෝ ඒ ආඥාවෙහි සඳහන් කරනු ලැබිය හැකි ප්‍රසිද්ධ පෙරහැරවල් හෝ රැස්වීම් පැවැත්වීම ආඥාවක් මගින් අගමැති විසින් තහනම් කළ හැකිය.

(2) අගමැතිගේ අදහස අනුව, මහාජන සාමයට බාධාවක් හෝ බලවත් කළකිරීමක් ඇති කළ හැකි යම් පෙරහැරක් හෝ රැස්වීමක් ශ්‍රී ලංකාවෙහි යම් ප්‍රදේශයක පැවැත්වීම තහනම් කරන නියමයන් අගමැති විසින් කළ හැකිය.

(3) මේ නියෝගය යටතේ කරනු ලැබූ යම් ආඥාවක් හෝ දෙනු ලැබූ යම් නියමයන් ඉෂ්ට කරවීම සඳහා යුක්ති සහගතව අවශ්‍ය විය හැකි පරිදි කටයුතු කිරීම එසේ හෝ බලය පාවිච්චි කිරීම යම් පොලිස් නිලධරයකු විසින් කළ හැකිය.

ඇඳිරි නීතිය.

13. (1) ආඥාවෙන් හෝ මේ නියෝගය යටතේ අනතුරුව පනවනු ලබන ආඥාවකින් කළ හැකි එබඳු නිදහස් කිරීම්වලට යටත්ව, එම ආඥාවේ නියමිත පැය ගණන අතර හෝ කාල සීමාව ඇතුළත ශ්‍රී ලංකාවේ යම් ප්‍රදේශයක කිසියම් තැනැත්තකු, ආඥාවේම නියමිත එබඳු තැනැත්තකු විසින් දෙනු ලැබූ ලිඛිත අවසර පත්‍රයක බලය යටතේ මිස, ප්‍රසිද්ධ මාර්ගයක, දුම්රිය මාර්ගයක, ප්‍රසිද්ධ උද්‍යානයක, මහජන විනෝද ක්‍රීඩා සමාජ භූමියක, වෙනත් ප්‍රසිද්ධ භූමියක, මුහුදු වෙරළෙහි හෝ ආඥාවෙහි නියමිත අන්කිසි ගොඩනැගිල්ලක, භූමියක හෝ ස්ථානයක නොසිටිය යුතුයයි අගමැති විසින් ඒ ප්‍රදේශය සම්බන්ධයෙන් ආඥාවක් මගින් නියම කළ හැකිය.

(2) මේ නියෝගයේ (1) වෙනි ඡේදයේ " ප්‍රසිද්ධ මාර්ගය " යන්නට ප්‍රසිද්ධ මාර්ගයට අයිතිවන හෝ සම්බන්ධවන ප්‍රසිද්ධ පාලමකට උඩින් වූ පාරක්, යම් පදික වේදිකාවක්, කානුවක්, කණ්ඩියක් හෝ අගලක් ඇතුළත් වේ.

ප්‍රකාශන පාලනය කිරීම.

14. (1) මහාජන ආරක්ෂාවට හෝ මහාජන සාමය රැකීමට හෝ ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය වූ සැපයීම් හා සේවාවන් පවත්වාගෙන යාමට හානිකර වන හෝ හානිකර විය හැකි කරුණු හෝ හමුදා කැරැල්ලට, කැරලි කෝලාහලයට, හෝ මහාජන කැළඹීමට තැනැත්තන් පොළඹවන හෝ උනන්දු කරවන කරුණු ශ්‍රී ලංකාවෙහි හෝ ශ්‍රී ලංකාවෙහි යම් නියමිත ප්‍රදේශයක ප්‍රසිද්ධ කිරීම හෝ ශ්‍රී ලංකාවේ සිට ශ්‍රී ලංකාවෙන් බැහැර ස්ථානවලට යැවීම වැලැක්වීම සඳහා හෝ සීමා කිරීම සඳහා අවශ්‍යයයි තමාට අදහස් විය හැකි අන්දමේ විධි විධාන යෙදීම හා නියමයන් කිරීම නියම බලධරයකු විසින් කළ හැකිය. තවද, ලේඛන, චිත්‍ර නිරූපණ, ඡායාරූප හෝ සිනමා චිත්‍රපටි, ප්‍රසිද්ධ කරනු ලැබීමට පෙර, නියම බලධරයා වෙත ඉදිරිපත් කළ යුතුය ; නැතහොත් ප්‍රදර්ශනය කළ යුතුය යන්න ඇතුළත්ව අවශ්‍ය ලෙස හෝ අවස්ථානුකූල ලෙස නියම බලධරයාට වැටහෙන අන්දමේ ආනුෂංගික හෝ අතිරේක විධිවිධාන මේ ඡේදය යටතේ වූ නියමයන්ට ඇතුළත්විය හැකිය.

(2) (අ) මේ නියෝගයේ (1) වෙනි ඡේදය යටතේ යම් නියමයන්හි විධිවිධානයක් කඩ කරන සෑම තැනැත්තකුම වරදකට, වරදකරු විය යුතුය ; තවද පුවත් පතක් පළකිරීමේ හේතුවෙන් යම් තැනැත්තකු එබඳු වරදකට වරදකරු වුවහොත්, ආඥාවෙහි, නියම කරනු ලබන ප්‍රමාණයේ කාල සීමාවක් තුළ, ඒ තැනැත්තා විසින් ශ්‍රී ලංකාවෙහි කිසිම පුවත්පතක් පළ නොකළ යුතුයයි අගමැති විසින් ආඥාවකින් නියම කළ හැකිය.

(ආ) (අ) අනුඡේදයෙහි විධිවිධානවලට හානියක් නොවන පරිදි, මෙම නියෝගයෙහි (1) වැනි ඡේදය යටතේ කර ඇති යම් විධානයක විධිවිධාන කඩකිරීමක් සිදුවී ඇත්තාවූත් එම කඩ කිරීම යම් පුවත්පතක යම් පළකිරීමක් සම්බන්ධයෙන් වූත් අවස්ථාවක, තමා සාධාරණ යයි සලකන ආකාරයට එක් වරක් හෝ ඊට වැඩි වාර ගණනක් අවවාද කිරීමෙන් පසුව නියම බලධරයා විසින් පහත සඳහන් පරිදි ආඥා කළ හැකිය :—

(i) ආඥාවෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි කාලසීමාවක් එම පුවත්පත කිසිම තැනැත්තකු විසින් මුද්‍රණය කිරීම, පළ කිරීම හෝ බෙද හැරීම නොකළ යුතු බව හෝ මුද්‍රණය කිරීමට, පළ කිරීමට හෝ බෙද හැරීමට කිසිම ආකාරයකින් සම්බන්ධ නොවිය යුතු බව ; හෝ

(ii) එම පුවත්පත පළ කරනු ලැබූ මුද්‍රණාලය, ආඥාවෙහි නිශ්චිතව සඳහන් කර ඇති කාලසීමාවක කිසිම කාර්යයක් සඳහා හෝ ආඥාවෙහි නිශ්චිතව සඳහන් යම් කාර්යයන් සඳහා පාවිච්චි නොකළ යුතු බව. තවද ආඥාවට අනුව ක්‍රියා කිරීම සුරක්ෂිත කිරීම සඳහා අවශ්‍ය බව එසේ බලය පවරනු ලැබූ යම් තැනැත්තන්ට පෙනී යන (පනවනු ලැබූ ආඥාව අදාළ වන මුද්‍රණාලය හෝ එය පිහිටි ස්ථානය හෝ එම මුද්‍රණාලයෙහි හෝ ස්ථානයෙහි කොටසක් හෝ සතු කරගැනීම ඇතුළුව) පියවරවල් ගැනීමට ඒ ආඥාවෙන් ඔවුන් වෙත බලය පැවරිය හැකිය.

(3) ස්වකීය මතය පරිදි, මහාජන ආරක්ෂාවට හෝ මහාජන සාමය රැකීමට හෝ ජනතාවගේ ජීවිතයම අත්‍යවශ්‍ය වූ සැපයීම් හා සේවාවන් පවත්වාගෙන යාමට හානිකර වන සේ අදහස් කරනු ලැබූ කරුණු හෝ හමුදා කැරැල්ලකට, කැරලි කෝලාහලයකට හෝ මහාජන කැළඹීමකට තැනැත්තන් පොළඹවන හෝ අනුබල දෙන කරුණු යම් පුවත්පතක පළ කරනු ලැබේ යයි හෝ පළ කරනු ලැබුවේ යයි හෝ පළ කරනු ලැබිය හැකි යයි නියම බලධරයකුගේ අදහස වුවහොත්, ඔහු විසින්—

(අ) කරනු ලබන නියමයක් මගින් එම නියමයෙහි සඳහන් කාලසීමාව තුළ කිසිම තැනැත්තකු විසින් එම පුවත්පත මුද්‍රණය කිරීම, පළ කිරීම හෝ බෙද හැරීම හෝ එය මුද්‍රණය කිරීමට, පළ කිරීමට හෝ බෙද හැරීමට කිසියම් ආකාරයකින් සම්බන්ධවීම නොකළ යුතු බවට ද, එම පුවත්පත මුද්‍රණය කළ මුද්‍රණාලය එම නියමයෙහි සඳහන් කර ඇති කාලසීමාව තුළ කවර වූ හෝ කාර්යයක් සඳහා හෝ එම නියමයෙහි සඳහන් යම් කාර්යයක් සඳහා හෝ පාවිච්චි නොකළ යුතු බවට ද විධාන කළ හැකි අතර එම නියමයෙහි සඳහන් යම් තැනැත්තකුට බලය දීමෙන් (නියමය කරනු ලැබුවේ යම් මුද්‍රණාලයක් සම්බන්ධයෙන් ද ඒ මුද්‍රණාලය හෝ එය අඩංගු වන යම් භූමියක හෝ ඒ මුද්‍රණාලයේ හෝ ඒ භූමියේ යම් කොටසක සන්තකය භාර ගැනීම ඇතුළුව) එම නියමයට අනුකූලත්වය ලබා ගැනීම සඳහා එසේ බලය දෙනු ලැබූ තැනැත්තාට අවශ්‍ය යයි පෙනී යන පියවර ගැනීමට බලය දෙනු ලැබිය හැකිය.

(ආ) එම පුවත්පත සම්බන්ධයෙන් මේ නියෝගයේ (1) වන සහ (2) වන ඡේදවල විධිවිධාන සලසා ඇති ආකාරයට පියවර ගැනීම හෝ විධාන කිරීම හෝ නියමයක් කිරීම හෝ කළ හැකිය.

(4) නියමයෙහි නමින් සඳහන් යම් පුවත්පතක් සම්බන්ධයෙන් මේ නියෝගයේ 2(ආ) වන ඡේදයේ හෝ (3) වන ඡේදයේ විධිවිධාන යටතේ නියම බලධරයකු විසින් නියමයක් කරනු ලැබ ඇති අවස්ථාවක, එම නියමය, ඒ නාමය යටතේ පළ කරනු ලබන යම් පුවත්පතකට පමණක් නොව, වෙන යම් නමකින් යම් පුවත් පතක් පළ කරනු ලබන්නේ නම් එසේ පළ කරනු ලබන පුවත්පත යම් කිසි ආකාරයකින් නියමයෙහි සඳහන් පුවත්පත පවත්වාගෙන යාමෙහි ලා හෝ ඒ වෙනුවට ආදේශ කිරීමෙහිලා හෝ පළ කරතහොත් එම පුවත්පතට ද අදාළ වන්නේය.

(5) මේ නියෝගයේ (2) (ආ) වන ඡේදයේ හෝ (3) වන ඡේදයේ විධිවිධාන යටතේ නියමයක් කරනු ලැබුවේ යම් පුවත්පතක් සම්බන්ධයෙන් ද, ඒ පුවත්පත මුද්‍රණය කිරීම, පළ කිරීම හෝ බෙද හැරීම හෝ එය මුද්‍රණය කිරීමට, පළ කිරීමට හෝ බෙද හැරීමට කිසි යම් ආකාරයකින් සම්බන්ධවීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතුය.

(6) මේ නියෝග යටතේ ආඥාවක් කරනු ලැබීමෙන් පසු යම් අවස්ථාවකදී සුදුසු යයි අගමැති අදහස් කරන කොන්දේසිවලට යටත්ව, ආඥාව අත්හිට විය යුතුයයි අගමැති විසින් නියම කළ හැකි අතර ඒ නියමය අගමැති විසින් යම් අවස්ථාවකදී අවලංගු කළ හැකිය.

(7) මහාජන ආරක්ෂාවට හෝ මහාජන සාමය රැකීමට හෝ අත්‍යාවශ්‍ය සේවාවන් හා සැපයීම් පවත්වා ගෙන යාමට හානිකර යයි තම මතය පරිදි අදහස් කරනු ලැබූ කරුණු හෝ හමුදා කැරැල්ලට, කැරලි කෝලාහලයට හෝ මහාජන කැළඹීමට තැනැත්තන් පොළඹවන හෝ උනන්දු කරවන කරුණු අඩංගු යම් ලේඛනයක් නිපදවීම සඳහා, යම් මුද්‍රණාලයක් හෝ යම් තැනැත්තකුගේ පාලනය යටතේ වූ මුද්‍රණාලයක් පාවිච්චි කරනු ලැබූ බව හෝ පාවිච්චි කරනු ලැබිය හැකි බව නියම බලධරයකුගේ මතය වුවහොත්, අවස්ථානුකූලව මුද්‍රණාලය හෝ ඒ තැනැත්තාගේ පාලනය යටතේ පවත්නා මුද්‍රණාල සියල්ල හෝ ඉන් යමක් ආඥාව බල පවත්නාතෙක් කිනම් කාර්යයක් සඳහා හෝ ආඥාවෙහි නියමිත යම් කාර්යයක් සඳහා පාවිච්චි නොකළ යුතුයයි නියම බලධරයා විසින් ආඥාවකින් නියම කළ හැකිය. තවද (ආඥාව පනවනු ලැබුවේ යම් මුද්‍රණාලයක් සම්බන්ධයෙන් ද ඒ මුද්‍රණාලය හෝ එය අඩංගු වන යම් භූමියක හෝ ඒ මුද්‍රණාලයේ හෝ ඒ භූමියේ යම් කොටසක ස්වාමිත්වය භාර ගැනීම ඇතුළුව) ආඥාවට අනුකූලත්වය ලබා ගැනීම සඳහා අවශ්‍ය යයි එලෙස බලය දෙනු ලැබූ තැනැත්තන්හට වැටහෙන පරිදි ක්‍රියා කිරීමට ආඥාවෙන් නියමිත තැනැත්තන්හට එබඳු යම් ආඥාවක් මගින් බලය පැවරිය හැකිය.

(8) මේ නියෝගයේ (2) (ආ), (3) වෙනි හා (7) වෙනි ඡේදයන්හි කාර්යයන් සඳහා, අගමැති විසින් පත් කරනු ලැබූ තැනැත්තන්ගෙන් යුත් උපදේශක කාරක සභා එකක් හෝ වැඩි ගණනක් පිහිටුවනු ලැබිය යුතුය. එවිට මේ ඡේදවලින් යම් ඡේදයක් යටතේ පනවනු ලැබූ යම් ආඥාවක් සම්බන්ධයෙන් සෑහීමට පත් නොවූ යම් තැනැත්තකුට ඒ පිළිබඳව තම විරුද්ධතාවන් සුදුසු උපදේශක කාරක සභාව වෙත ඉදිරිපත් කළ හැකිය.

(9) මේ නියෝගයේ (2) (ආ) වෙනි ඡේදය, (3) වෙනි ඡේදය හෝ (7) වෙනි ඡේදය යටතේ ආඥාවක් පනවනු ලැබූ යම් අවස්ථාවක, ඒ ආඥාව සම්බන්ධයෙන් අගමැති වෙත ලියවිල්ලකින් කරුණු ඉදිරිපත් කළ හැකි බවත්, එසේ කරුණු ඉදිරිපත් කළත්, නොකළත් සුදුසු උපදේශක කාරක සභාව වෙත විරුද්ධතාවන් සැල කර සිටිය හැකි බවත්, ආඥාවට සම්බන්ධ වූ පුවත්පත් හිමියා හෝ මුද්‍රණාලයේ අයිතිකරු වෙත දැනුම් දෙනු ලැබීමට කටයුතු සැලැස්වීම නියම බලධරයාගේ යුතුකම විය යුතුය.

(10) ඉහත දැක්වුණු පරිදි යම් විරුද්ධතාවන් සලකා බැලීම සඳහා පවත්වනු ලබන උපදේශක කාරක සභාවක යම් රැස්වීමක මුලාසනය අගමැති විසින් නම් කරනු ලැබූ සභාපතිවරයකු විසින් දැරිය යුතු අතර ස්වකීය විරුද්ධතාවන් සනාථ කිරීම සඳහා පුද්ගලිකව කරුණු ඉදිරිපත් කිරීමේ අවස්ථාවක් විරුද්ධකරුට සලස්වා දීම සභාපතිගේ යුතුකම විය යුතුය.

(11) ඉහත දැක්වුණු පරිදි යම් විරුද්ධතාවන් පිළිබඳව උපදේශක කාරක සභාවක වාර්තා අගමැති වෙත ඉදිරිපත් කළ යුතුය. එය සලකා බැලීමෙන් පසුව, විරුද්ධතාවන්ට අදාළ ආඥාව අගමැති විසින් අවලංගු කළ හැකිය; නැතහොත් වෙනස් කළ හැකිය.

(12) මේ නියෝගයේ යම් විධිවිධානයක් හෝ මේ නියෝගයේ (6) වෙනි ඡේදය යටතේ කරනු ලැබූ යම් නියමයක් හා සම්බන්ධ වූ යම් කොන්දේසියක් කඩ කිරීම් වශයෙන් යම් පුවත්පතක් මුද්‍රණය කරනු ලබන, පළකරනු ලබන හෝ බෙදහරිනු ලබන අවස්ථාවක, ඒ පුවත්පතේ අයිතිකරු, කළමනාකරු, කර්තෘ හෝ ප්‍රකාශක, කොන්දේසිය කඩ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් නියමය අවලංගු කරනු ලැබුවද නොලැබුවද, වරදකට වෙන් වෙන් වශයෙන් වරදකරු විය යුතුය.

(13) මේ නියෝගයෙහි—

(අ) " සිනමා චිත්‍රපටි " යන්නට ශබ්ද පථයක් ද එබඳු චිත්‍රපටියක් ප්‍රදර්ශනය කිරීම සම්බන්ධයෙන් ශබ්ද ප්‍රජනනය කිරීමේ කාර්‍ය සඳහා ශබ්ද සටහන් කර ගනු ලබන අන්කිසි භාණ්ඩයක් ද ඇතුළත් වේ ;

(ආ) " ප්‍රකාශනය " යන්නෙන්, සිනමා චිත්‍රපටියක් සම්බන්ධව, මහාජනයාට චිත්‍රපටිය ප්‍රදර්ශනය කිරීම අදහස් වන අතර, ඉහත කී පරිදි, චිත්‍රපටිය ප්‍රදර්ශනය කිරීම සම්බන්ධව යම් ශබ්දවල යාන්ත්‍රික හෝ විද්‍යුත් ප්‍රජනන එයට ඇතුළත් වේ ;

(ඇ) " පුවත්පත " යන්නට යම් සංග්‍රහයක්, සඟරාවක්, පත්‍රිකාවක් හෝ වෙනත් ප්‍රකාශනයක් ඇතුළත් වේ ; තවද

(ඈ) " මුද්‍රණාලය " යන්නට මුද්‍රණය, ශිලා මුද්‍රණය, ඡායාරූප ශිල්පය, හෝ දෘශ්‍ය ආකාරයකින් වචන නිරූපණය කිරීමේ හෝ ප්‍රජනනය කිරීමේ වෙනත් පිළිවෙලක් සඳහා පාවිච්චි කළ හැකි යම් යන්ත්‍රයක්, උපකරණයක් හෝ යන්ත්‍ර පට්ටලයක් හෝ ඒ යන්ත්‍රයට, උපකරණවලට හෝ යන්ත්‍ර පට්ටලයට අයිති යම් අච්චු අකුරු හෝ වෙනත් ද්‍රව්‍යයක් ඇතුළත් වේ.

**තුවක්කු හා පුපුරන ද්‍රව්‍ය.**

15. (1) අගමැති විසින් ආඥාවකින් නියම කරනු ලැබූ ශ්‍රී ලංකාවෙහි යම් ප්‍රදේශයක මහාජන ආරක්ෂාව හා මහාජන සාමය රැක ගැනීමේ අදහසින් පොලිස්පති විසින් යම් තැනැත්තකුගේ ස්වාමිත්වයෙහි තිබෙන යම් තුවක්කුවක් හෝ පුපුරන ද්‍රව්‍යයක් ඉවත් කිරීමට හා ඔහු විසින් නිශ්චය කරනු ලබන ස්ථානයක හා භාරයෙහි එය තැබීමට නියම කළ යුතුය.

(2) මේ නියෝගයෙහි (1) වෙනි ඡේදය යටතේ පොලිස්පති විසින් නිකුත් කරනු ලැබූ යම් නියමයක නමින් හෝ නිලයෙන් නියම කරනු ලැබූ යම් තැනැත්තකු විසින් ඒ නියමය ක්‍රියාවේ යෙදවිය හැකිය. ඒ නියමය ක්‍රියාවේ යෙදවීමේ කාර්‍ය්‍ය සඳහා වෙනයම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් ඒ තැනැත්තාට සහාය විය හැකි අතර, යම් භූමියකට හෝ ස්ථානයකට ඇතුළුවීම හා ඒ භූමියට හා ස්ථානයට ඇතුළුවීමේ කාර්‍ය්‍ය සඳහා යම් බාහිර හෝ අභ්‍යන්තර දොරක් හෝ ජනේලයක්, යම් තුවක්කුවක් හෝ පුපුරන ද්‍රව්‍යයක් තබනු ලැබූ ලෙස ඒ තැනැත්තා විසින් සැක කරනු ලබන යම් භාජනයක් හෝ ගබඩාවක් විවෘත කිරීම හෝ කඩා විවෘත කිරීම කළ හැකිය.

(3) මේ නියෝගයේ (1) වෙනි ඡේදය යටතේ පොලිස්පති විසින් නිකුත් කරනු ලැබූ නියමයක් අදාළ වන යම් තුවක්කුවක් හෝ පුපුරන ද්‍රව්‍යයක් සැඟවීම හෝ ඒ නියමය ක්‍රියාවේ යෙදවීම වැළැක්වීමේ හෝ බාධා කිරීමේ අදහසින් වෙන යම් ක්‍රියාවක් කිසිම තැනැත්තකු විසින් නොකළ යුතුය.

(4) මේ නියෝගය බල පවත්නා කාලය තුළ (1) වන ඡේදයෙහි සඳහන් කරනු ලැබූ ප්‍රදේශයක—

(අ) තුවක්කු ආඥාපනත යටතේ බලපත්‍ර නිකුත් කරන බලධරයා පුද්ගලිකව ම දිසාපතිවරයා විය යුතු අතර ඒ අනුව කිසිම අතිරේක දිසාපතිවරයකු, සහකාර දිසාපතිවරයකු හෝ වෙනත් යම් නිලධරයකු එකී ආඥාපනත යටතේ බලපත්‍ර නිකුත් කරන බලධරයා වශයෙන් වූ ආණ්ඩුවේ දිසාපතිවරයාගේ බලතල පාවිච්චි නොකළ යුතුය :

එසේ වුවද එකී ආඥාපනත යටතේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක් අලුත් කිරීම පිළිබඳ ස්වකීය බලතල, දිසාපතිවරයා විසින් අතිරේක දිසාපතිවරයා, සහකාර දිසාපතිවරයකු හෝ ප්‍රාදේශීය ආදායම් නිලධරයකු වෙත පවරනු ලැබිය හැකිය ; තවද

(ආ) කිසිම දිසාපතිවරයකු, අතිරේක දිසාපතිවරයකු, සහකාර දිසාපතිවරයකු හෝ අතිරේක සහකාර දිසාපතිවරයකු සහ පුපුරන ද්‍රව්‍ය පනතේ කාර්යයන් සඳහා බලපත්‍ර නිකුත් කිරීමට යම් දිසාපතිවරයකු විසින් එම පනතෙහි 6 වන වගන්තිය යටතේ ලියවිල්ලකින් බලය පවරනු ලැබූ කිසිම රාජ්‍ය නිලධරයකු, එකී පනතෙහි කාර්යයන් සඳහා බලපත්‍ර නිකුත් කරන බලධරයකු නොවිය යුතුය. ඒ පනතෙහි කාර්යයන් සඳහා බලපත්‍ර නිකුත් කරන බලධරයා ලේකම් විය යුතුය:

එසේ වුවද එකී පනත යටතේ බලපත්‍ර නිකුත් කරන බලධරයා වශයෙන් ලේකම් විසින් තම නියෝජිතයා ලෙස එකී පනතේ 6 වන වගන්තිය යටතේ යම් රාජ්‍ය නිලධරයකු පත්කිරීම මේ ඡේදයෙහි පෙරාතුව සඳහන් විධිවිධානවලින් වළක්වනු ලබන ලෙස නොසැලකිය යුතුය.

(5) තුවක්කු ආඥාපනත යටතෙහි ඒ වෙනුවෙන් බලපත්‍ර ලැබූ යම් වෙළෙන්දෙකු විසින් පිටරටින් ශ්‍රී ලංකාවට ගෙන්වනු ලැබූ හෝ විකිණීම සඳහා ශ්‍රී ලංකාවෙහි යම් තැනක ඉදිරිපත් කරනු ලැබූ හෝ තබනු ලැබූ යම් තුවක්කු තහනමට අල්ලා ගැනීම හා ලේකම් විසින් නිශ්චය කරනු ලබන යම් ස්ථානයකට ඒවා ඉවත් කිරීම හා යම් ස්ථානයක ඉවත් නොකර තබා ගැනීම ලේකම් විසින් අණ කළ හැකිය.

(6) මේ නියෝගයෙහි (5) වෙනි ඡේදය යටතෙහි ලේකම් විසින් නිකුත් කරනු ලැබූ ආඥාවක් අදාළවන යම් තුවක්කු සැඟවීම හෝ ඒ ආඥාව ඉෂ්ට කිරීම වැළැක්වීමේ අදහසින් වෙන යම් ක්‍රියාවක් කිසිම තැනැත්තකු විසින් නොකළ යුතුය.

(7) පුපුරන ද්‍රව්‍ය පනතක යටතෙහි ඒ වෙනුවෙන් බලපත්‍ර ලැබූ යම් තැනැත්තකු විසින් පිටරටින් ශ්‍රී ලංකාවට ගෙන්වනු ලැබූ හෝ ශ්‍රී ලංකාවෙහි නිෂ්පාදනය කරනු ලැබූ, විකිණීම සඳහා ඉදිරිපත් කරනු ලැබූ හෝ තබනු ලැබූ හෝ පුපුරන ද්‍රව්‍ය නිෂ්පාදකයකුගේ ව්‍යාපාරය ගෙනයාමට ඒ පනත යටතේ බලපත්‍ර ලැබූ යම් තැනැත්තකුගේ ස්වාමිත්වයෙහි වූ යම් පුපුරන ද්‍රව්‍යයක් තහනමට අල්ලා ගැනීම හා ලේකම් විසින් නිශ්චය කරනු ලබන යම් ස්ථානයකට ඒවා ඉවත් කිරීම හා යම් ස්ථානයක ඉවත් නොකර තබා ගැනීම ලේකම් විසින් අණ කළ හැකිය.

(8) මේ නියෝගයෙහි (7) වෙනි ඡේදය යටතෙහි ලේකම් විසින් නිකුත් කරනු ලැබූ ආඥාවක් අදාළ වන යම් පුපුරන ද්‍රව්‍ය සැඟවීම හෝ ඒ ආඥාව ඉෂ්ට කිරීම වැළැක්වීමේ අදහසින් වෙන යම් ක්‍රියාවක් කිසිම තැනැත්තකු විසින් නොකළ යුතුය.

(9) මේ නියෝගයෙහි (5) වෙනි ඡේදය හෝ (7) වෙනි ඡේදය යටතෙහි ලේකම් විසින් නිකුත් කරනු ලැබූ යම් ආඥාවක ඒ වෙනුවෙන් සඳහන් කරනු ලැබූ යම් තැනැත්තකු විසින් ඒ ආඥාව ඉෂ්ට කළ හැකි ය. ඒ ආඥාව ඉෂ්ට කිරීමේ කාර්යය සඳහා වෙන යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් ඒ තැනැත්තාට සහාය විය හැකි අතර, ඒ ආඥාවෙහි සඳහන් භූමියට හෝ ස්ථානයට ඇතුළු වී ඒ භූමියට හෝ ස්ථානයට ඇතුළුවීම සඳහා යම් බාහිර හෝ අභ්‍යන්තර දොරක් හෝ ජනේලයක් හෝ යම් තුවක්කු හෝ පුපුරන ද්‍රව්‍ය තබා ඇතැයි ඒ තැනැත්තා විසින් සැක කරනු ලබන භාජනයක් හෝ ගබඩාවක් විවෘත කිරීම හෝ කඩා විවෘත කිරීම කළ හැකිය.

(10) (අ) තුවක්කු ආඥාපනත යටතෙහි නිකුත් කරන ලද බලපත්‍රයක බලය යටතේ තුවක්කු වෙළෙන්දකු වූ, හෝ

(ආ) පුපුරන ද්‍රව්‍ය පනත යටතෙහි නිකුත් කරනු ලැබූ බලපත්‍රයක බලය යටතේ පුපුරන ද්‍රව්‍ය පිටරටින් ගෙන්වන්නකු, නිෂ්පාදනය කරන්නකු, විකුණන්නකු හෝ සපයන්නකු වූ, හෝ

(ඇ) පුපුරන ද්‍රව්‍ය පනත යටතෙහි ප්‍රදානය කරනු ලැබූ අවසර පත්‍රයක් දරන්නකු වූ

හැම තැනැත්තකුම ලේකම් විසින් සඳහන් කරනු ලැබූ කාලය ඇතුළත ලේකම්ට කලින් කලට අවශ්‍ය වන වාර වාර්තා ලේකම් වෙත සැපයිය යුතුය.

(11) මේ නියෝගය බලපවත්නා කාලය තුළ (1) වෙනි ඡේදයෙහි සඳහන් කරනු ලැබූ යම් ප්‍රදේශයක තුවක්කු ආඥාපනතෙහි 25 වෙනි වගන්තිය ද, පුපුරන ද්‍රව්‍ය පනතෙහි 10 වෙනි හා 22 වෙනි වගන්තිද බල නොපැවැත්විය යුතුය.

(12) මේ නියෝගයෙහි "ලේකම්" යන්නෙන් තුවක්කු ආඥාපනත සම්බන්ධයෙන් ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙහි ලේකම් අදහස් වන අතර පුපුරන ද්‍රව්‍ය පනත සම්බන්ධයෙන් ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයෙහි ලේකම් අදහස් වේ.

16.

## 4 වන කොටස—පරිපාලනය, සෝදිසි කිරීම, අත් අඩංගුවට ගැනීම හා රඳවා ගැනීම

සැක කරනු ලැබූ තැනැත්තන් පරිපාලනය කිරීම සහ සීමාපැනවීමේ ආඥා.

17. (1) (අ) මහාජන ආරක්ෂාවට හෝ මහාජන සාමය පවත්වාගෙන යාමට හෝ අත්‍යවශ්‍ය සේවාවන් පවත්වාගෙන යාමට හානි කරවන යම් ආකාරයකින් ක්‍රියා කිරීමෙන් ; හෝ

(ආ) මේ නියෝගවල 24 වෙනි නියෝගයේ හෝ 38 වෙනි නියෝගයෙහි (2) වෙනි ඡේදයේ (අ) අනුච්ඡේදයෙහි හෝ (ආ) අනුච්ඡේදයෙහි හෝ 68 වෙනි නියෝගයේ (3) වෙනි ඡේදයෙහි විධිවිධාන අතුරෙන් යමකට යම් ලෙසකින් පටහැනිව ක්‍රියා කිරීමෙන්,

යම් කිසි තැනැත්තකු වැළැක්වීමේ අදහසින් ඒ තැනැත්තා සම්බන්ධව පහත දක්වෙන සියලු කාර්‍ය හෝ ඉන් යමක් සඳහා ආඥාවක් පැනවීම අවශ්‍යයයි ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ මතය වන අවස්ථාවක, ඔහු විසින් එසේ ආඥාවක් පැනැවිය හැකිය :—

(i) ඒ ආඥාව මගින් හෝ ඒ ආඥාවෙහි නියමිත යම් බලධරයකු හෝ තැනැත්තන් විසින් ඒ තැනැත්තාට අවසර දෙනු ලැබිය හැකි යම් පමණකට හැර, එලෙස නියම කරනු ලැබිය හැකි ශ්‍රී ලංකාවේ යම් ප්‍රදේශයක ඒ තැනැත්තා නොසිටිය යුතු බවට වගබලා ගැනීම ;

(ii) ඒ ආඥාවෙහි නියම කරනු ලැබිය හැකි ආකාරයෙන්, වේලාවන්හිදී හා බලධරයකුට හෝ තැනැත්තකුට තමාගේ යාම් ඊම් දන්වන ලෙස ඒ තැනැත්තාට නියම කිරීම ;

(iii) ඒ ආඥාවෙහි නියම කරනු ලැබිය හැකි බලධරයාගේ හෝ තැනැත්තාගේ අවසරය නොමැතිව ස්වකීය නිවසින් ඒ තැනැත්තා පිටවීම තහනම් කිරීම සහ ඒ ආඥාවෙහි නියමිත හෝ ඒ ආඥාවෙන් නියම කරනු ලැබිය හැකි බලධරයා හෝ තැනැත්තා විසින් නිශ්චය කරනු ලැබිය හැකි අවස්ථාවලදී හැර අන් කිසි තැනැත්තකු ඒ නිවසට ඇතුළුවීම හෝ ඉන් පිටවීම තහනම් කිරීම ;

(iv) ගමන් බලපත්‍රයක් හෝ ශ්‍රී ලංකාවෙන් පිට ගමනක් යෑම සඳහා ගමන් ලියකියවිලි හෝ ප්‍රවේශ පත්‍ර ඒ තැනැත්තා සන්තකයෙහි තිබේ නම් අවස්ථාවෝචිත පරිදි එම ගමන් බලපත්‍රය හෝ ගමන් ලියකියවිලි හෝ ප්‍රවේශ පත්‍ර ඒ ආඥාවෙහි නිශ්චය කරනු ලැබිය හැකි බලධරයා හෝ තැනැත්තා වෙත ආපසු බාර දෙන ලෙස ඔහුට නියම කිරීම ;

(v) යම් නියමිත භාණ්ඩ ඒ තැනැත්තා විසින් සිය සන්තකයේ තබා ගැනීම හෝ ප්‍රයෝජනයට ගැනීම තහනම් කිරීම හෝ සීමා කිරීම ; සහ

(vi) ඒ තැනැත්තාගේ රක්ෂාව හෝ ව්‍යාපාරය පිළිබඳව ද, වෙනත් තැනැත්තන් සමග වූ ඔහුගේ ආශ්‍රය හෝ පණිවුඩ හුවමාරුව පිළිබඳව ද, ප්‍රවෘත්ති පැතිරවීම හෝ මත ප්‍රචාරය කිරීම සම්බන්ධයෙන් වූ ඔහුගේ කටයුතු පිළිබඳව ද, ඒ ආඥාවෙහි නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් ඔහු කෙරෙහි පැනවීම.

(2) මේ නියෝගයෙහි (1) වෙනි ඡේදයේ (i) වෙනි අනුච්ඡේදය යටතේ කරනු ලැබූ ආඥාවක් කඩ කරමින් යම් තැනැත්තකු යම් ප්‍රදේශයක සිටිතහොත් හෝ එබඳු ආඥාවක නියමයන් අනුව යම් ප්‍රදේශයකින් ඉවත්ව යාම පැහැර හරිතහොත්, ඔහුට විරුද්ධව පවත්වනු ලැබිය හැකි යම් නීතිකෘත්‍යයකට හානියක් නොවන පරිදි, යම් පොලිස් නිලධරයකු විසින් හෝ ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් ඒ සඳහා බලය පවරනු ලැබූ අන් කිසි තැනැත්තකු විසින්, ඔහු ඒ ප්‍රදේශයෙන් ඉවත් කළ හැකිය.

තැනැත්තන් රඳවා ගැනීම.

18. (1) (අ) මහාජන ආරක්ෂාවට හෝ මහාජන සාමය පැවැත්වීමට හෝ අත්‍යවශ්‍ය සේවාවන් පවත්වාගෙන යාමට හෝ හානි පමුණුවන යම් ආකාරයකින් ක්‍රියා කිරීමෙන්; හෝ

(ආ) මේ නියෝගවල 38 වෙනි නියෝගයෙහි (2) වෙනි ඡේදයෙහි (අ) අනුච්ඡේදයෙහි හෝ (ආ) අනු ඡේදයෙහි හෝ 24 වෙනි නියෝගයෙහි විධිවිධාන අතුරෙන් යමකට යම් ලෙසකින් පටහැනිව ක්‍රියා කිරීමෙන් ;

යම් තැනැත්තකු වැළැක්වීමේ අදහසින්, ඒ තැනැත්තා සම්බන්ධව එලෙස ක්‍රියා කිරීම අවශ්‍ය යැයි, ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ මතය වන අවස්ථාවක, ඒ තැනැත්තා සිරභාරයට ගෙන සිරභාරයෙහි රඳවා ගැනීමට නියම කරන ආඥාවක් ඔහු විසින් කළ හැකිය.

(2) මේ නියෝගයෙහි (1) වෙනි ඡේදය යටතෙහි කරනු ලැබූ යම් ආඥාවක් ක්‍රියාත්මක කිරීමට හා ඒ සඳහා අවශ්‍ය විය හැකි සියලු බලය පාවිච්චි කිරීමට යම් පොලිස් නිලධරයකුට හෝ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයකුට බලය තිබිය යුතුය.

(3) මේ නියෝගයෙහි (1) වෙනි ඡේදය යටතේ කරනු ලැබූ ආඥාවක ප්‍රකාර රඳවා තබනු ලැබූ යම් තැනැත්තකු නීත්‍යානුකූල සිරභාරයෙහි රඳවා තැබූ ලෙස සැලකිය යුතුය. එසේම පොලිස්පති විසින් බලය දෙනු ලැබූ ස්ථානයක ඔහු විසින් නිකුත් කරනු ලැබූ උපදෙස් ප්‍රකාර ඔහු රඳවා තැබිය යුතුය. තවද බන්ධනාගාර ආඥාපනත යටතේ පිහිටුවනු ලැබූ බන්ධනාගාරයක ඒ තැනැත්තා එසේ රඳවා තබනු ලැබූ විටක—

54 අයි.

(අ) ඒ ආඥාපනතෙහි ix වෙනි කොටස හැර, ඒ ආඥාපනතෙහි සියලු විධිවිධානයන්ද ;

(ආ) සිරකරුවන් බැලීමට ඒම හා ඔවුන්ගේ ලිපි ගනුදෙනු සම්බන්ධයෙන් වූ ව්‍යවස්ථා හැර ඒ ආඥාපනත යටතේ පනවනු ලැබූ සියලු ව්‍යවස්ථාවන්ද ;

ඒ ආඥාපනතෙහි අර්ථය ඇතුළත, ඒ තැනැත්තා සිවිල් සිරකරුවකු ලෙස සැලකීමෙන්, ඒ තැනැත්තා කෙරෙහි අදාළ විය යුතුය :

එසේ වුවද ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් ඔහුට යෝග්‍ය යයි හැඟෙන අවස්ථාවක—

(අ) ඒ ආඥාපනතෙහි යම් විධිවිධාන හෝ මේ ඡේදයේ පෙරාතුවම වූ විධිවිධාන යටතේ ඒ තැනැත්තාට අදාළ විය යුතුය. ඒ ආඥාපනත යටතේ පනවනු ලැබූ යම් ව්‍යවස්ථා ඒ තැනැත්තා කෙරෙහි අදාළ නොවිය යුතුයයි හෝ ආඥාවෙහි නියම කළ හැකි සංශෝධනයන්ට හෝ වෙනස් කිරීම්වලට යටත්ව අදාළ විය යුතුයයි ආඥාවකින් නියම කළ හැකිය. එසේම

(ආ) ඒ ලේකම් විසින් කලින් කල නියම කරනු ලබන ආකාරයකට, වේලාවක හා ස්ථානයකදී ඒ තැනැත්තා බැලීමට ඒමට සහ ඔහුගේ ලිපි ගනුදෙනුවලට අවසර දිය හැකිය.

(4) මේ නියෝගයෙහි කාර්යය සඳහා ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබූ තැනැත්තන්ගෙන් සමන්විත උපදේශක කාරක සභාවල් එකක් හෝ වැඩි ගණනක් පිහිටුවනු ලැබිය යුතුය. මේ නියෝගය යටතෙහි තමන්ට විරුද්ධව කරනු ලැබූ ආඥාවකින් පීඩා ලැබූ යම් තැනැත්තකු විසින් ඔහුගේ විරුද්ධතාවන් ඒ කාරක සභාවට ඉදිරිපත් කළ හැකිය.

(5) මේ නියෝගය යටතෙහි යම් තැනැත්තකුට විරුද්ධව ආඥාවක් කරනු ලැබුවේ ද ඒ සම්බන්ධයෙන් ලියවිල්ලකින් අගමැතිට කරුණු දැක්වීමට අවස්ථාවක් හැකි තාක් ඉක්මණින් ඒ තැනැත්තාට සලස්වාදීම ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ යුතුකම විය යුතු ය. එසේ කරුණු දැක්මක් කළත් නොකළත් ඉහත කී පරිදි උපදේශක කාරක සභාවකට ඔහුගේ විරුද්ධතාවන් දැක්වීම පිළිබඳ ඔහුගේ අයිතිය ඔහුට දැනුම් දිය යුතුය. ඒ විරුද්ධතාවන් විමසීම හා ඒ පිළිබඳව සුදුස්සක් කිරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් ව්‍යවස්ථා සෑදිය හැකිය.

(6) ඉහත කී පරිදි ඒ විරුද්ධතාවන් සලකා බැලීම සඳහා පවත්වනු ලබන උපදේශක කාරක සභාවක යම් රැස්වීමක මූලාසනය ජනාධිපතිවරයා විසින් නම් කරනු ලබන සභාපති විසින් දැරිය යුතුය. මේ නියෝගය යටතෙහි විරුද්ධකරුට විරුද්ධව ආඥාව කරනු ලැබූ හේතු ඔහුට දැන්වීම හා තම තත්ත්වය පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීමට ඔහුට හැකිවීම පිණිස සභාපතිගේ මතය අනුව සෑහෙන කරුණු ඔහුට සැපයීම සභාපතිගේ යුතුකම විය යුතුය.

(7) උපදේශක කාරක සභාවක් තුන් දෙනකුගෙන් සමන්විත වූ අවස්ථාවක, එහි යම් රැස්වීමක ගණපූරණය දෙදෙනෙකු විය යුතු අතර උපදේශක කාරක සභාවක් තුන් දෙනකුට වැඩි සංඛ්‍යාවකින් සමන්විත වූ අවස්ථාවක, ගණපූරණය තුන් දෙනකු විය යුතුය.

(8) ඉහත කී පරිදි යම් විරුද්ධතාවන් සම්බන්ධ උපදේශක කාරක සභාවක වාර්තාව ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත යැවිය යුතුය. එය සලකා බැලීමෙන් පසු විරුද්ධතාව අදාළ වන ආඥාව ඔහු විසින් අවලංගු කළ හැකිය.

(9) මේ නියෝගයෙහි (1) වෙනි ඡේදය යටතෙහි යම් තැනැත්තකු සම්බන්ධයෙන් ආඥාවක් කරනු ලැබුවේ ද ඒ තැනැත්තා මේ නියෝගවල 68 වෙනි නියෝගය යටතෙහි තහනම් කරනු ලැබූ සංවිධානයක සාමාජිකයකු හෝ සාමාජිකයකු වී සිටි බවට තමා සැක කරන බව ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් ලියවිල්ලකින් සහතික කරන අවස්ථාවක, ඒ තැනැත්තා සම්බන්ධයෙන් මේ නියෝගයෙහි (4), (5), (6), (7) හා (8) වෙනි ඡේදවල විධිවිධාන අදාළ නොවිය යුතුය.

(10) මේ නියෝගයෙහි (1) වෙනි ඡේදය යටතෙහි ආඥාවක් කිසිම හේතුවක් නිසා යම් අධිකරණයක ප්‍රශ්න නො කරනු ලැබිය යුතුය.

සෝදිසි කිරීමේ, තහනමට ගැනීමේ, සිරභාරයට ගැනීමේ හා රඳවා ගැනීමේ බලතල.

19. (1) යම් පොලිස් නිලධරයකු හෝ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ, ශ්‍රී ලංකා නාවුක හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයකු, බන්ධනාගාර කොමසාරිස් හෝ යම් බන්ධනාගාරයක අධිකාරිවරයකු, සහකාර අධිකාරිවරයකු, ආධුනික අධිකාරිවරයකු, ජේලර් කෙනෙකු, නියෝජ්‍ය ජේලර් කෙනෙකු හෝ යම් බන්ධනාගාර ආරක්ෂකයකු, බන්ධනාගාර ඕවර්සියර් කෙනෙකු හෝ මේ නියෝගය යටතේ ක්‍රියා කිරීමට අගමැති විසින් බලය දෙනු ලැබූ අන් කිසි තැනැත්තකු විසින් හදිසි නියෝගයක් යටතේ වරදක් කරන්නා වූ හෝ කරනු ලැබූ, නැතහොත් වරදක් හා සම්බන්ධ හෝ වරදක් කරන ලෙස හෝ කරනු ලැබූ ලෙස සැක කරනු ලැබීමට යුක්ති සහගත හේතු ඇත්තා වූ හෝ තැනැත්තකු සෝදිසි කළ හැකිය. එසේ සෝදිසි කිරීමේ කාර්යය සඳහා එකී තැනැත්තකු රඳවා ගත හැකිය. නැතහොත් වරෙන්තුවක් නොමැතිව එකී තැනැත්තකු සිරභාරයට ගත හැකිය. තවද වරද සිදු කිරීමෙහි දී හා ඒ සම්බන්ධයෙන් පාවිච්චි කරනු ලැබූ කුමන අන්දමේ හෝ යම් වාහනයක්, යාත්‍රාවක් භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ දෙයක් සෝදිසි කිරීම, තහනමට ගැනීම, ඉවත් කිරීම හා රඳවා ගැනීම කළ හැකිය.

(2) අගමැති විසින් යම් තැනැත්තකුට—

(අ) යම් භූමියකට, ස්ථානයකට, වාහනයකට හෝ යාත්‍රාවකට ඇතුළුවීමට ද, එය සෝදිසි කිරීමට ද,

(ආ) යම් තැනැත්තකු සෝදිසි කිරීමට ද ඒ සෝදිසි කිරීම සඳහා ඔහු රඳවා ගැනීමට ද,

සෝදිසි කිරීම කරනු ලබන තැනැත්තාගේ අදහස අනුව මහාජන ආරක්ෂාව සඳහා හෝ මහාජන සාමය පවත්වා ගෙන යාම සඳහා හෝ යම් හදිසි නියෝගයක කාර්යය සඳහා හෝ පරීක්ෂා කිරීම හෝ භාරයට ගැනීම අවශ්‍ය වන්නා වූ කුමන අන්දමේ හෝ යම් භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ දෙයක් තහනමට ගැනීමට හා එය ඉවත් කිරීමට ද ලිපියකින් බලය දිය හැකිය.

(3) සෝදිසි කරනු ලැබූ භූමියෙහි, ස්ථානයෙහි, වාහනයෙහි හෝ යාත්‍රාවෙහි සිටි අන් කිසි තැනැත්තකුගෙන් හෝ සෝදිසි කරනු ලැබූ තැනැත්තාගෙන් සෝදිසි කිරීමේ කාර්ය හා සම්බන්ධ හෝ එයට අදාළ වූ හෝ යම් කරුණක් සම්බන්ධයෙන් මේ නියෝගයේ (2) වෙනි ඡේදය යටතේ සෝදිසියක් පවත්වන තැනැත්තකු විසින් ප්‍රශ්න කළ හැකිය.

(4) මේ නියෝගයේ (3) වෙනි ඡේදය යටතේ ප්‍රශ්න කරනු ලැබූ හැම තැනැත්තකු විසින් ම ප්‍රශ්න කරනු ලැබූ කරුණ සම්බන්ධයෙන් තමා දන්නා යම් තොරතුරක් සැපයිය යුතුය.

(5) මේ නියෝගය යටතේ සෝදිසි කළ යුතු යම් භූමියක, ස්ථානයක, වාහනයක හෝ යාත්‍රාවක පදිංචිව සිටින නැතහොත් එබන්දක් භාරව සිටින තැනැත්තකු විසින්, සෝදිසිය පවත්වන තැනැත්තාගේ ඉල්ලීම අනුව එබන්දකට අවහිර නොමැති ලෙස ඔහුට ඇතුළුවීමට ඉඩ හැරීම හා එහි සෝදිසියක් කිරීම සඳහා සියලු යුක්ති සහගත පහසුකම් ඔහුට සැලසීම ද කළ යුතුය.

(6) මේ නියෝගය යටතේ සෝදිසියක් පවත්වන තැනැත්තා විසින් සෝදිසි කළ යුතු භූමියට, ස්ථානයට, වාහනයට හෝ ඒ යාත්‍රාවට ඇතුළුවීම සඳහා යම් බාහිර හෝ අභ්‍යන්තර දොරක් හෝ ජනේලයක් විවෘත කළ හැකිය. නැතහොත් කඩා විවෘත කළ හැකිය.

(7) ස්ත්‍රියක සෝදිසි කිරීමට අවශ්‍ය වූ අවස්ථාවක සෝදිසිය අන්කිසි ස්ත්‍රියක විසින් කළ යුතුය.

(8) (අ) මේ නියෝගය යටතේ සිරභාරයට ගනු ලැබූ යම් තැනැත්තකු සිරභාරයට ගත් ස්ථානයේ සිට ශ්‍රී ලංකාවේ කවර තැනක වුවද පිහිටි අන් කිසි ස්ථානයක්ට ගෙන ගොස් සිරභාරයෙහි රඳවා ගත හැකි ය.

(ආ) යමකු සිරභාරයට ගැනීම පිණිස මේ නියෝගයෙහි (1) වෙනි ඡේදයෙන් බලය පවරනු ලැබූ යම් තැනැත්තකුට මේ ඡේදයෙහි (අ) අනුච්ඡේදය මගින් පවරනු ලැබූ බලය ක්‍රියාවේ යෙදීමේ හා සන්නද්ධ බලය ඇතුළුව, මේ කාර්ය්‍ය සඳහා අවශ්‍ය විය හැකි අන්දමේ සෑම බලයක් ම පාවිච්චි කිරීමේ අයිතිය හිමි විය යුතුය.

54 අධි. (ඇ) මේ ඡේදයෙහි (අ) අනුච්ඡේදයේ විධිවිධාන අනුව රඳවා ගනු ලැබූ යම් තැනැත්තකු නීත්‍යනුකූල සිරභාරයෙහි සිටින ලෙස සැලකිය යුතු අතර පොලිස්පති විසින් බලය පවරනු ලබන අන්දමේ ස්ථානයක, ඔහු විසින් නිකුත් කරනු ලැබූ උපදෙස් අනුව, ඒ තැනැත්තා රඳවා ගත යුතුය. තවද ඒ ස්ථානය බන්ධනාගාර ආඥාපනත යටතේ පිහිටුවනු ලැබූ බන්ධනාගාරයක් වන අවස්ථාවක, ඒ තැනැත්තා භාර ගෙන ඔහු රඳවා ගැනීම ඒ බන්ධනාගාරය භාරව සිටින නිලධාරියාගේ යුතුකම විය යුතුය.

19 වෙනි නියෝගය යටතේ සිරභාරයට ගනු ලැබූ හා රඳවා ගනු ලැබූ තැනැත්තන් සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන.

20. (1) 19 වෙනි නියෝගය යටතේ සිරභාරයට ගනු ලැබූ තැනැත්තන් සම්බන්ධයෙන් ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරණ යුක්තිය පසිඳලීමේ පනතේ 85 (5) වන, 85 (6) වන සහ 91 (2) වන වගන්තිවල විධිවිධාන අදාළ නොවිය යුතුය.

(2) 19 වෙනි නියෝගයේ විධිවිධාන අනුව, පොලිස්පති විසින් බලය පවරනු ලැබූ ස්ථානයක රඳවා ගනු ලැබූ යම් තැනැත්තකු, ඒ නියෝගය යටතේ ඔහු අත්අඩංගුවට ගනු ලැබූ දින සිට ගණන් බලන ලද දින පහළොවකට නොවැඩි කාලසීමාවක් තුළ එසේ රඳවා ගනු ලැබිය හැකි අතර, ඒ කාලසීමාව අවසානයේදී ඒ ස්ථානය භාරව සිටින නිලධාරියා විසින් ඒ තැනැත්තා ඒ කාලසීමාව අවසන් වීමට පෙර නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් ඉදිරියට පමුණුවනු ලැබුවේ නම් මිස, ඒ නිලධාරියා විසින් ඔහු නිදහස් කළ යුතුය.

(3) 19 වෙනි නියෝගයේ විධිවිධාන අනුව සිරභාරයට ගනු ලැබ රඳවා ගනු ලැබූ තැනැත්තකු (2)

20 අධි. ඡේදයෙහි සඳහන් නිලධාරයා විසින් නිසි අධිකරණ බලය ඇති අධිකරණයකට ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, ඒ අධිකරණය විසින් බන්ධනාගාර ආඥාපනත යටතේ පිහිටුවනු ලැබූ බන්ධනාගාරයක අධිකාරිගේ භාරයෙහි ඒ තැනැත්තා රඳවා තැබිය යුතු යයි අණ කළ යුතුය.

සිරභාරයේ සිටින තැනැත්තන්ට, සම්බන්ධ විශේෂ විධිවිධාන.

182 අධි.

183 අධි.

19 අධි.

20අ. (1) මහේස්ත්‍රාත්වරයකුගේ ආඥාවක් අනුව යම් බන්ධනාගාරයක සිරභාරයෙහි තබනු ලැබ සිටින්නාවූ ද පුපුරන ද්‍රව්‍ය පනත, 1966 අංක 18 දරන පීඩාකර ආයුධ පනත, තුවක්කු ආඥාපනත හෝ දණ්ඩනීති සංග්‍රහයේ VI වැනි පරිච්ඡේදය, හෝ VII වැනි පරිච්ඡේදය හෝ යම් හදිසි නියෝගයක් යටතේ වරදකට සැක කරනු ලැබ හෝ චෝදනා ලැබ සිටින්නාවූ ද යම් තැනැත්තකු, අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් පනවනු ලැබූ ආඥාවක් අනුව මුදා හරිනු ලබන තෙක් ඔහු ඒ සිරභාරයේ ම සිටිය යුතුය.

(2) මහේස්ත්‍රාත්වරයකු විසින් ඒ තැනැත්තා තමන් වෙත යම් දිනයක ඉදිරිපත් කළ යුතු බවට කරන ලද යම් ආඥාවක් වුව ද එය නොතකා (1) වැනි ඡේදයේ විධිවිධාන ක්‍රියාත්මක විය යුතුය.

(3) (1) වැනි ඡේදයේ විධිවිධාන යටතේ තැනැත්තන් සිරභාරයේ තබා ඇති බන්ධනාගාරයක් භාරව සිටින නිලධරයා විසින් ඒ බන්ධනාගාරය තුළ සිරභාරයේ තබා ඇති සියලුම තැනැත්තන්ගේ ලැයිස්තුවක් ඒ බන්ධනාගාරය පිහිටා තිබෙන ප්‍රදේශයේ අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් වෙත කලින් කල සැපයිය යුතුය.

(4) (3) වැනි ඡේදයේ සඳහන් තොරතුර තමන් වෙත ලැබුනු කල්හි මහේස්ත්‍රාත් විසින් දවස් දහහතරකට වැඩි නොවූ අතරවාරවලදී ඒ බන්ධනාගාරය වෙත ගොස් එහි සිරභාරයේ තබා ඇති යම් තැනැත්තකු විසින් සැලකර සිටිය හැකි යම් කරුණු සටහන් කර ගත යුතුය.

(5) (4) වැනි ඡේදය යටතේ සැල කරනු ලැබිය හැකි කරුණු කිසිවක් මහේස්ත්‍රාත් විසින් සටහන් කර ගෙන ඒ පිළිබඳව තමන් විසින් දක්විය හැකි අදහස් කිසිවක් ද සමග ඒ සටහන අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.

භාරවන තැනැත්තන් සිරභාරයේ තැබීම.

182 අධි.

183 අධි.

19 අධි.

20ආ. (1) පුපුරන ද්‍රව්‍ය පනත, 1966 අංක 18 දරන පීඩාකර ආයුධ පනත, තුවක්කු ආඥාපනත යටතේ හෝ දණ්ඩනීති සංග්‍රහයේ VI වැනි පරිච්ඡේදය හෝ VII වැනි පරිච්ඡේදය යටතේ හෝ යම් හදිසි නියෝගයක් යටතේ යම් වරදක් සම්බන්ධයෙන් යම් පොලිස් නිලධරයකුට හෝ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ යම් නිලධරයකුට හෝ යම් රාජ්‍ය නිලධරයකුට භාර වන තැනැත්තකු එසේ භාර වී දින හතක් ඇතුළත එකී නිළධරයා විසින් බන්ධනාගාර කොමසාරිස්වරයා යටතේ සිරභාරයේ තබා ගැනීමට ඔහුට භාරදිය යුතුය.

(2) (අ) (1) වැනි ඡේදය යටතේ බන්ධනාගාර කොමසාරිස්වරයා යටතේ සිරභාරයේ තබා ගැනීමට භාර දෙනු ලැබූ සෑම තැනැත්තෙකුම ; සහ

(ආ) මෙම නියෝගය ක්‍රියාත්මකවීමට පෙරාතුව (1) වැනි ඡේදයේ සඳහන් කරුණු අනුව යම් නිලධර යකුට භාර වී බන්ධනාගාර කොමසාරිස්වරයා යටතේ සිරභාරයේ සිටින සෑම තැනැත්තකුම

බන්ධනාගාර ආඥපනත යටතේ පනවන ලද රීතිවල කාර්යයන් සඳහා වරදකරු කරනු නොලැබූ සිරකරුවෙකු ලෙස සැලකිය යුතු අතර අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ නියෝගයක් අනුව එම තැනැත්තා නිදහස් කරනු ලබන තුරු බන්ධනාගාර කොමසාරිස්ගේ භාරයේ ඉදිරියටත් සිටිය යුතුය.

20ඇ. තත් කාලයෙහි යම් සිරකරුවකු භාරව යැමේ හෝ යම් බන්ධනාගාරයක් නොහොත් සිරකරුවන් රඳවා තබනු ලබන හෝ සේවයෙහි යොදනු ලබන වෙනත් ස්ථානයක් මුර කිරීමේ හෝ යම් සිරකරුවන් විසින් කරන ලද යම් කැලඹීමක් හෝ සාහසික කමක් මැඩීමෙහිලා සහාය වීමේ හෝ පැන ගිය යම් සිරකරුවකු නැවත අල්ලා ගැනීමේ හෝ යම් නීත්‍යානුකූල ආඥවක් ක්‍රියාවේ යෙදවීමේ නොහොත් යෙදවීමේ ලා සහාය වීමේ නිරත වූ ශ්‍රී ලංකා යුද හමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සෑම සාමාජිකයකු වෙත ම, බන්ධනාගාර ආඥපනතේ 77 (5) වැනි වගන්තිය මගින් හා ඒ ආඥපනත යටතේ පනවන ලද රීති මගින් පොලිස් නිලධරයෙකු වෙත පැවරී ඇති සියලුම බලතල හා අයිතිවාසිකම් පැවරී ඇති ලෙස සැලකිය යුතු ය.

බන්ධනාගාර හා සිරකරුවන් සම්බන්ධයෙන් වූ යම් නීත්‍යානුකූල ආඥ ක්‍රියාවේ යෙදවීමට සන්නද්ධ හමුදාවල සාමාජිකයන්ට ඇති අයිතිවාසිකම්.

## 5 වන කොටස—වරදවල් හා දණ්ඩන

21. (අ) නීතියෙන් පිහිටුවා ඇති ශ්‍රී ලංකාණ්ඩුව නීත්‍යානුකූල මාර්ගයකින් හැර අන් ලෙසකින් බිඳ හෙළීමට කුමන්ත්‍රණය කරන, හෝ තැත් කරන හෝ, බිඳ හෙළීමට සූදානම් වන, හෝ බිඳ හෙළීමට අදහස් කරනු ලැබූ හෝ බිඳ හෙළීමේ අරමුණ හෝ චේතනාව ඇතිව, හෝ බිඳ හෙළීමේ උපක්‍රමයක් වශයෙන් වූ යම් ක්‍රියාවක් කරන, හෝ

ආණ්ඩුව යනාදිය බිඳහෙළීමට කුමන්ත්‍රණය කිරීම.

(ආ) ජනාධිපතිවරයාගේ, ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරයකුගේ, පොලිස් හමුදාවේ සාමාජිකයකුගේ, සන්නද්ධ හමුදාවන්හි සාමාජිකයකුගේ හෝ රාජ්‍ය නිලධාරියකුගේ නීත්‍යානුකූල බලතල අතුරින් කිසිවක් යම් ලෙසකින් පාවිච්චි කිරීමට හෝ පාවිච්චි කිරීමෙන් වැළකීමට ජනාධිපතිවරයා, ඒ ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරයා, පොලිස් හමුදාවේ සාමාජිකයා හෝ සන්නද්ධ හමුදාවන්හි සාමාජිකයා හෝ රාජ්‍ය නිලධාරයා පෙළඹවීමේ හෝ ඔහුට බලකිරීමේ චේතනාව ඇතිව ජනාධිපතිවරයා, ඒ ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරයා, පොලිස් හමුදාවේ සාමාජිකයා, සන්නද්ධ හමුදාවන්හි සාමාජිකයා හෝ රාජ්‍ය නිලධරයා මැරීමට කුමන්ත්‍රණය කරන හෝ මැරීමට තැත් කරන හෝ අයුතු ලෙස සිරකරන හෝ අයුතු ලෙස සිරකිරීමට කුමන්ත්‍රණය කරන හෝ තැත් කරන හෝ සූදානම් වන, හෝ

(ඇ) ශ්‍රී ලංකාණ්ඩුවේ, ජනාධිපතිවරයාගේ, ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරයකුගේ පොලිස් හමුදාවේ සාමාජිකයකුගේ, සන්නද්ධ හමුදාවන්හි සාමාජිකයකුගේ හෝ රාජ්‍ය නිලධරයකුගේ නීත්‍යානුකූල බලතල යම් ලෙසකින් පාවිච්චි කිරීමට හෝ පාවිච්චි කිරීමෙන් වැළකී සිටීමට ශ්‍රී ලංකාණ්ඩුව, ජනාධිපතිවරයා, ඒ ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරයා, පොලිස් හමුදාවේ සාමාජිකයා සන්නද්ධ හමුදාවන්හි සාමාජිකයා හෝ රාජ්‍ය නිලධරයා පෙළඹවීමේ හෝ ඔහුට බලකිරීමේ චේතනාව ඇතිව යම් තැනැත්තකු යම් ආකාරයකින් බිය ගන්වන, ඔහු කෙරෙහි බලපවත්වන, හෝ ඔහුට බල කරන, හෝ ඔහු බිය ගැන්වීමට, ඔහු කෙරෙහි බල පැවැත්වීමට හෝ ඔහුට බල කිරීමට හෝ සූදානම් වන, කුමන්ත්‍රණය කරන හෝ තැත් කරන

කවරකු වුවද වරදකට වරදකරු විය යුතු අතර, අන් කිසි නීතියක කිසිවක් සඳහන්ව ඇත ද එය නොතකා, මහාධිකරණය ඉදිරියෙහි වරදකරු කරනු ලැබූ විට මරණීය දණ්ඩනයෙන් හෝ අවුරුදු විස්සකට වැඩි නො වන කාලයක බරපතල වැඩ ඇතිව බන්ධනාගාර ගත කිරීමෙන් හෝ දඬුවම් කරනු ලැබිය යුතුවත් හැර ඔහුගේ දේපළ ද රාජ්‍ය සන්තක විය යුතුය.

22. (1) අගමැති විසින් ආඥවක මාර්ගයෙන් සඳහන් කරනු ලැබූ ශ්‍රී ලංකාවේ යම් ප්‍රදේශයක—

ගිනි තැබීම, කොල්ලකෑම හා අයුතු ඇතුළුවීම.

(අ) ගින්නෙන්, යම් දෘශ්‍ය පදර්ථයකින්, යම් පුපුරන ද්‍රව්‍යයකින්, විබාදන ද්‍රව්‍යයකින් හෝ යම් අන්දමක දමාගසන ආයුධයකින් හෝ උපකරණයකින් චංචල හෝ නිශ්චල දේපළකට විනාශයක් හෝ හානියක් සිදු කරන, හෝ ඒ දේපල රජයට, හෝ යම් පළාත් පාලන ආයතනයකට, හෝ යම් පුද්ගලයකුට හෝ පුද්ගල මණ්ඩලයකට අයිති වුවද, එබඳු යම් දේපලක වටිනාකම නැති කරන හෝ ප්‍රයෝජනය අඩු කරන අන්දමේ යම් වෙනසක් ඇති කරන යම් ක්‍රියාවක් කරන ; හෝ

(අඅ) ගින්නෙන් හෝ යම් දැවෙන ද්‍රව්‍යයකින් හෝ යම් පුපුරන හෝ විබාදන ද්‍රව්‍යයකින් හෝ යම් අන්දමක දමාගසන ආයුධයකින්, ආයුධයකින් හෝ උපකරණයකින් හෝ යම් විස්තරයක ආයුධයකින් අන්කිසි තැනැත්තකුට මරණය හෝ තුවාළ සිදු කරන හෝ එබන්දක් කිරීමට තැත් කරන ; හෝ

(ආ) හිස්ව හෝ ආරක්ෂා රහිතව තිබෙන්නට ඉඩ හැර ඇති යම් භූමියකදී භාණ්ඩයක් සොරකම් කරන ; හෝ

(ඇ) අත්‍යාවශ්‍ය සේවාවන් ඉටු කිරීමේදී පාවිච්චි කරනු ලබන හෝ පාවිච්චි කිරීමට අදහස් කරනු ලබන යම් වාහනයක, යන්ත්‍රයක, උපකරණයක හෝ වෙනත් දෙයක කාර්යක්ෂමතාව දුර්වල කිරීම හෝ ක්‍රියාකාරිත්වයට බාධා කිරීම හෝ ඉහත දැක්වෙන පරිදි පාවිච්චි කරනු ලබන හෝ පාවිච්චි කිරීමට අදහස් කරනු ලබන යම් නිර්මාණයක, ගොඩනැගිල්ලක හෝ භූමියක ප්‍රයෝජන අඩු කිරීම ඒ ක්‍රියාවෙන් සිදුවිය හැකි යයි අදහස් කරමින් හෝ ඒ බව දැන දැනම හෝ ඒ බව විශ්වාස කිරීමට යුක්ති සහගත හේතු සහිතව යම් ක්‍රියාවක් කරන ; හෝ

(ඈ) දණ්ඩ නීති සංග්‍රහයේ 427 සිට 446 තෙක් වූ වගන්ති අතුරෙන් යමක් යටතේ යම් වරදක් සිදු කරන හෝ යම් භූමියකින් යම් භාණ්ඩ හෝ ද්‍රව්‍ය නීති විරෝධී ලෙස ඉවත් කරන හෝ ඉවත් කිරීමට තැත් කරන ; හෝ 19 අධි.

(ඉ) දණ්ඩ නීති සංග්‍රහයේ 138 වෙනි වගන්තියෙහි විස්තර කරනු ලබන පරිදි, ඉහත දැක්වෙන අනුච්ඡේද අතුරෙන් යමක සඳහන් යම් ක්‍රියාවක් කිරීමේ පරමාර්ථය වන නීති විරෝධී රැස්වීමක සාමාජිකයකු වන 19 අධි.

යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතුය. තවද, දණ්ඩ නීති සංග්‍රහයෙහි හෝ මේ නියෝගවල කුමක් සඳහන් වුවද, මහාධිකරණය ඉදිරියේ වරදකරු වූ විට, මරණ දඬුවමට හෝ ජීවිතාන්තය දක්වා උදයාකාර යෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමට හෝ යටත් විය යුතුය.

19 අයි.

(2) දේපල පුද්ගලිකව ආරක්ෂා කිරීම පිළිබඳ අයිතිවාසිකමට අදාළ වන්නා වූ ද ඒ අයිතිවාසිකම් පාවිච්චි කිරීමේදී වරද කරන්නකුට මරණය හෝ වෙනත් හානියක් සිදු කරවනු ලැබිය හැකි අවස්ථා නියම කරන්නා වූ ද දණ්ඩ නීති සංග්‍රහයේ 96 වෙනි වගන්තිය, ඒ වගන්තිය අවසානයේදී පහත දැක්වෙන පාඨය එකතු කරනු ලැබූ සේ බල පැවැත්විය යුතුය :—

" පස්වනුව—හදිසි අවස්ථා (විවිධ විධිවිධාන හා බලතල) නියෝගයන්හි 22 වෙනි නියෝගය යටතේ යම් වරදක්. "

(3) වරද කරන වේලාවෙහි හෝ අවස්ථාවෙහි පැවති මහාජන කැළඹීම වර්ධනය කිරීම සඳහා හෝ ඒ සම්බන්ධයෙන් හෝ මහජන කැළඹීමක දී වරද කරනු ලැබූ බවට නීතිපති සෑහීමට පත්වන්නේ නම්, මේ නියෝගය යටතේ වරදක් සම්බන්ධයෙන් නඩු පැවරීමක් සඳහා මේ නියෝගවල 58 වැනි නියෝගය යටතේ නීතිපතිගේ ලිඛිත අනුමැතිය දිය හැකිය.

අප්‍රසාදය වැළැක්වීම.

23. කිසිම තැනැත්තකු විසින්—

(අ) (i) රාජ්‍ය නිලධරයන් වූ,

(ii) ජන රජයේ සේවයෙහි නියුක්ත, හෝ

(iii) අත්‍යවශ්‍ය සේවාවන් ඉටු කිරීමෙහි නියුක්ත වූ තැනැත්තන් අතර අප්‍රසාදය ඇති කිරීමට උත්සාහ කිරීම ;

(ආ) (අ) ඡේදයෙහි සඳහන් කරනු ලැබූ යම් තැනැත්තකු රාජ්‍ය නිලධරයකු වශයෙන් හෝ අවස්ථාව පරිදි එලෙස නියුක්ත වූ තැනැත්තකු වශයෙන් හෝ තම යුතුකම කඩ කරනු වස් යමක් කිරීමට හෝ යමක් නොකොට පැහැර හැරීමට හෝ පෙළඹවීමට උත්සාහ කිරීම ;

(ඇ) (අ) අනුච්ඡේදය හෝ (ආ) අනුච්ඡේදය උල්ලංඝනය කිරීමේ අදහසින් හෝ උල්ලංඝනය කිරීමට සහාය වීම, අනුබලදීම, උපදෙස්දීම සඳහා හෝ ඉහතකී තැනැත්තන් අතර පිටපත් විසුරුවා හැරීමෙන් එබඳු උල්ලංඝනය කිරීමක් සංග්‍රහිත වන ස්වභාවයකින් යුත් යම් ලේඛනයක් තම ස්වාමිත්වය හෝ තම පාලනය යටතේ තබා ගැනීම ;

නොකළ යුතුය.

රාජ්‍ය භේදය හා පෙළඹවීම.

24. කථික හෝ ලිඛිත වචනවලින්, හෝ සලකුණුවලින් හෝ දෘශ්‍ය නිරූපණවලින්, හෝ හැසිරීමෙන් හෝ අන් කිසි ක්‍රියාවකින්—

(අ) ජනාධිපතිවරයා හෝ ආණ්ඩුව ද්වේෂයට හෝ අපහාසයට ලක් කරන හෝ ලක් කිරීමට තැත් කරන, හෝ ජනාධිපතිවරයා හෝ ආණ්ඩුව කෙරෙහි අප්‍රසාදාත්මක හෝ ද්වේෂ සහගත හෝ අපහාසාත්මක හැඟීම් අවුස්සන හෝ පොළඹවන, හෝ එබඳු හැඟීම් ඇවිස්සීමට හෝ පෙළඹවීමට තැත් කරන ; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමය හෝ අධිකරණ පාලනය ද්වේෂයට හෝ අපහාසයට ලක් කරන හෝ ලක් කිරීමට තැත් කරන හෝ ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමය කෙරෙහි හෝ අධිකරණ පාලනය කෙරෙහි ද්වේෂ සහගත හෝ අපහාසාත්මක හැඟීම් අවුස්සන හෝ පොළඹවන හෝ එබඳු හැඟීම් ඇවිස්සීමට හෝ පෙළඹවීමට තැත් කරන ; හෝ

(ඇ) නීති මගින් ප්‍රතිෂ්ඨාපිත යම් කරුණක් නීත්‍යානුකූල මාර්ගයකින් හැර අන් ලෙසකින් වෙනස් කර ගන්නා ලෙස ශ්‍රී ලංකාවේ වැසියන් හෝ ඔවුන් අතුරෙන් යම් කොටසක්, පන්තියක් හෝ සමූහයක් අවුස්සන හෝ පොළඹවන හෝ ඇවිස්සීමට හෝ පෙළඹවීමට තැත් කරන ; හෝ

(ඈ) ශ්‍රී ලංකාවේ වැසියන් අතර හෝ ඔවුන්ගේ යම් කොටසක්, පන්තියක් හෝ සමූහයක් අතර අතෘප්තිය හෝ අප්‍රසාදය පහළ කරවන හෝ ඇති කරවන හෝ පහළ කරවීමට හෝ ඇති කරවීමට තැත් කරන ; හෝ

(ඉ) ශ්‍රී ලංකාවේ වැසියන්ගේ විවිධ කොටස්, පන්ති හෝ සමූහයන් අතර ද්වේෂ සහගත හෝ විරුද්ධ හැඟීම් දියුණු කරන හෝ පෝෂණය කරන හෝ දියුණු කිරීමට හෝ පෝෂණය කිරීමට තැත් කරන ; හෝ

(ඊ) නීති මගින් ප්‍රතිෂ්ඨාපිත යම් කරුණක් වෙනස් කරන ලෙස හෝ යම් ක්‍රියාවක් හෝ දෙයක් කරන ලෙස හෝ කිරීමෙන් වැළකී සිටින ලෙස ජාතික රාජ්‍ය සභාව හෝ ආණ්ඩුව පෙළඹවීමේ හෝ ජාතික රාජ්‍ය සභාවට හෝ ආණ්ඩුවට බල කිරීමේ කාර්ය්‍ය සඳහා යම් ආකාරයක කායික බලහත්කාරය හෝ සහාසිකත්වය, සාමය කඩ කිරීම, නීතියට අකීකරු වීම හෝ නීතිය ක්‍රියාවේ යෙදීමට බාධා කිරීම ක්‍රියාත්මක කරන ලෙස ශ්‍රී ලංකාවේ වැසියන් හෝ ඔවුන් අතුරෙන් යම් කොටසක්, පන්තියක් හෝ සමූහයක් අවුස්සන හෝ පොළඹවන හෝ ඇවිස්සීමට හෝ පෙළඹවීමට තැත් කරන ; හෝ

(උ) යම් හදිසි අවස්ථා නියෝගයක් කඩ කිරීමක් සංග්‍රහිත වන යම් ක්‍රියාවක් හෝ දෙයක් කිරීමට හෝ නොකර හැරීමට ශ්‍රී ලංකාවේ වැසියන් හෝ ඔවුන් අතුරෙන් යම් කොටසක්, පන්තියක් හෝ සමූහයක් අවුස්සන හෝ පොළඹවන හෝ ඇවිස්සීමට හෝ පෙළඹවීමට තැත් කරන

යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර යටත් පිරිසෙයින් තුන් මාසය දක්වා දීර්ඝ විය යුතු වූත් අවුරුදු විස්සට වඩා දීර්ඝ නොවිය යුතු වූත් බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් ලැබිය යුතුවාක් මෙන්ම, දඩයකට ද යටත් කළ හැකිය.

*සටන්පාඨ යනාදිය ප්‍රදර්ශනය කිරීම.*

25. නීතියෙන් පිහිටුවා ඇති ශ්‍රී ලංකාණ්ඩුව නීත්‍යානුකූල මාර්ගයකින් හැර අන් ලෙසකින් බිඳ හෙළීමේ හෝ බලයෙන් යටත් කර ගැනීමේ අවශ්‍යතාවට, යුතුකමට හෝ යෝග්‍යතාවට, කථික හෝ ලිඛිත වුවද, වචනවලින් හෝ සංඥාවලින් හෝ දෘශ්‍ය නිරූපණවලින් හෝ හැසිරීමෙන් හෝ වෙන යම් ක්‍රියාවකින් නියම ලෙස හෝ අනියම් ලෙස පක්ෂව කථා කරන, කරුණු කියා සිටින හෝ ඒ සඳහා උපදෙස් දෙන කවරකු වුවද වරදකට වරදකරු විය යුතුය.

*පත්‍රිකා ආදිය බෙදා හැරීම.*

26. (i) අගමැති විසින් ආඥාවකින් නියම කරනු ලැබූ ශ්‍රී ලංකාවේ කිසියම් ප්‍රදේශයක, පොලිස්පතිගේ හෝ පොලිස්පති විසින් ඒ වෙනුවෙන් බලය පවරනු ලැබූ යම් පොලිස් නිලධරයකුගේ අවසරය නොමැතිව, කිසිම තැනැත්තකු විසින් යම් දැන්වීම් කොළ, අත් පත්‍රිකා හෝ පත්‍රිකා මහජනයාට පෙනෙන යම් ස්ථානයක ඇලවීම හෝ මහජනයා අතර බෙදා හැරීම හෝ නොකළ යුතු ය.

එසේ වුවද, ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව යටතේ වූ යම් මැතිවරණයක දී යම් අපේක්ෂකයකු තෝරා ගැනීමේ ඉඩ වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා, දැන්වීම් කොළ, අත් පත්‍රිකා හෝ පත්‍රිකා එසේ ඇලවීමට හෝ බෙදා හැරීමට ඉහත කී රාජසභා ආඥාව යටතේ අවසර දී ඇති ප්‍රමාණයට ඒ මැතිවරණයේ නාම යෝජනා භාරගන්නා දිනයෙන් ආරම්භව ඡන්දය විමසන දිනයට පසු දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ දී ඒවා ඇලවීම හෝ බෙදා හැරීම සම්බන්ධයෙන් මේ ඡේදයෙහි ඉහත දැක්වුණු විධිවිධාන අදාළ නොවන්නේය.

(2) මේ නියෝගයෙහි (1) වෙනි ඡේදය යටතෙහි තැනැත්තකු විසින් කරනු ලැබූ බවට චෝදිත වරදක් සම්බන්ධ යම් නීති කෘත්‍යයකදී යම් දැන්වීම් කොළ, අත් පත්‍රිකා හෝ පත්‍රිකා මහජනයාට පෙනෙන ස්ථානයක ඇලවීමට හෝ මහජනයා අතර බෙදා හැරීමට පොලිස්පතිගෙන් හෝ පොලිස්පති විසින් ඒ වෙනුවෙන් බලය පවරනු ලැබූ යම් නිලධරයකුගෙන් හෝ අවසරය ඒ තැනැත්තාට නොතිබුණු බව සඳහන් පොලිස්පති විසින් අත්සන් තබන ලද සහතිකයක් පොලිස්පතිගේ අත්සන ඔප්පු කිරීමක් නොමැතිව සාක්ෂි වශයෙන් පිළිගනු ලැබිය යුතු අතර ඒ සහතිකයෙහි සඳහන් කරුණු සම්බන්ධයෙන් විනිශ්චයට භාජන විය යුතු සාක්ෂි විය යුතුය.

*කටකතා හා ව්‍යාජ ප්‍රකාශ පැතිරවීම හෝ විසුරුවා හැරීම*

27. මහජනයා බිය වැද්ද විය හැකි හෝ මහජනයා කැළඹවිය හැකි කිසිම කටකතාවක් හෝ ව්‍යාජ ප්‍රකාශයක් කට වචනයෙන් හෝ වෙන කවර වූ හෝ ක්‍රමයකින් පැතිරවීම හෝ විසුරුවා හැරීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතුය.

*ඇතැම් වර්ගවල ලේඛන මුද්‍රණය කිරීම සහ පළ කිරීම.*

27අ. පහත දක්වන කරුණුවලින් යමක්, එනම් :—

(අ) 68 වන නියෝගය යටතේ තහනම් කරනු ලැබූ යම් සංවිධානයක කටයුතු ;

(ආ) ත්‍රස්තවාදී ව්‍යාපාරය පිළිබඳව ආණ්ඩුව විසින් පවත්වාගෙන යනු ලබන විමර්ශනවලට අදාළ යම් කරුණක් ;

(ඇ) පොලිසියේ, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සේනාංක රඳවා තිබෙන ආකාරය, ඒවායේ තත්ත්වය, යාම් ඊම් හෝ කටයුතු ;

(ඈ) ශ්‍රී ලංකාවෙහි ආරක්ෂාවට සහ රැකවරණයට අදාළ යම් කරුණක් ;

(ඉ) ජාතිවාදී හැඟීම් නියම ලෙස හෝ අනියම් ලෙස ඇවිස්සෙන සුළු යම් කරුණක් ;

සම්බන්ධයෙන් වාර්තා කරන හෝ තොරතුරු සපයන හෝ ඒ සම්බන්ධයෙන් අදහස් දක්වන යම් ලේඛනයක් හෝ ඒ සම්බන්ධයෙන් වූ යම් චිත්‍රගත නිරූපණයක්, ඡායාරූපයක් හෝ චලන චිත්‍රපටයක් මුද්‍රණය කරන හෝ පළ කරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතුය :

එසේ වුව ද, මේ නියෝගයේ පෙරාතුව වූ විධිවිධාන, යම් අධිකරණයක් ඉදිරියෙහි හෝ 1972 අංක 14 දරන අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභා පනත යටතේ පිහිටුවන ලද යම් කොමිෂන් සභාවක් ඉදිරියෙහි පැවැත්වෙන යම් නීති කෘත්‍යයකට හෝ එවැනි යම් නීති කෘත්‍ය මුද්‍රණය කිරීමට හෝ පළ කිරීමට අදාළ නොවිය යුතුය.

*අසත්‍ය ප්‍රකාශ.*

28. යම් තැනැත්තකු—

(අ) යම් හදිසි අවස්ථා නියෝගයක් හෝ හදිසි අවස්ථා නියෝගයක් යටතේ කරනු ලැබූ යම් ආඥාවක් ප්‍රකාර කරනු ලැබූ ඉල්ලීමකට පිළිතුරු වශයෙන් සැලකිය යුතු කරුණක් සම්බන්ධයෙන් අසත්‍ය බව තමා දන්නා වූ හෝ එලෙස බව විශ්වාස කිරීමට යුක්ති සහගත හේතුවක් ඇත්තා වූ යම් ප්‍රකාශයක් කළහොත් හෝ එබඳු යම් තොරතුරක් සැපයුවහොත්, නැතහොත්

(ආ) යම් හදිසි අවස්ථා නියෝගයකින් හෝ හදිසි අවස්ථා නියෝගයක් යටතේ කරනු ලැබූ ආඥාවකින් හෝ කරන ලෙස නියම කරනු ලැබූ යම් ගිණුමක, ප්‍රකාශයක, තක්සේරුවක, වාර්තාවක, හෝ අන් කිසි ලේඛනයක ඉහත සඳහන් පරිදි ප්‍රකාශයක් කළහොත්,

ඔහු වරදකට වරදකරු විය යුතුය.

*සිතියම ආදිය සන්තකයෙහි තබා ගැනීම.*

29. රාජ්‍ය සංස්ථාවක් ඇතුළත් රජයේ යම් කාර්යාලයකට, සංවිධානයකට, ආයතනයකට හෝ සංස්ථාවකට හෝ පොලිස් හමුදාවේ හෝ සන්නද්ධ හමුදාවන්හි ප්‍රවාහණ සේවාවන්හි සාමාජිකයන් සේවයෙහි යෙදවීමට හෝ ඔවුන් පිළිබඳව සූදුස්සක් කිරීමට හෝ පොලිස් හමුදාවට හෝ සන්නද්ධ හමුදාවට අයිති යුද්ධායුධ හෝ වෙඩි බෙහෙත්වලට අදාළ වන හෝ ඊට සම්බන්ධ වන යම් සිතියමක්, සැළැස්මක්, සටහනක්, චිත්‍රයක් හෝ කටු සටහනක් හෝ වෙනත් තොරතුරු, නීත්‍යානුකූල නිදහසට කරුණක් නොමැතිව, සපයන හෝ ස්වකීය භාරයෙහි හෝ පාලනයෙහි තබා ගන්නා හෝ සන්තකයෙහි තබා ගන්නා හෝ ලබා ගැනීමට හෝ සන්තකයෙහි තබා ගැනීමට තැත් කරන කවරකු වුව ද වරදකට වරදකරු විය යුතුය. නීත්‍යානුකූල නිදහසට කරුණු ඔප්පු කිරීමේ භාරය එකී තැනැත්තා වෙත විය යුතුය.

*විනාශකාරී පොත්පත් සන්තකයෙහි තබා ගැනීම.*

30. මහජන ආරක්ෂාව හෝ මහජන සාමය රැකීමට හානිකර විය හැකි හෝ රජය කෙරෙහි වෛරයෙන් යුත් හෝ අපහාසයෙන් යුත් හැඟීම ඇවිස්සීමට, ඊට ධෛර්ය දීමට හෝ අනුබල දීමට ඉඩ ඇති, හෝ රජය බිඳ හෙළීම සඳහා යම් පියවරක් ගැනීමට නියම ලෙස හෝ අනියම් ලෙස යම් තැනැත්තකු පෙළඹවීමට ඉඩ ඇති යම් පොතක්, ලේඛනයක් හෝ යම් ලියවිල්ලක් හෝ කරුණු සැලකිරීමක් අඩංගු යම් ලිපියක්, නීත්‍යානුකූල

බලයක් හෝ ක්ෂමාවට සෑහෙන කරුණු නොමැතිව තම සන්තකයෙහි, භාරයෙහි හෝ පාලනයෙහි ඇති කවරකු වුවද වරදකට වරදකරු විය යුතුය. නීත්‍යානුකූල බලය හෝ ක්ෂමාවට සෑහෙන කරුණු ඇති බව ඔප්පු කිරීමේ භාරය ඒ තැනැත්තා වෙත විය යුතුය.

යුද්ධායුධ යනාදිය රැස් කිරීම.

31. යුද්ධායුධ, වෙඩි බෙහෙත්, පුපුරන ද්‍රව්‍ය හෝ ආයුධ හෝ වෙනත් අන්තරායදායක භාණ්ඩ හෝ ද්‍රව්‍ය රැස්කරන හෝ එකී යුද්ධායුධ, වෙඩි බෙහෙත්, පුපුරන ද්‍රව්‍ය, ආයුධ හෝ අන්තරායදායක භාණ්ඩ හෝ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමෙහිලා යම් තැනැත්තකු සූදනම් කරන, පුහුණු කරන, හෝ පුහුණු කිරීමට තැත් කරන කවරකු වුවද වරදකට වරදකරු විය යුතුය.

නිල ඇඳුම්වලට සමාන ඇඳුම් පැළඳුම් ඇඳීම.

32. සන්නද්ධ හමුදාවන්හි හෝ පොලිස් හමුදාවෙහි යම් සාමාජිකයකු විසින් පලඳිනු ලබන හෝ පාවිච්චි කරනු ලබන ඇඳුමට, වස්ත්‍රයට, නිල ඇඳුමට, හැඳුනුම්පතට, ලකුණට හෝ වෙනත් සංකේතයට යම් ආකාරයකින් හෝ යම් විස්තරයක් අනුව සමාන වන යම් ඇඳුමක්, වස්ත්‍රයක්, නිල ඇඳුමක්, හැඳුනුම්පතක්, ලකුණක්, හෝ වෙනත් සංකේතයක්, පලඳින හෝ එහි භාරය හෝ පාලනය තම සන්තකයෙහි ඇති, සන්නද්ධ හමුදාවන්හි හෝ පොලිස් හමුදාවෙහි සාමාජිකයකු නොවන කවරකු වුවද වරදකට වරදකරු විය යුතුය.

පුපුරණ ද්‍රව්‍ය, පීඩාකාරී ආයුධ සහ පීඩාකාරී ද්‍රව්‍ය.

33. (1) අගමැති විසින් නියමයකින් දක්වන ලද යම් කිසි ප්‍රදේශයක නීත්‍යානුකූල අධිකාරයක් හෝ සාධාරණ හේතුවක් නොමැතිව යම්කිසි පුපුරන ද්‍රව්‍යයක්, පීඩාකාරී ආයුධයක් හෝ පීඩාකාරී ද්‍රව්‍යයක් ප්‍රවාහනය කරන හෝ ප්‍රවාහනය කිරීමට සලස්වන නැතහොත් තම සන්තකයෙහි හෝ පාලනය යටතේ තබා ගන්නා යම් තැනැත්තකු වරදකරුවකු වන අතර එවැනි නීත්‍යානුකූල අධිකාරයක් හෝ සාධාරණ හේතුවක් ඇති විට එය ඔප්පු කිරීමේ භාරය ඒ තැනැත්තා වෙත පැවරෙන්නේය.

(2) යම් තැනැත්තකු මේ නියෝගය යටතේ වරදක් කරතැයි විශ්වාස කිරීමට පොලිස් නිලධරයකුට හෝ කෝපරල් තත්ත්වයට නො අඩු තත්ත්වයක ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සාමාජිකයකුට හෝ නායක නැවියකුගේ තත්ත්වයට නොඅඩු තත්ත්වයක ශ්‍රී ලංකා නාවික හමුදාවේ සාමාජිකයකුට හෝ කෝපරල් තත්ත්වයට නොඅඩු තත්ත්වයක ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයකුට සාධාරණ හේතු ඇති විට ඒ තැනැත්තාගේ සන්තකයෙහි හෝ පාලනය යටතේ තිබෙන යම් කිසි පුපුරන ද්‍රව්‍යයක්, පීඩාකාරී ආයුධයක්, හෝ පීඩාකාරී ද්‍රව්‍යයක් එකී නිලධරයා හෝ සාමාජිකයා විසින් ඉවත් කළ හැකිය.

(3) මේ නියෝගය යටතේ යම් වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ අවස්ථාවක ඒ වරද කිරීමෙහිලා පාවිච්චි කරනු ලැබූ යම් වාහනයක් හෝ යාත්‍රාවක් ජනරජය වෙත සතු කරනු ලැබිය හැකිය.

(4) මේ නියෝගය යටතේ යම් වරදක් කරන තැනැත්තකු සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයකු විසින් නඩු විභාග කරනු ලැබිය යුතු අතර ඒ තැනැත්තා වරදකරු කරනු ලැබූ විට අවුරුදු පහකට නොඅඩු කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කරනු ලැබීම හා දඩය යන දඬුවම් දෙකට ම ඔහු යටත් විය යුතුය.

(5) මේ නියෝගයෙහි—

"පීඩාකාරී ද්‍රව්‍ය" යන්නෙන් ගිනිගන්නා සුළු, විබාදන හෝ ප්‍රචණ්ඩ ද්‍රව්‍යයක් අදහස් වේ. තව ද,

"පීඩාකාරී ආයුධ" යන්නෙන් බෝම්බයක් හෝ අත් බෝම්බයක් නැතහොත් බෝම්බයක හෝ අත් බෝම්බයක උපයෝගී කර ගැනීමක් හා සමාන උපයෝගී කර ගැනීමක් සඳහා හෝ බෝම්බයක හෝ අත් බෝම්බයක කාර්යය හා සමාන කාර්යයක් සඳහා සාදනු ලැබූ හෝ අදහස් කරනු ලැබූ අන් කිසි උපායක් හෝ උපක්‍රමයක් හෝ කායික තුවාල සිදු කිරීමට හෝ දේපළ හානි කිරීමට හෝ පාවිච්චි කළ හැකි යම් ද්‍රව්‍යයක් අදහස් වන අතර එවැනි බෝම්බයක, අත් බෝම්බයක, උපායක හෝ උපක්‍රමයක කොටසක් විය හැකි යම් කිසි දෙයක් හෝ ද්‍රව්‍යයක් එයට ඇතුළත් වේ.

(6) තුවක්කු ආඥාපනතෙහි කුමක් සඳහන්ව ඇතද, අගමැති විසින් නියමයකින් නියම කරනු ලැබූ ශ්‍රී ලංකාවේ යම් ප්‍රදේශයක, බලපත්‍ර නොලත් තුවක්කු භාරයේ තබා ගැනීම හෝ සන්තකයෙහි තබා ගැනීම හෝ ඒවා පාවිච්චි කිරීම සම්බන්ධයෙන් ඒ ආඥාපනතේ 22 වන වගන්තියෙහි විධිවිධාන කඩ කිරීම හේතුකොටගෙන ඒ ආඥාපනතට විරුද්ධ වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු පහකට නොවැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කරනු ලැබීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

දුම්රිය ගමන ආයුධ විසි කිරීම.

34. අගමැති විසින් ආඥාවකින් නියම කරනු ලැබූ ශ්‍රී ලංකාවෙහි යම් ප්‍රදේශයක ඇන්ජිමක්, ඇඳු රථයක්, මැදිරියක්, ට්‍රක් රථයක් හෝ වාහනයක් තුළ හෝ මත සිටින යම් තැනැත්තකුගේ ආරක්ෂාවට හානිවන පරිදි යම් දුම්රිය මාර්ගයක, ඇන්ජිමකට, ඇඳු රථයකට, මැදිරියකට, හෝ ට්‍රක් රථයකට, හෝ යම් ප්‍රසිද්ධ පාරක යම් වාහනයකට, කිසිම තැනැත්තකු විසින් කිසිම දෙයක් හෝ ද්‍රව්‍යයක් විසි නොකළ යුතුය.

තුවක්කුව එල්ල කිරීම.

35. අගමැති විසින් ආඥාවකින් නියම කරනු ලැබූ ශ්‍රී ලංකාවෙහි යම් ප්‍රදේශයක කිසිම තැනැත්තකු විසින් පතරොන් දමනු ලැබූ හෝ නොදමනු ලැබූ යම් තුවක්කුවක් මවන යම් තැනැත්තකු කෙරෙහි, නීත්‍යානුකූල හේතුවක් නොමැතිව එල්ල නොකළ යුතුය.

36. (1) අගමැති විසින් ආඥාවකින් නියම කරනු ලැබූ ශ්‍රී ලංකාවේ යම් ප්‍රදේශයක වෙනයම් තැනැත්තකු වාසය කරන, වැඩ කරන, ව්‍යාපාර කටයුතු ගෙන යන හෝ සිටින ගෙයකට හෝ ස්ථානයකට හෝ එවැන්නක් ළඟට, ඒ ගෙයි හෝ ස්ථානයෙහි යම් තැනැත්තකු බිය ගැන්වීමට එයට ඇතුළුවීම හෝ එයින් පිටවීම අවහිර කිරීමට හෝ සාමය කඩ කිරීමට තුඩුදෙන අන්දමකින් කිසිම තැනැත්තකු නොයා යුතුය.

(2) මේ නියෝගයෙහි "බිය ගැන්වීම" යන පදයෙන්, තැනැත්තකුට, ඔහුගේ පවුලෙහි යම් සාමාජිකයකුට හෝ ඔහුගේ යම් යැපෙන්නකුට හානි කිරීමක් හෝ යම් තැනැත්තකුට හෝ දේපලවලට සාහසික ක්‍රියාවක් හෝ අලාභ හානියක් සම්බන්ධයෙන් ඔහුගේ සිතෙහි සැක ඇති කිරීම අදහස් වන අතර, "හානි කිරීම" යන පදයෙහි තැනැත්තකුගේ ව්‍යාපාරය, වෘත්තීය, රක්ෂාව හෝ වෙනත් ආදායම් මාර්ගයක් සම්බන්ධයෙන් ඔහුට හානි කිරීම ඇතුළත් වන අතර නඩු පැවරිය හැකි සිවිල් වරදක් ද ඇතුළත් වේ.

37. යම් හදිසි අවස්ථා නියෝගයකින් හෝ එය යටතේ යම් තැනැත්තකුට පවරනු හෝ නියම කරනු ලැබූ යම් බලයක් හෝ යුතුකමක් ඉෂ්ට කිරීමේ හෝ ක්‍රියාවේ යෙදවීමේ දී ඒ තැනැත්තාට කිසි ම තැනැත්තකු විසින් විරෝධය පෑම හෝ අවහිර කිරීම නොකළ යුතුය. බලය දරන තැනැත්තන්ට විරෝධය පෑම හා අවහිර කිරීම.

38. (1) ජනාධිපතිවරයා විසින් 2 වන නියෝගය යටතේ පනවනු ලැබූ ආඥාවක් මගින් යම් සේවයක් අත්‍යවශ්‍ය සේවයක් යයි ප්‍රකාශ කරනු ලබන අවස්ථාවක, 1975 මාර්තු 19 වන දින හෝ ඉන්පසු ඒ සේවයට සම්බන්ධ යම් කාර්යයක නියුක්තව සිටි හෝ සේවයෙහි යොදවනු ලැබූ යම් තැනැත්තකු ඒ ආඥාවේ දිනයෙහි සිට එක් දිනයක් ඉකුත් වීමෙන් පසු, තමා වැඩ කරන හෝ සේවයෙහි යෙදී සිටින ස්ථානයට හෝ තම සේවා යෝජකයා විසින් හෝ ඔහුගේ බලය යටතේ ක්‍රියා කරන තැනැත්තකු විසින් කලින් කල නම් කරනු ලබන වෙනත් ස්ථානයකට පැමිණ සිටීම පැහැර හැරියහොත් හෝ ප්‍රතික්ෂේප කළහොත් හෝ ඒ ආඥාවේ දිනයේ සිට එක් දිනයක් ඉකුත්වීමෙන් පසු, තම සේවා යෝජකයා විසින් හෝ ඔහුගේ බලය යටතේ ක්‍රියා කරන තැනැත්තකු විසින් ඉටු කරන ලෙස තමාට නියම කරනු ලබන එබඳු කාර්යයන් පැහැර හැරියහොත් හෝ ඉටු කිරීම ප්‍රතික්ෂේප කළහොත්, වැඩ වර්ජනයකට අනුබල දීමක් වශයෙන් එසේ පැමිණීම හෝ එසේ වැඩ කිරීම පැහැර හැරිය හෝ ප්‍රතික්ෂේප කළ නමුත්, ඔහු— අත්‍යවශ්‍ය සේවා පවත්වාගෙන යාම, එයට බාධා කිරීම ආදිය.

(අ) අන් කිසි නීතියක හෝ ඔහුගේ සේවය පිළිබඳ වූ යම් ගිවිසුමක නියමවල හෝ කොන්දේසිවල පටහැනිව කුමක් සඳහන් වුවද සියලු කාර්යයන් සඳහා ඔහු එකෙනෙහිම තම සේවය අවසන් කළ ලෙස හෝ ඉන් ඉවත් වූ ලෙස සැලකිය යුතුය ;

(ආ) තවද ඊට අතිරේකව වරදකට වරදකරු ද විය යුතුය.

(1අ) (i) මේ නියෝගයේ (1) වන ඡේදයේ විධිවිධාන යටතේ හෝ 1973 දෙසැම්බර් මස 1 වන දින යෙන් ආරම්භව 1975 මාර්තු 18 වන දිනයෙන් අවසන්වූ කාල සීමාව තුළ යම් අවස්ථාවක වලංගුව පැවති යම් හදිසි අවස්ථා නියෝගයක විධිවිධාන යටතේ ස්වකීය සේවා නියුක්තිය අත්හරිනු ලැබ හෝ අවසාන කරනු ලැබ ඇතැයි සැලකෙන යම් තැනැත්තකු සහ ඒ අත්හැරීමට හෝ අවසන් කිරීමට පෙරාතුවම ඔහුගේ සේවා යෝජකව සිටි තැනැත්තා අතර ආරාවුලට හේතුවූ කරුණු ඇතැයි කොමසාරිස්වරයා සෑහීමට පත්වන අවස්ථාවක, ඒ ඡේදයේ හෝ ඒ හදිසි අවස්ථා නියෝගයේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද අවස්ථාවෝචිත යැයි කොමසාරිස්වරයා සලකන පරීක්ෂණයකින් පසු එම කරුණු හෝ එම කරුණුවලට කෙලින් ම හෝ අන් අයුරකින් සම්බන්ධවූ නැතහොත් ඒවායින් උද්ගත වන්නා වූ යම් කරුණක් සම්බන්ධයෙන් යුක්තිසහගත සහ සාධාරණසේ ඔහුට පෙනී යන අතුරු නියමයක් කළ හැකි ය. ස්වකීය සේවා නියුක්තිය එසේ අත්හරිනු ලැබ හෝ අවසාන කරනු ලැබ ඇතැයි සැලකෙන තැනැත්තා නැවත සේවයේ යෙදවිය යුතු යැයි පෙර කී සේවා යෝජකයාට විධාන කෙරෙන නියමයක් එම අතුරු නියමයෙහි ඇතුළත් විය හැකි ය.

(ii) (i) වන අනුඡේදය යටතේ කරනු ලැබූ සෑම අතුරු නියමයක්ම, එම කරුණු බේරුම් කරමින් (iv) වන අනුඡේදයේ විධිවිධාන යටතේ නියමයක් හෝ ප්‍රදානයක් කරනු ලබන තුරු බලපැවැත්විය යුතු ය.

(iii) (1) වන අනුඡේදය යටතේ කරනු ලැබූ යම් අතුරු නියමයකට අනුකූලව කටයුතු කිරීම පැහැර හැරීමකදී, කාර්මික ආරාවුල් පනතේ යටතේ කාර්මික අධිකරණයක් විසින් කරනු ලැබූ ප්‍රදානයක් ක්‍රියාවේ යෙදවීම සහ එවැනි යම් ප්‍රදානයක නියමයන්ට අනුකූලව කටයුතු කිරීම පැහැර හැරීමක දී ගතයුතු ක්‍රියාමාර්ගය පිළිබඳ කාර්මික ආරාවුල් පනතේ VI වන කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ වන්නේ ය. (i) වන අනුඡේදය යටතේ කරනු ලැබූ අතුරු නියමයක් යටතේ නැවත සේවයේ යොදවනු ලැබූ යම් තැනැත්තකු එම අතුරු නියමයේ කවර වූ හෝ විධිවිධානයකට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින අවස්ථාවක, ඔහු ස්වකීය සේවා නියුක්තිය අත්හරිනු ලැබ හෝ අවසාන කරනු ලැබ ඇති සේ සලකනු ලැබේ.

(iv) (i) වන අනුඡේදය යටතේ අතුරු නියමයක් කරනු ලැබුවේ යම් කරුණු පිළිබඳව ද, නැතහොත් කෙලින්ම හෝ අන් අයුරකින් ඒ කරුණු සම්බන්ධවී ඇත්තේ යම් කාරණයක් පිළිබඳව ද, නැතහොත් යම් කාරණයකින් උද්ගත වන්නක් පිළිබඳව ද එය බේරුම් කර ගැනීම සඳහා යම් තැනැත්තකු හෝ බලධරයකු විසින් කාර්මික ආරාවුල් පනතේ යටතේ කටයුතු කිරීම හෝ එය පිහිට කොට ගැනීම මේ නියෝගයේ (1) වන ඡේදයේ හෝ 1973 දෙසැම්බර් මස 1 වන දිනයෙන් ආරම්භව 1975 මාර්තු 18 වන දිනයෙන් අවසන්වූ කාලසීමාව තුළ යම් අවස්ථාවක වලංගුව පැවති යම් හදිසි අවස්ථා නියෝගයක විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද සුදුසු වන්නේ ය.

(v) මේ ඡේදයෙහි පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස " කොමසාරිස්වරයා " සහ " සේවායෝජක " යන්නට කාර්මික ආරාවුල් පනතෙහි පිළිවෙලින් දී ඇති අර්ථයම ඇත්තේ ය.

(2) ජනාධිපතිවරයා විසින් 2 වෙනි නියෝගය යටතේ කරනු ලැබූ ආඥාවක් මගින් යම් සේවයක් අත්‍යවශ්‍ය සේවයක් යයි ප්‍රකාශ කරනු ලබන අවස්ථාවක—

(අ) යම් තැනැත්තකු, කවර ආකාරයකින් හෝ—

(i) ඒ සේවය පවත්වාගෙන යාමට බාධා කළහොත්, අවහිර කළහොත්, එය ප්‍රමාද කළහොත් හෝ සීමා කළහොත්, හෝ

(ii) ඒ සේවය පවත්වාගෙන යාමෙහි හෝ ඒ සම්බන්ධයෙන් සේවයෙහි යොදවනු ලබන අන්කිසි තැනැත්තකුට ඔහු වැඩ කරන තැනට නොපැමිණ සිටින ලෙස බාධා කළහොත්, අවහිර කළහොත්, වළක්වතහොත්, හෝ

(iii) යම් සේවයක සේවයෙහි යොදවනු ලැබූ හෝ එය කරගෙන යාම සඳහා සේවයෙහි යොදවනු ලැබූ යම් තැනැත්තකුට ඔහු වැඩ කරන තැනට නොපැමිණෙන ලෙස පෙළඹුවහොත්, උනන්දු කළහොත්, හෝ දිරිගැන්වූවහොත්, හෝ

(iv) ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ එහි අංශයක් වන සේවයක් වෙනුවට හෝ ඒ හා සමාන්තරව යම් සේවයක් පිහිටුවීමට හෝ පවත්වාගෙන යාමට බල කළහොත්, පෙළඹුවහොත්, උනන්දු කළහොත්, හෝ දිරිගැන්වූවහොත්, හෝ

(v) යම් සේවයක සේවයෙහි යොදවනු ලැබූ හෝ එය කරගෙන යාම සඳහා සේවයෙහි යොදවනු ලැබූ යම් තැනැත්තකුට ඒ සේවය පාවා දීමට, ඉන් ඉවත් වී යාමට (එහි ප්‍රතිඵලයක් වශයෙන් ඒ අන් තැනැත්තා එසේ පාවා දුන්නත්, නැතහොත් ඉවත්ව යතත්, නැතත්) බල කළහොත්, පෙළඹුවහොත්, උනන්දු කළහොත් හෝ දිරිගැන්වූවහොත්, හෝ

(vi) ඒ සේවයෙහි හෝ ඒ සේවය ගෙන යාම සම්බන්ධයෙන් වෙන යම් තැනැත්තකු රක්ෂා ලබාදීම හෝ බාරගැනීම වැලැක්වූවහොත්, හෝ

(ආ) යම් තැනැත්තකු යම් කායික ක්‍රියාවකින් හෝ යම් කථාවකින් හෝ ලියවිල්ලකින් මේ ඡේදයෙහි (අ) අනුඡේදයෙන් නියම කරනු ලැබූ යම් ක්‍රියාවක් කරන ලෙස (එහි ප්‍රතිඵලයක් ලෙස ඒ අනෙක් තැනැත්තා එසේ නියමිත යම් ක්‍රියාවක් කළත් නොකළත්) අන් කිසි තැනැත්තකු පෙළඹුවහොත්, උනන්දු කළහොත් හෝ දිරිගැන්වූවහොත්,

ඔහු වරදකට වරදකරු විය යුතුය.

(3) මේ නියෝගයට විරුද්ධ යම් වරදක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ අවස්ථාවක ඒ වරද සඳහා අධිකරණය විසින් නියම කළ යුතු වෙන යම් දඬුවමකට අතිරේක වශයෙන්—

(අ) ඒ තැනැත්තාගේ සියලුම නිශ්චල හෝ චංචල දේපල ඒ වරදකරු කිරීම ප්‍රකාර ජනරජය සන්තක වන බව සැලකිය යුතුය. එසේම,

(ආ) මේ නියෝග ක්‍රියාත්මකවීමේ දිනයෙන් පසු ඒ තැනැත්තා විසින් ඒ දේපල සම්බන්ධයෙන් කරනු ලැබූ යම් අන්සතු කිරීමක් හෝ වෙන යමක් කිරීමත් ශූන්‍ය හා බල රහිත වන ලෙස සැලකිය යුතුය.

මාර්ග, දුම්රිය මාර්ග ආදිය අවහිර කිරීම හෝ එකී මාර්ග ආදියට අලාභහානි කිරීම.

39. අගමැති විසින් ආඥාවකින් නියම කරනු ලැබූ ශ්‍රී ලංකාවෙහි යම් ප්‍රදේශයක ප්‍රසිද්ධ පාරක්, පාලමක්, බෝක්කුවක්, යම් දුම්රිය මාර්ගයක් හෝ මහාමාර්ග ගමනාගමන වාහනයක් නීත්‍යානුකූල බලය නොමැතිව කිසිම තැනැත්තකු විසින් අවහිර කිරීම හෝ එකී දෙයකට අලාභහානි කිරීම හෝ නොකළ යුතුය.

දුම්රිය, තැපැල් හා ගමනාගමන සේවයන් සමග අයුතු ලෙස මැදහත්වීම ආදිය.

40. (1) කිසිම තැනැත්තකු විසින් අගමැති, විසින් ආඥාවකින් නියම කරනු ලැබූ යම් ප්‍රදේශයක පහත දක්වෙන සියලු ක්‍රියා හෝ ඉන් යමක් හෝ නොකළ යුතුය :—

(අ) ගමන් කිරීමට බලය දෙන අවසර පත්‍රයක් නොමැතිව පළමුව තම ගාස්තුව ගෙවා ප්‍රවේශ පත්‍රයක් නොලබා හෝ ආණ්ඩුව විසින් පවත්වා ගෙන යනු ලබන යම් දුම්රියක ගමන් කිරීම ;

(ආ) ඒ දුම්රිය ක්‍රියා කරවීම සම්බන්ධයෙන් කිනම් ආකාරයකින් වුව ද බාධා කිරීම හෝ අයුතු ලෙස මැදහත් වීම ;

(ඇ) ආණ්ඩුව විසින් පවත්වාගෙන යනු ලබන තැපැල් සේවාවන්ට කිනම් ආකාරයකින් වුව ද බාධා කිරීම හෝ ඒ සම්බන්ධයෙන් අයුතු ලෙස මැදහත් වීම ;

(ඈ) පළමුව තම ගාස්තුව ගෙවා ප්‍රවේශ පත්‍රයක් නොලබා මහාමාර්ග ගමනාගමන වාහනයක ගමන් කිරීම ;

(ඉ) එබඳු වාහනයක් ක්‍රියා කිරීම සම්බන්ධයෙන් කිනම් ආකාරයකින් වුව ද බාධා කිරීම හෝ අයුතු ලෙස මැදහත් වීම.

(2) ගමන් කිරීම සඳහා බලය දෙන අවසර පත්‍රයක් නොමැතිව හෝ පළමුව තම ගාස්තුව ගෙවා ප්‍රවේශ පත්‍රයක් නොලබා ආණ්ඩුව විසින් පවත්වා ගෙන යනු ලබන දුම්රියක ගමන් කිරීම හෝ පළමුව තම ගාස්තුව ගෙවා ප්‍රවේශ පත්‍රයක් නොලබා මහාමාර්ග ගමනාගමන වාහනයක ගමන් කිරීම යන කරුණු නිසාම පමණක් තම සේවයේ බලය හෝ අන් ලෙසකින් ලැබූ බලය ප්‍රකාර තමාට එසේ කිරීමට හිමිකම් ඇති වුවහොත් මේ නියෝගයේ (1) වෙනි ඡේදයේ (අ) අනුඡේදයේ හෝ (ඈ) අනුඡේදයේ හෝ විධිවිධාන යම් තැනැත්තකු උල්ලංඝනය කළ ලෙස නොසැලකිය යුතුය.

විදුලි පණිවුඩ යනාදියට අදාළ වරදවල්.

41. (1) තැපැල්, විදුලි පණිවුඩ, විදුලි සංදේශ හෝ ගුවන් විදුලි ප්‍රචාරක සේවාවන්ට බලපාන, එම සේවා අබල කරන, හානි කරන, කඩාකප්පල් කරන, අවුල් කරන හෝ වෙනස් කරන අදහස, අභිප්‍රාය හෝ අරමුණ ඇතිව යම් ක්‍රියාවක් කරන්නා වූ හෝ යම් ක්‍රියාවක් කිරීමට සූදානම් වන්නා වූ, කුමන්ත්‍රණය කරන්නා වූ හෝ තැත් කරන්නා වූ හෝ එබඳු ක්‍රියාවක් කිරීමට යම් ආකාරයකින් අනුබල දෙන්නා වූ කවරකු වුව ද වරදකට වරදකරු විය යුතුය.

(2) නීත්‍යානුකූල අවසරයක් හෝ සාධාරණ හේතුවක් නොමැතිව ශ්‍රව්‍යතා සංඛ්‍යාත, ශව්‍යශබ්ද සංඛ්‍යාත බවට පරිවර්තනය කිරීමේ හැකියාව තිබෙන්නා වූ හෝ ටැලිපෝන් සංවාදයක් වාර්තා කර ගත හැකි වූ හෝ යම් කන් යොමුවක්, මයික්‍රොපෝනයක්, ශබ්ද විකාශනයක් හෝ වෙනත් උපකරණයක් හෝ මෙවලමක් ආණ්ඩුවේ ටැලිපෝන් සේවා සැපයීම සඳහා ප්‍රයෝජනයට ගනු ලබන යම් ස්ථානයක තම සන්තකයේ, භාරයේ හෝ පාලනයේ තබා ගෙන සිටින කවර තැනැත්තකු වුව ද වරදකට වරදකරු විය යුතුය. නීත්‍යානුකූල අවසරය හෝ සාධාරණ හේතුව ඔප්පු කිරීමේ භාරය එකී තැනැත්තා වෙත විය යුතුය.

*වරදවල් කිරීමම තැත්කිරීම යනාදිය.*

42. යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වරදක් කිරීමෙහිලා—

(අ) කිරීමට තැත් කරන හෝ කිරීමට සූදානම්වීමේ යම් ක්‍රියාවක් කරන, හෝ

(ආ) කිරීමට අන් තැනැත්තකුට ආධාර හෝ අනුබල දෙන, හෝ

(ඇ) අන් තැනැත්තකු සමඟ කුමන්ත්‍රණය කරන

යම් තැනැත්තකු ඒ වරදට තමාම වරදකරු විය යුතු අතර ඒ අනුව ඒ ආකාරයෙන්ම නඩු විභාගයකට භාජන කරනු ලැබ හදිසි අවස්ථා නියෝග යටතේ ඒ වරදට නියමිත දඬුවමෙන් ම දඬුවම් කරනු ලැබිය යුතුය.

*වරදවල් කරන්නන්ට සහායදීම.*

43. යම් හදිසි අවස්ථා නියෝගයක් යටතෙහි වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු වරදකරු බව දන්නා හෝ විශ්වාස කිරීමට සෑහෙන හේතු ඇති කිසි ම තැනැත්තකු විසින් එකී වරද සඳහා ඒ තැනැත්තා අල්ලා ගැනීම, විභාග කරනු ලැබීම හෝ දඬුවම් දෙනු ලැබීම වැළැක්වීමේ, බාධා කිරීමේ හෝ මැඩහත් වීමේ අදහසින් ඒ තැනැත්තාට කිසිම සහායක් නොදිය යුතුය.

*පුද්ගල මණ්ඩල විසින් කරනු ලබන වරදවල්.*

44. යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ පුද්ගල මණ්ඩලයක් විසින් වරදක් කරනු ලැබූ අවස්ථාවක—

(අ) ඒ මණ්ඩලය සංස්ථාවක් නම්, ඒ සංස්ථාවේ හැම අධ්‍යක්ෂකයකුම, හා

(ආ) ඒ මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් නම්, ඒ ව්‍යාපාර ආයතනයේ හැම හවුල්කරුවකුම,

තමාගේ දැනුම නොමැතිව ඒ වරද කරනු ලැබූ බව, හා ඒ වරද කිරීම වැළැක්වීමට නියම ලෙස සම්පූර්ණයෙන් අනලස්ව ක්‍රියා කළ බව ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ වරදට වරදකරු වශයෙන් සැලකිය යුතුය.

*දඬුවම.*

45. (1) යම් හදිසි අවස්ථා නියෝගයක් හෝ එවැනි යම් නියෝගයක් යටතෙහි කරනු ලැබූ යම් ආඥාවක් හෝ ව්‍යවස්ථාවක් හෝ එවැනි නියෝගයක් යටතෙහි දෙනු ලැබූ නියමයක් හෝ නියම කරනු ලැබූ නියමයක් අනුව ක්‍රියා කිරීම යම් තැනැත්තකු උල්ලංඝනය කරතහොත් හෝ පැහැර හරිතහොත්, ඔහු වරදකට වරදකරු විය යුතුය. තවද මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ නඩු විභාගයකින් පසු වරදකරු කිරීමෙන් පසු ඒ නියෝගයෙහි සඳහන් යම් විශේෂ විධිවිධානවලට යටත්ව, මාස තුනකට අඩු නොවූ ද අවුරුදු පහකට වැඩි නොවූ ද, බරපතල වැඩ ඇතිව බන්ධනාගාර ගත කිරීමට හා රුපියල් පන්සියයකට අඩු නොවූ ද රුපියල් පන්දහකට වැඩි නොවූ ද දඩයකට යටත් විය යුතුය.

(2) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතෙහි වරදක් සඳහා ඒ නියෝගයෙහි දඬුවමක් නියම කරනු නොලැබූ අවස්ථාවක, ඒ වරද සම්බන්ධයෙන් වරදකරු වූ තැනැත්තකු මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ නඩු විභාගයකින් පසු, මේ නියෝගයෙහි (1) වෙනි ඡේදයෙහි නියම කරනු ලැබූ දඬුවමටම යටත් විය යුතුය. 20 අධි. 10 අධි.

(3) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතේ 238(2) වන වගන්තිය හදිසි අවස්ථා නියෝගයක් යටතෙහි වරදක් සම්බන්ධයෙන් වරදකරු වූ තැනැත්තකුට අදාළ නොවිය යුතුය.

## 6 වන කොටස—විමර්ශන, නඩු විභාග යනාදිය

*තොරතුරු එළිදරව් කිරීමේ යුතුකම.*

46. (අ) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වරදක් කිරීමේ චේතනාවක් හෝ ප්‍රයත්නයක් හෝ සූදානමක් ගැන දැන ගන්නා කවරකු වුවද ඒ පිළිබඳ තොරතුරු ආසන්නතම ග්‍රාම සේවකට හෝ ආසන්නතම පොලිසිය භාරව සිටින නිලධරයාහට හෝ අප්‍රමාදව දැන්විය යුතුය.

(ආ) (අ) ඡේදයේ සඳහන් තොරතුරු දැන්වීම ඕනෑකමින් පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතුය.

(ඇ) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වූ වරදකට සම්බන්ධ යම් තොරතුරක් ලබාගත් යම් ග්‍රාම සේවකයකු ඒ තොරතුර අප්‍රමාදව ආසන්නතම පොලිසිය වෙත යැවිය යුතුය.

*විමර්ශන කරන පොලිස් නිලධරයන්ගේ බලතල.*

47. යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වරදක් විමර්ශනය කරන යම් පොලිස් නිලධරයකු විසින්—

(අ) වරදට සම්බන්ධ කරුණු හා සිද්ධීන් පිළිබඳ දැනුමක් ඇතැයි සැක කෙරෙන යම් තැනැත්තකු ගෙන් වාචික ප්‍රශ්න අසා එසේ ප්‍රශ්න කරන ලද තැනැත්තා කළ යම් ප්‍රකාශයක් ලියා ගත යුතුය :

එසේ වුවද එබඳු ප්‍රකාශයක්, එය කරනු ලබන තැනැත්තා විසින් මෙන්ම එය සටහන් කර ගනු ලබන පොලිස් නිලධරයා විසින් ද අත්සන් කළ යුතුය :

තවද, එසේ වුවද යම් තැනැත්තකු විසින් ඒ ප්‍රකාශය අත්සන් කිරීම ප්‍රතික්ෂේප කළ අවස්ථාවක එම ප්‍රතික්ෂේප කිරීම පොලිස් නිලධරයා විසින් සටහන් කර ගත යුතුය ;

(ආ) ඒ තැනැත්තාගේ ආදර්ශ අත් අකුරු, ඡායාරූප, ඇඟිලි සටහන් සහ වෙනත් හඳුනා ගැනීමේ ලක්ෂණ ලබා ගත හැකිය ;

(ඇ) ඒ තැනැත්තා සෝදිසි කළ හැකිය ; නැතහොත් ඒ තැනැත්තා පදිංචි ගෙය හෝ වැඩ කරන ස්ථානය සෝදිසි කළ හැකිය ;

(ඈ) එබඳු යම් වරදකට පැටලුණු හෝ සම්බන්ධ නොහොත් පැටලී හෝ සම්බන්ධව ඇතැයි සැලකෙන යම් ස්ථානයකට, ගොඩනැගිල්ලකට, වාහනයකට හෝ යාත්‍රාවකට ඇතුළුවී එය සෝදිසි කළ හැකිය ; තවද

(ඉ) යම් විදුලි පණිවුඩයක්, තැපැල් ලේඛනයක්, හෝ යම් බැංකුවක වූ වෙනත් පොත් හෝ ලේඛන යක් ඇතුළුව, කවරාකාරයක වූ හෝ යම් වංචල දේපලක් පරීක්ෂා කොට තම සන්තකයට ගත හැකිය.

එසේ වුවද යම් බැංකුවකින් හෝ තැපැල් කාර්යාලයකින් යම් පොතක් හෝ ලේඛනයක් ලබාගැනීමට බලාපොරොත්තු වීමට පෙර, තනතුරින් සහකාර පොලිස් අධිකාරී කෙනෙකුට

වඩා පහත් නොවූ පොලිස් නිලධරයකු විසින් ඒ පොත හෝ ලේඛනය ඒ විමර්ශනයේ කාර්‍යයන් සඳහා අවශ්‍ය බව, අවස්ථාවෝචිත විය හැකි පරිදි, ඒ බැංකුව හෝ තැපැල් කාර්‍යාලය භාරව සිටින කළමනාකරු හෝ නිලධරයා වෙත කලින් ලියා දන්විය යුතුය.

සැක කරනු ලබන තැනැත්තන් සන්තකයෙහි තිබෙන ලේඛන.

48. යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ යම් වරදකට පැටලී ඇතැයි සැක කෙරෙන තැනැත්තකුගේ සන්තකයේ, භාරයේ හෝ පාලනයේ තිබී සොයා ගනු ලබන යම් පොතක්, ලේඛනයක් හෝ පත්‍රිකාවක්, ඒ වරද සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව කෙරෙන යම් නීතිකෘත්‍යවලදී අදාළ විය යුතු අතර ඒ පොතේ, ලේඛනයේ හෝ පත්‍රිකාවේ අඩංගු කරුණු තවදුරටත් ඔප්පු කිරීමක් නොමැතිව සාක්ෂි වශයෙන් පිළිගත යුතුය.

49. —

50. —

ප්‍රශ්න කිරීමේ අයිතිවාසිකම හා සහායවීමේ යුතුකම.

51. (අ) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වරදක් විභාග කරන පොලිස් නිලධරයකුට හෝ හදිසි අවස්ථා නියෝග යටතේ විධිමත් ලෙස බලය පවරනු ලැබූ තැනැත්තකුට වෙන යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇතද—

(i) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ රඳවා ගෙන සිටින හෝ අත් අඩංගුවේ රඳවා ගෙන සිටින තැනැත්තකු ඇතුළුව යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න කිරීමේ සහ එසේ ප්‍රශ්න කිරීමේ කාලය තුළ දී එවැනි විභාගයක කාර්යය සඳහා එම තැනැත්තා ස්ථානයෙන් ස්ථානයට ගෙන යෑමේ අයිතිවාසිකම් තිබිය යුතු ය, තව ද

(ii) එවැනි විභාගයක කාර්යයන් සඳහා අවශ්‍ය වන ලිපිලේඛන ඇතුළුව යම් භාණ්ඩයක් හෝ වෙනත් දෙයක් එසේ ප්‍රශ්න කරනු ලබන යම් තැනැත්තකුගෙන් භාරයට ගැනීමේ අයිති වාසිකම තිබිය යුතු ය.

(ආ) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වරදක් විභාග කරන පොලිස් නිලධරයකුට හෝ විධිමත් ලෙස බලය පවරන ලද වෙනත් තැනැත්තකුට සෑම සහයෝගයක් ම දීම සෑම තැනැත්තකුගේම යුතුකම විය යුතු ය ; මේ නියෝගයේ (අ) ඡේදයේ (1) වැනි අනුඡේදය යටතේ ප්‍රශ්න කරනු ලබන සෑම තැනැත්තෙක්ම ඔහුගෙන් අසනු ලබන සියලුම ප්‍රශ්නවලට සත්‍යවාදී ලෙස පිළිතුරු දිය යුතු අතර වෙන යම් නීතියක කුමක් සඳහන් ව ඇත ද යම් ලිපිලේඛනයක අඩංගු කරුණු ඇතුලුව විභාගයට විෂය වූ කරුණට අදළ සියලු තොරතුරු, එම තොරතුරු හෝ එම ලිපිලේඛනවල අඩංගු කරුණු පිළිබඳ දැනීම එම තැනැත්තාට ලැබී ඇත්තේ කවර ආකාරයකින් වුව ද අනාවරණය කළ යුතු ය.

(ඇ) මේ නියෝගයේ (අ) ඡේදය යටතේ ප්‍රශ්න කරනු ලබන තැනැත්තකු භාරයේ හෝ සන්තකයේ ඇති ලිපිලේඛනයක් ඇතුලු යම් භාණ්ඩයක් හෝ වෙනත් දෙයක් යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වරදක් විභාග කරන පොලිස් නිලධරයකු වෙත හෝ හදිසි අවස්ථා නියෝග යටතේ විධිමත් ලෙස බලය පවරනු ලැබූ තැනැත්තකු වෙත බාර දෙන ලෙස එවැනි පොලිස් නිලධරයකු හෝ බලය පවරනු ලැබූ තැනැත්තකු විසින් විධාන කරනු ලැබූ කල්හි එසේ බාරදීම එවැනි සෑම තැනැත්තකුගේම යුතුකම විය යුතුය.

(ඈ) මේ නියෝගයේ විධිවිධානවලින් යමක් උල්ලංඝනය කිරීම හෝ එය යටතේ නියම කරන ලද යම් යුතුකමක් කඩ කිරීම, මේ නියෝගවල 45 වැනි නියෝගය යටතේ දඬුවම් පැමිණවිය හැකි හදිසි අවස්ථා නියෝග යටතේවූ වරදක් විය යුතුය.

පොලිස් නිලධරයන්ට අවකාශ තිබීමේ අයිතිවාසිකම.

52. යම් තැනැත්තකු රඳවා හෝ රැකවරණයේ තබා ඇති කාල සීමාව තුළ ඒ විමර්ශනයේ කාර්‍යයන් සඳහා සාධාරණ කලවේලාවන්හිදී එකී යම් තැනැත්තකු වෙත යාමේ අයිතිය යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වරදක් විමර්ශනය කරන පොලිස් නිලධරයකු සතුව තිබිය යුතුය.

සාමාන්‍ය බලතලවලට අතිරේකව පොලිස් නිලධරයන්ගේ බලතල.

53. යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ පොලිස් නිලධරයකුගේ බලතල, වෙනයම් නීතියක් යටතේ ඔහු සතු බලතලවලට අතිරේකව මිස පටහැනිව නොවිය යුතුය.

පොලිස් නිලධරයකුගේ බලතල අන් සමහර නිලධරයන් සහ තැනැත්තන් විසින් පාවිච්චි කරනු ලැබිය හැකි බව.

54. (1) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ පොලිස් නිලධරයකුගේ බලතල පිළිවෙලින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති, ශ්‍රී ලංකා නාවික හමුදාධිපති හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාධිපති විසින් ඒ සඳහා බලය පවරනු ලැබූ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ යම් අධිකාරලත් නිලධරයකු විසින් පාවිච්චි කරනු ලැබිය හැකිය.

(2) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ පොලිස් නිලධරයකුගේ බලතල අගමැති විසින් ඒ සඳහා බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින්ද, පාවිච්චි කරනු ලැබිය හැකිය.

විට අංක සහ ඉන්ජන්ක්ෂන් තහනම් අත්හිටුවීම.

55. යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ සාදන ලද හෝ කරන ලද හෝ සාදන ලැබූ ලෙස හෝ කරනු ලැබූ ලෙස සැලකෙන යම් නියමයක්, විධානයක් හෝ සෙසු ක්‍රියාවක් කෙරෙහි හෝ සම්බන්ධයෙන් හෝ වෙනුවෙන් ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතේ 12 වන, 21 වන සහ 42 වන වගන්ති අදළ නො වන්නේය.

නීති කෘත්‍ය සඳහා ප්‍රමුඛත්වය.

56. අධිකරණයේ වෙන යම් කටයුත්තක හදිසිතාවය සම්බන්ධ විශේෂ කරුණු නිසා එසේ කිරීම අපහසුවුවොත් මිස, හදිසි අවස්ථා නියෝග යටතේ යම් තැනැත්තකු විසින් කරනු ලැබූ බවට චෝදිත වරදක් සම්බන්ධයෙන් යම් අධිකරණයක යම් නීතිකෘත්‍යයක්, ඒ අධිකරණයේ වෙනත් යම් කටයුතුවලට පෙර විභාග කරනු ලැබිය යුතුය.

පරීක්ෂණ හා නඩු විභාග.

57. (1) මෙහිලා අන් ලෙසකින් විධිවිධාන සලස්වා ඇති පරිද්දෙන් හැර සහ අන් කිසි ලිඛිත නීතියක් ගැන නොතකා, යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ පුද්ගලයකු විසින් කර ඇතැයි කියනු ලබන වරදක් පිළිබඳ නඩු විභාගය තත් කාලයෙහි ඒ තැනැත්තා සිටින ස්ථානය කෙරෙහි අධිකරණ බලය ඇති ශ්‍රී ලංකාවේ නිසි අධිකරණය ඉදිරියෙහි ආරම්භ කළ හැකිය.

(2) නීතිපති විසින්—

(අ) හදිසි අවස්ථා නියෝග යටතේ පුද්ගලයන් විසින් කර ඇතැයි කියනු ලබන වැරදි ; හෝ

(ආ) ඒ නියෝග යටතේ, නියම ලෙසින් හෝ අනියම් ලෙසින් යම් බලයක් පාවිච්චි කිරීම හෝ යුතුකමක් ඉටු කිරීම නැතහොත් කල්පිත පාවිච්චි කිරීම හෝ කල්පිත ඉටු කිරීම හේතු කොටගත් හෝ එයින් උද්ගත වූ නැතහොත් ඒ පාවිච්චි කිරීමේදී හෝ ඉටු කිරීමේදී කරන ලද හෝ නොකර හරින ලද ක්‍රියා වරදවල් ලෙස සංස්ථාපනය කෙරෙන වෙන යම් ලිඛිත නීතියක් යටතේ තැනැත්තන් විසින් කරන ලදැයි කියනු ලබන වරදවල්,

පිළිබඳ පරීක්ෂණ කවර අධිකරණයක දී පවත්වා නඩු විභාග කළ යුතුදැයි තීරණය කළ හැකිය. ඒ අධිකරණය ස්වකීය ප්‍රාදේශීය බලසීමාව ඇතුළත දී ඒ වරදවල් කරනු ලැබුයේ නම්, ඒ වරදවල් පිළිබඳ පරීක්ෂණ පවත්වා නඩු විභාග කළ හැකිව තුබූ අධිකරණයක් විය යුතුය.

(3) මේ නියෝගයේ (2) වැනි ඡේදය යටතේ යම් වරදක් ගැන පරීක්ෂණ පවත්වා නඩුව විභාග කළ යුතු තුමන අධිකරණයක් මගින් දැයි නීතිපති තීරණය කළ අවස්ථාවක ඒ වරද ගැන පරීක්ෂණ පවත්වා නඩුව විභාග කළ යුතු අධිකරණය ලෙස ඔහු විසින් තම ලිඛිත නියෝගයක් මගින් ඒ අධිකරණය නම් කළ යුතු අතර ඒ පරිද්දෙන්ම ඒ අධිකරණය විසින් ඒ නියෝගයේ බලය අනුව ඒ පරීක්ෂණය හෝ නඩු විභාගය පවත්වා ඒ නියෝගය ඒ පරීක්ෂණයේ හෝ නඩු විභාගයේ නීතිකෘත්‍ය සමඟ ගොනු කොට තැබිය යුතුය.

(4) මේ නියෝගයේ (2) වැනි ඡේදය යටතේ නීතිපති විසින් කරනු ලබන තීරණයක් පහත සඳහන් වරදවලට අදාළ කළ හැකිය :—

(අ) හදිසි අවස්ථා නියෝග යටතේ තැනැත්තන් විසින් ශ්‍රී ලංකාව මුළුල්ලේම හෝ ශ්‍රී ලංකාවේ යම් නිශ්චිත ප්‍රදේශයක කරන ලදැයි කියනු ලබන සියලු වරදවල් ; නැතහොත්

(ආ) යම් නිශ්චිත පන්තියක හෝ වර්ගයක තැනැත්තන් විසින් ශ්‍රී ලංකාව මුළුල්ලේම හෝ ශ්‍රී ලංකාවේ යම් නිශ්චිත ප්‍රදේශයක එසේ කරන ලදැයි කියනු ලබන සියලු වරදවල් ; නැතහොත්

(ඇ) ශ්‍රී ලංකාව මුළුල්ලේම හෝ ශ්‍රී ලංකාවේ යම් නිශ්චිත ප්‍රදේශයක තැනැත්තන් විසින් කරනු ලදැයි කියනු ලබන යම් නිශ්චිත පන්තියකට හෝ වර්ගයකට අයත් සියලුම වරදවල් ; නැතහොත්

(ඈ) ශ්‍රී ලංකාව මුළුල්ලේ හෝ ශ්‍රී ලංකාවෙහි යම් නිශ්චිත ප්‍රදේශයක, යම් නිශ්චිත පන්තියකට හෝ වර්ගයකට අයත් තැනැත්තන් විසින්, හෝ යම් නිශ්චිත තැනැත්තකු විසින් කර ඇතැයි කියනු ලබන යම් නිශ්චිත පන්තියකට හෝ වර්ගයකට අයත් සියලුම වරදවල් ; නැතහොත්

(ඉ) ශ්‍රී ලංකාව මුළුල්ලේ හෝ ශ්‍රී ලංකාවෙහි යම් නිශ්චිත ප්‍රදේශයක යම් නිශ්චිත තැනැත්තකු විසින් කර ඇතැයි කියනු ලබන යම් නිශ්චිත වරදක්.

(5) මෙම නියෝගය බලපවත්වන කාලය තුළ යම් සාපරාධ වරදක් පිළිබඳ යම් විභාගයක් හෝ නඩු විභාගයක් යම් අධිකරණයක හෝ ස්ථානයක සිට වෙනයම් අධිකරණයකට හෝ ස්ථානයකට මාරු කිරීමට නීතිපතිට බලය පවරන ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරණ යුක්තිය පසිඳලීමේ පනතේ 45 වන වගන්තියේ (2) වන උප වගන්තිය වලංගු නොවූවාක් මෙන් ඒ වගන්තිය ක්‍රියාත්මක විය යුතුය.

නීතිපතිගේ අනුමතිය.

58. (1) (අ) යම් හදිසි අවස්ථා නියෝගයකට විරුද්ධ වරදක් සඳහා, හෝ

(ආ) ඒ නියෝග යටතේ යම් බලතලයක් හෝ යුතුකමක් කෙලින්ම හෝ නොඑසේව ක්‍රියාත්මක කරවීමේදී හෝ ඉටු කිරීමේදී හෝ කල්පිත ක්‍රියාත්මක කරවීමේදී හෝ ඉටු කිරීමේදී, කිරීමෙන් හෝ නොකර හැරීමෙන් පැන නැඟුනු හෝ ඇති වූ වරදවල සංගෘහිත වන ක්‍රියා හෝ නොකර හැරීම වූ අන්කිසි ලිඛිත නීතියක් යටතේ තැනැත්තන් විසින් කරන ලදැයි හෝ කියනු ලබන වරදක් සඳහා හෝ

කිසි නඩු පැවරීමක් නීතිපති විසින් හෝ ඔහුගේ ලිඛිත අනුමැතිය ඇතිව හෝ මිස නොකළ යුතුය.

(2) ආඥාවෙහි නියම කරනු ලැබූ යම් හදිසි අවස්ථා නියෝගයකට විරුද්ධ යම් වරදක් සම්බන්ධයෙන් මේ නියෝගයෙහි (1) වෙනි ඡේදයෙහි විධිවිධාන අදාළ නොවිය යුතු යයි අගමැති විසින් ආඥාවෙන් ප්‍රකාශ කළ හැකිය. තවද ආඥාව බලපවත්වන තාක් ඒ වරදකට ඒ ඡේදය අදාළ නොවිය යුතුය.

මහාධිකරණ ඉදිරියේ නඩු විභාග.

59. (1) යම් හදිසි අවස්ථා නියෝගයක් හෝ වෙනත් ලිඛිත නීතියක් ගැන නොතකා, හදිසි අවස්ථා නියෝග යටතේ යම් වරදක් සම්බන්ධයෙන් වූ නඩු විභාගය නීතිපති විසින් අධි චෝදනා ඉදිරිපත් කරනු ලැබූ විට, පවත්වනු ලැබිය හැකි අතර එවිට මහාධිකරණයේ විනිශ්චයකාරවරුන් තිදෙනෙකු විසින් මහාධිකරණය ඉදිරියෙහි දී චූදිතයා පිළිබඳ නඩු විභාගය ජූරි සභාවක් නොමැතිව විභාග කළ යුතුය.

(2) මෙම නියෝගය යටතේ මහාධිකරණය ඉදිරියෙහි අධි චෝදනා ඉදිරිපත් කරනු ලැබ සිටින තැනැත්තකුට, නීතිපතිගේ අනුමැතිය ඇතිව මිස ඇප නියම නොකළ යුතුය.

(3) (2) වන ඡේදයෙහි විධිවිධානවලට යටත්ව මෙම නියෝගය යටතේ පැවැත්වෙන යම් නඩු විභාගයකදී අධිකරණය ඉදිරියෙහි චෝදනා කරනු ලබන සියලු තැනැත්තන් කැඳවීම, ඔවුන් සිරභාරයට ගැනීම, ඔවුන්ගේ රැකවරණය හෝ ඔවුන්ට ඇප නියම කිරීම සම්බන්ධයෙන් විධානයන් නිකුත් කිරීම එම නඩු විභාගය පවත්වන විනිශ්චයකාරවරයා විසින් කළ හැකිය.

(4) තමා සිරභාරයට ගනු ලැබීම යම් තැනැත්තකු මග හරින බව, පැනගොස් සැඟවී සිටින බව හෝ හොරලෙඩ ගෙන සිටින බව අධිකරණයට ඒත්තු ගියහොත් මේ නියෝගය යටතේ මහාධිකරණය ඉදිරියෙහි පැවැත්වෙන ඒ තැනැත්තා පිළිබඳ නඩු විභාගය ඒ තැනැත්තා නොපැමිණ සිටියදී ආරම්භ විය හැකිය. නැතහොත් එසේ පවත්වා ගෙන යා හැකිය.

(5) මෙම නියෝග යටතේ මහාධිකරණය ඉදිරියේ අධිචෝදනා ලැබ සිටින යම් තැනැත්තකු විසින්, එම නඩු විභාගය ආරම්භ වන දිනයට පෙර දින තිහක් ඉක්ම නොවිය යුතු යම් අවස්ථාවක, පැමිණිලි පක්ෂය විසින් කැඳවීමට අදහස් කරන සාක්ෂිකරුවන් විසින් කරන ලද ප්‍රකාශවල ද නඩු විභාගයේදී උපයෝගී කර ගැනීමට බලාපොරොත්තු වන ලේඛනවල ද පිටපත් තමාට සපයන ලෙස මහාධිකරණය වෙත ලිඛිත ඉල්ලීමක් මගින් අයැද සිටිය හැකි අතර, ඒ සියලු ප්‍රකාශවල හෝ ලේඛනවල පිටපත් හෝ ස්වකීය අභිමතය පරිදි සුදුසු යයි අධිකරණය සලකන ප්‍රකාශවල හෝ ලේඛනවල පමණක් පිටපත් ඒ තැනැත්තාට දිය යුතු යයි අධිකරණය විසින් නියම කළ හැකිය.

(6) මෙම නියෝගය යටතේ මහාධිකරණය ඉදිරියෙහි වූ නඩු විභාගයක්, අධිකරණය විසින් අණ කරනු ලැබිය හැකි හෝ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනත යටතේ පනවනු ලැබූ රීති මගින් නියම කරනු ලැබිය හැකි වෙනස් කිරීම්වලට යටත්ව, මහාධිකරණය ඉදිරියෙහි වූ වෙනත් නඩු විසඳීම් සම්බන්ධයෙන් අන් කිසි ලිඛිත නීතියක් යටතේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට හැකිතාක් ඉක්මණින් පැවැත්විය යුතුය.

(7) මෙම නියෝගය යටතේ පවත්වනු ලැබූ නඩු විභාගයකින් පසුව යම් වරදකරු කිරීමකදී කරනු ලබන ආයාචනයක් විභාග කිරීමේ කාර්යයන් සඳහා වූ ශ්‍රේෂ්ඨාධිකරණය, අග්‍රවිනිශ්චයකාරවරයා විසින් නම් කරනු ලබන විනිශ්චයකරුවන් පස් දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

ප්‍රකාශ සාක්ෂි වශයෙන් පිළිගැනීම.
14 අධි.

60. (1) හදිසි අවස්ථා නියෝග යටතේ වූ වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුගේ නඩු විභාගයකදී එම තැනැත්තා විසින් කරන ලද ප්‍රකාශයක් පාපොච්චාරණයක් වූවත්, නැතත්, එය කරන ලද අවස්ථාවේදී එම තැනැත්තා සිටියේ පොලිස් නිලධරයකුගේ රැකවරණයේ වූවත්, නැතත්, එම ප්‍රකාශය මහේස්ත්‍රාත් ඉදිරිපිටදීම කරන ලද්දක් වූවත්. නැතත්. එම ප්‍රකාශය සාක්ෂි ආඥාපනතේ 24 වැනි වගන්තිය යටතේ අනුචිත නොවේ නම් පමණක්ම ඔහුට විරුද්ධව ඔප්පු කළ හැකිය :

එසේ වුවද. එම ප්‍රකාශය තනතුරින් සහකාර පොලිස් අධිකාරී කෙනෙකුට වඩා පහළ පොලිස් නිලධරයකුට කරන ලද්දක් නම්, ඒ කිසිම ප්‍රකාශයක් එම තැනැත්තාට විරුද්ධව ඔප්පු නොකළ යුතුය.

(2) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වූ වරදක් සම්බන්ධයෙන් (1) වෙනි ඡේදය යටතේ යම් තැනැත්තකුට විරුද්ධවම ඔප්පු කළ හැකි, ඔහු විසින්ම කරන ලද ප්‍රකාශයක් මෙම නියෝගවල 47 වැනි නියෝගය යටතේ කරන ලද ප්‍රකාශයක් හැර වෙනත් සාක්ෂි මගින් වැදගත් විස්තරවලින් එම ප්‍රකාශය තහවුරු කළ හැකි නම් පමණක් ම එම වරද සඳහා හවුලේ චෝදනා කරනු ලැබ සිටින වෙන යම් තැනැත්තකුට විරුද්ධව ද ඔප්පු කළ හැකිය.

14 අධි.

(3) 1 වැනි හෝ 2 වැනි ඡේදයේ සඳහන් යම් ප්‍රකාශයක් සාක්ෂි ආඥාපනතේ 24 වැනි වගන්තිය යටතේ අදාළ නොවන බව ඔප්පු කිරීමේ භාරය එය අදාළ නොවන බව තරයේ කියා සිටින තැනැත්තා සතු විය යුතුය.

(4) යම් හදිසි අවස්ථා නියෝග යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් සාක්ෂි ආඥාපනතේ 25 වැනි, 26 වැනි සහ 30 වැනි වගන්තිවල විධිවිධාන අදාළ නොවිය යුතුය.

(5) යම් තැනැත්තකු විසින් කරන ලද ප්‍රකාශයක් ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරණ යුක්තිය පසිඳලීමේ පනතේ 70 වන වගන්තියේ (6) වන උප වගන්තියේ විධිවිධාන ගැන නොසළකා (1) වැනි ඡේදය හෝ (2) වැනි ඡේදය යටතේ ඔප්පු කළ හැකිය.

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතේ ඇතැම් විධිවිධාන අදාල නොවිය යුතු බව.

61. යම් හදිසි අවස්ථා නියෝග යටතේ පවත්වනු ලබන යම් පරීක්ෂණ සඳහා ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතේ විමර්ශණවලට අදාළ විධිවිධාන අදාළ නොවිය යුතුය.

ආණ්ඩුවේ රස පරීක්ෂකගේ සහතිකය සහ යම් දෙයක් හෝ ද්‍රව්‍යයක් ආණ්ඩුවේ රස පරීක්ෂක විසින් විනාශ කරනු ලැබීම.

62. (1) වරදක් සඳහා පැවැත්වෙන යම් නීතිකෘත්‍යයකදී, පරීක්ෂණය හෝ විශ්ලේෂණය සඳහා තමා වෙත ඉදිරිපත් කරන ලද යම් දෙයක හෝ ද්‍රව්‍යයක අනන්‍යතාව, සංයුතිය හෝ ස්වභාවය සම්බන්ධයෙන් ආණ්ඩුවේ රස පරීක්ෂකගේ, ආණ්ඩුවේ නියෝජ්‍ය රස පරීක්ෂකගේ හෝ ආණ්ඩුවේ සහකාර රස පරීක්ෂකගේ නැතහොත් ඒ තත්ත්වයෙන් කටයුතු කරන වෙනත් යම් නිලධරයකුගේ අත්සන යටතේ වූවක් ලෙස සලකනු ලබන සහතිකයක්, එම නීතිකෘත්‍යයේදී සාක්ෂි දීම පිණිස ඒ තැනැත්තා නොකැඳවාම, එම සහතිකයේ අඩංගු ප්‍රකාශයන්හි සත්‍යතාව පිළිබඳව තීරණාත්මක සාක්ෂි විය යුතුය.

(2) යම් වරදක් සම්බන්ධයෙන් පරීක්ෂණය හෝ විශ්ලේෂණය සඳහා තමා වෙත ඉදිරිපත් කරන ලද යම් දෙයක් හෝ ද්‍රව්‍යයක් තම භාරයේ තබා ගැනීම ආරක්ෂා රහිතය නැතහොත් කළ නොහැකිය යන මතය ආණ්ඩුවේ රස පරීක්ෂක, ආණ්ඩුවේ නියෝජ්‍ය රස පරීක්ෂක හෝ ආණ්ඩුවේ සහකාර රස පරීක්ෂක නැතහොත් ඒ තත්ත්වයෙන් කටයුතු කරන වෙනත් යම් නිලධරයකු විසින් දරනු ලැබූ අවස්ථාවක, ඒ නිලධරයා විසින් අවශ්‍ය පරීක්ෂණය හෝ විශ්ලේෂණය කිරීමෙන් පසු, ඒ දෙය හෝ ද්‍රව්‍යය බැහැර කිරීම හෝ විනාශ කිරීම කළ හැකිය.

(3) යම් දෙයක් හෝ ද්‍රව්‍යයක් (2) වැනි ඡේදයෙහි විධිවිධාන යටතේ බැහැර කරනු ලැබූ විට හෝ විනාශ කරනු ලැබූ විට අවස්ථාවෝචිත පරිදි ආණ්ඩුවේ රස පරීක්ෂක, ආණ්ඩුවේ නියෝජ්‍ය රස පරීක්ෂක හෝ ආණ්ඩුවේ සහකාර රස පරීක්ෂක නැතහොත් ඒ තත්ත්වයෙන් කටයුතු කරන වෙනත් යම් නිලධරයකු විසින් එසේ බැහැර කරනු ලැබූ හෝ විනාශ කරනු ලැබූ දෙය හෝ ද්‍රව්‍යය පිළිබඳව වාර්තාවක් තබා ගත යුතු අතර,

එම වාර්තාවේ සාරය හෝ අන්තර්ගත කරුණු ඇතුළත්, එවැනි යම් නිලධරයකුගේ අත්සන යටතේ වූවක් ලෙස සලකනු ලබන සහතිකයක් යම් වරදක් සඳහා වූ යම් නීතිකෘත්‍යයකදී සාක්ෂි දීම පිණිස ඒ නිලධාරියා නොකැඳවාම එම සහතිකයේ සඳහන් ප්‍රකාශයන්හි සත්‍යතාව පිළිබඳව තීරණාත්මක සාක්ෂි විය යුතුය.

(4) මෙම නියෝගයෙහි "වරද" යන්නෙන් යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ හෝ පුපුරණ ද්‍රව්‍ය පනත යටතේ හෝ 1966 අංක 18 දරන පිඩාකර ආයුධ පනත යටතේ හෝ තුවක්කු ආඥාපනත යටතේ හෝ දණ්ඩ නීති සංග්‍රහයේ VI වැනි පරිච්ඡේදය හෝ VII වැනි පරිච්ඡේදය හෝ VIII වැනි පරිච්ඡේදය යටතේ යම් වරදක් අදහස් වේ. 182 අධි. 183 අධි. 19 අධි.

පොලිස් ස්ථානය කදී පොලිස් නිලධරයකු විසින් යම් දෙයක් හෝ ද්‍රව්‍ය යක් විනාශ කිරීම සහ ආණ්ඩුවේ රස පරීක්ෂකගේ සහ පොලිස් නිලධර යාගේ සහතිකය.

62අ. (1) යම් පොලිස් ස්ථානයක තිබෙන යම් දෙයක් හෝ ද්‍රව්‍යයක් පරීක්ෂා කොට විශ්ලේෂණය කරන ලෙස ආණ්ඩුවේ රස පරීක්ෂකගෙන්, ආණ්ඩුවේ නියෝජ්‍ය රස පරීක්ෂකගෙන් හෝ ආණ්ඩුවේ සහකාර රස පරීක්ෂකගෙන් හෝ එම තනතුරේ වැඩබලන වෙනත් යම් නිලධරයකුගෙන් ඉල්ලා ඇත්තා වූත් එම දෙය හෝ ද්‍රව්‍යය පොලිස් ස්ථානයක ගබඩා කර තිබීම ආරක්ෂා සහිත නොවේ යැයි හෝ කළ නොහැකි යයි එම නිලධරයා අදහස් කරන්නාවූත් අවස්ථාවක—

(අ) එම දෙයෙහි හෝ ද්‍රව්‍යයෙහි නිදර්ශකයක් හෝ සැම්පලයක් ගැනීමෙන් ; සහ

(ආ) එම පොලිස් ස්ථානයෙහි තබා යන එම දෙයෙහි හෝ ද්‍රව්‍යයෙහි ප්‍රමාණය සටහන් කර ගැනීමෙන් පසුව, පොලිස් ස්ථානයෙහි තබා යන ලද එම දෙය හෝ ද්‍රව්‍යය ඉවත් කළ හැකි බවට හෝ විනාශ කළ හැකි බවට එම නිලධරයා විසින් පොලිස්පති වෙත ලියවිල්ලකින් උපදෙස් දියහැකිය.

(2) (1) වැනි ඡේදයෙහි දක්වන ලද ආකාරයට පොලිස්පති වෙත උපදෙස් දෙනු ලැබූ අවස්ථාවක, එම පොලිස් ස්ථානයෙහි තිබෙන්නා වූ ඒ දෙයෙහි හෝ ද්‍රව්‍යයෙහි ප්‍රමාණය සටහන් කර ගැනීමෙන් පසු, ඒ දෙය හෝ ද්‍රව්‍යය විනාශ කරන ලෙස හෝ බැහැර කරන ලෙස හෝ ඔහු විසින් පොලිස් නිලධරයකුට නියම කළ හැකිය.

(3) (2) වැනි ඡේදයෙහි සඳහන් යම් පොලිස් නිලධරයකු විසින් අත්සන් කර ඇතැයි සැලකෙන්නා වූත් එකී (2) වැනි ඡේදයේ යටතේ ඔහු විසින් තබා ගන්නා ලද සටහනෙහි සාරය හෝ කරුණු ඇතුළත්ව ඇත්තා වූත් සහතිකයක් යම් වරදක් පිළිබඳ කවර නීතිකෘත්‍යකදී වුවද එම පොලිස් නිලධරයාට එම නීතිකෘත්‍යයේදී සාක්ෂි දීමට නියම කිරීමක් නොමැතිවම, එම සහතිකයේ ඇතුළත් ප්‍රකාශවල සත්‍යතාව පිළිබඳ තීරණාත්මක සාක්ෂිය විය යුතුය.

(4) ආණ්ඩුවේ රස පරීක්ෂක, ආණ්ඩුවේ නියෝජ්‍ය රස පරීක්ෂක හෝ ආණ්ඩුවේ සහකාර රස පරීක්ෂක හෝ එම තනතුරේ වැඩබලන වෙනත් යම් නිලධරයකු විසින් අත්සන් කර ඇතැයි සැලකෙන,—

(අ) (1) වැනි ඡේදයෙහි (අ) අනුඡේදය යටතේ ඔහු විසින් ගන්නා ලද යම් නිදර්ශකයක හෝ සැම්පලයක අනන්‍යතාව, සංයුතිය හෝ ස්වභාවය ; හෝ

(ආ) (1) වැනි ඡේදයේ (ආ) අනුඡේදය යටතේ ඔහු විසින් කර ගන්නා ලද යම් සටහනක සාරය හෝ කරුණු පිළිබඳ වූ සහතිකයක්, යම් වරදක් පිළිබඳ කවර නීතිකෘත්‍යයකදී වුවද එම නිලධරයාට එම නීතිකෘත්‍යයේදී සාක්ෂිදීමට නියම කිරීමක් නොමැතිවම එම සහතිකයේ ඇතුළත් ප්‍රකාශවල සත්‍යතාව පිළිබඳ තීරණාත්මක සාක්ෂිය විය යුතුය.

(5) මෙම නියෝගයෙහි—

(අ) " පොලිස් නිලධරයා " යන්නෙන් පොලිස් ස්ථානයක් භාරව සිටින පොලිස් නිලධරයෙක් අදහස් වේ ;

(ආ) "වරද" යන්නෙන් යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ හෝ පුපුරණ ද්‍රව්‍ය පනත හෝ 1966 අංක 18 දරණ පිඩාකර ආයුධ පනත හෝ තුවක්කු ආඥාපනත යටතේ හෝ දණ්ඩ නීති සංග්‍රහයේ VI වැනි පරිච්ඡේදය හෝ VII වැනි පරිච්ඡේදය හෝ VIII වැනි පරිච්ඡේදය යටතේ යම් වරදක් අදහස් වේ.

## 7 වන කොටස—විවිධ

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතෙහි වෙනස් කිරීම.

63. (1) අගමැති විසින් ආඥාවකින් නියම කරනු ලබන ශ්‍රී ලංකාවේ යම් ප්‍රදේශයක මේ නියෝගය අඛණ්ඩව බල පැවැත්වෙන අතර—

(අ) නීති විරෝධී රැස්වීම් විසුරුවා හැරීමේ බලයට අදාළ වන, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතේ 58(1), 58(2), 58(3) සහ 58(4) වන වගන්ති බලපැවැත් වීම අවසන් විය යුතුය ;

(ආ) තවද තත්ත්වයෙන් සැරයන් කෙනෙකුට නොඅඩු තත්ත්වයක සිටින යම් පොලිස් නිලධරයකු විසින් හෝ තත්ත්වයෙන් කෝප්‍රල් කෙනෙකුට නොඅඩු තත්ත්වයක සිටින ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ යම් සාමාජිකයකු විසින් හෝ තත්ත්වයෙන් ප්‍රධාන නැවියකුට නොඅඩු තත්ත්වයක සිටින ශ්‍රී ලංකා නාවික හමුදාවේ යම් සාමාජිකයකු විසින් හෝ තත්ත්වයෙන් කෝප්‍රල් කෙනෙකුට නොඅඩු තත්ත්වයක සිටින ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ යම් සාමාජිකයකු විසින් හෝ යම් ප්‍රසිද්ධ මාර්ගයක, දුම්රිය මාර්ගයක, ප්‍රසිද්ධ පිට්ටනියක, පොදු විනෝද ක්‍රීඩා භූමියක හෝ වෙනත් ප්‍රසිද්ධ භූමියක, මුහුදු වෙරළෙහි හෝ යම් ප්‍රසිද්ධ ගොඩ නැගිල්ලක් හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් අසල හෝ එහි භූමියෙහි සිටින යම් තැනැත්තකු හෝ තැනැත්තන්ට විසිරී යාමට හා ආඥාවෙහි සඳහන් කරනු ලැබිය හැකි අන්දමේ වෙනත් ස්ථානයකට ඉවත්ව යෑමට අණ කළ හැකිය. තවද ඒ ආඥාව අනුව ක්‍රියා කිරීම ඒ තැනැත්තාගේ යුතුකම විය යුතුය.

(2) ආඥවක් නිකුත් කිරීමට බලය පවරනු ලැබූ යම් නිලධරයකු විසින් මේ නියෝගයෙහි (1) වෙනි ඡේදයේ (ආ) අනුච්ඡේදය යටතේ ආඥවකින් නිකුත් කරනු ලැබූ විට යම් තැනැත්තකු ඒ ආඥවට අනුකූලව ක්‍රියා නොකරතහොත් හෝ ඒ ආඥවට අනුකූලව ක්‍රියා නොකිරීමේ අධිෂ්ඨානයක් පෙන්වන ආකාරයට හැසිරෙතහොත් ඒ නිලධාරියා විසින්, අවශ්‍ය විය හැකි යම් සහායක් ඇතිව, සන්නද්ධ බලය ඇතුළු බලයෙන් ඒ ආඥව ක්‍රියාත්මක කිරීමට කටයුතු ආරම්භ කළ හැකි අතර ඒ තැනැත්තා ඉවත් කිරීමට හෝ සිරභාරයට ගෙන රඳවා තැබීමට සැලැස්විය හැකිය.

(3) මේ නියෝගය බලපවත්නා කාලය තුළ, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතේ 250(1), 250(2), 250(3) සහ 261(2) වන වගන්ති යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබූ හෝ වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකුට හෝ ඔහු සම්බන්ධයෙන් අදාළ නොවිය යුතුය.

ඇතැම් වැරදි විභාග කිරීමේ අධිකරණ බලය මහේස්ත්‍රාත් අධිකරණවලට ලැබිය යුතු බව.

63අ. ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරණ යුක්තිය පසිඳලීමේ පනතෙහි ඇතුළත් විධිවිධාන නොතකා, දණ්ඩ නීති සංග්‍රහයේ 317 වන වගන්තිය, 380 වන වගන්තිය, 382 වන වගන්තිය, 392 වන වගන්තිය, 440 වන වගන්තිය හෝ 443 වන වගන්තිය යටතේ දඬුවම් කළ හැකි යම් වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව ඇති සියලු නඩු අසා, විභාග කොට නිශ්චය කිරීමටත් ඒ වරද සම්බන්ධයෙන් දිසා අධිකරණයක් විසින් නියම කළ හැකි දණ්ඩන නියමයෙන් දෙකෙන් කොටසකට නොවැඩි බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් හෝ දඩයක් හෝ ඒ දණ්ඩන නියමය හා දඩය යන දඬුවම් දෙකම හෝ ඒ සෑම වරදක් ම සම්බන්ධයෙන් නියම කිරීමටත් මහේස්ත්‍රාත් අධිකරණයකට අධිකරණ බලය ලැබිය යුතු ය :

එසේ වුව ද තීන්දුව සටහන් කරනු ලැබීමට පෙර ඕනෑම වේලාවක මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරිපිට පැවැත්වෙන නඩු කටයුතුවලදී ඒ තැනැත්තා චෝදනා ලැබ සිටින වරද සම්බන්ධයෙන් හෝ එම වරද සිදු කරනු ලැබුවේ යම් ක්‍රියාකලාපයකදී ද ඒ ක්‍රියාකලාපයේදී ම සිදු කරනු ලැබූ වෙන යම් වරදක් සම්බන්ධයෙන් හෝ ඒ තැනැත්තාට විරුද්ධව අධිචෝදනාවක් තමා විසින් ඉදිරිපත් කර ඇති බව හෝ ඉදිරිපත් කිරීමට තමා අදහස් කරන බව රජයේ අපරාධ නඩු අධ්‍යක්ෂවරයා මහේස්ත්‍රාත්වරයාට දන්වා සිටින අවස්ථාවක, ඒ තැනැත්තාට විරුද්ධව මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරිපිට තවදුරටත් ඇති සියලු නඩු කටයුතු අත්හිටවනු ලැබිය යුතු අතර ඉනික්බිතිව ඒ තැනැත්තා විභාග කිරීමේ අධිකරණ බලය එම මහේස්ත්‍රාත් අධිකරණයට නොලැබිය යුතු ය.

ඇප.

64. (1) වෙන යම් නීතියක කුමක් සඳහන්ව ඇත ද—

(i) දණ්ඩ නීති සංග්‍රහයේ vi වන පරිච්ඡේදය හෝ vii වන පරිච්ඡේදය ;

(ii) ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරණ සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කරන ලද හෝ ලියාපදිංචි කරන ලදැයි සැලකෙන යම් සමිතියකට, යම් බැංකුවකට, යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට හෝ සම්පූර්ණ ප්‍රාග්ධනය හෝ ඉන් කොටසක් ආණ්ඩුව විසින් යොදනු ලැබූ යම් සංස්ථාවකට හෝ, අයත් යම් දේපළක් සම්බන්ධයෙන් කරනු ලබන, දණ්ඩ නීති සංග්‍රහයේ 367 වන වගන්තිය, 370 වන වගන්තිය, 386 වන වගන්තිය, 389 වන වගන්තිය, 391 වන වගන්තිය හෝ 394 වන වගන්තිය ; හෝ

(iii) යම් හදිසි අවස්ථා නියෝගයක් ; හෝ යටතේ යම් වරදකට සැක කරනු ලැබූ හෝ චෝදනා ලැබූ යම් තැනැත්තකු, නීතිපතිවරයාගේ පූර්ව අනුමතිය ඇතිව මිස, කිසිම මහේස්ත්‍රාත්වරයකු විසින් ඇප පිට මුදා හරිනු නොලැබිය යුතු ය :

එසේ වුව ද එවැනි යම් වරදක් පිළිබඳ පැමිණිල්ල නිස්සාර, පීඩාකාරී හෝ සුළු වරදක ස්වභාවයේ එකකැයි මහේස්ත්‍රාත්වරයා අදහස් කරන අවස්ථාවක හෝ (ii) වන අනුඡේදයෙහි සඳහන් දණ්ඩ නීති සංග්‍රහයේ වගන්තිවලින් කිසිවක් යටතේ කරන ලදැයි කියන වරද කරනු ලැබුවේ යම් දේපළක් සම්බන්ධයෙන් ද ඒ දේපළෙහි වටිනාකම රුපියල් පන් සියයකට වැඩි නොවන අවස්ථාවක හෝ මහේස්ත්‍රාත්වරයා විසින් නීතිපතිවරයාගේ පූර්ව අනුමතිය නොමැතිව එම තැනැත්තා ඇප පිට මුදා හරිනු ලැබිය හැකි ය.

(2) මේ නියෝගයේ (1) වන ඡේදයේ විධිවිධාන හේතුවෙන් තැනැත්තකු සිරභාරයෙහි රඳවාගනු ලබන සෑම කරුණකදීම, එම සිරභාරයේ රඳවා ගැනීම පිළිබඳව සහ එම කරුණට අදළ අවස්ථාගත කරුණු මහේස්ත්‍රාත්වරයා විසින් වහාම නීතිපතිවරයා වෙත දන්වා සිටිය යුතු ය.

(3) මේ නියෝගයේ (1) වන ඡේදයේ විධිවිධාන හේතුවෙන් යම් තැනැත්තකු එක් මසක අඛණ්ඩ කාලයක් සිරභාරයෙහි රඳවා ගනු ලැබ සිටි අවස්ථාවක, නීතිපතිවරයා අන්‍යාකාරයෙන් විධාන කරතහොත් මිස, මහේස්ත්‍රාත්වරයා විසින් එම තැනැත්තා ඇප පිට මුදා හැරිය යුතු ය.

(4) මහේස්ත්‍රාත්වරයකු විසින් යම් තැනැත්තකු ඇප පිට මුදා හරිනු ලැබූ විට එම තැනැත්තා එසේ මුදා හැරීම නොකළ යුතුව තිබුණේ යයි නීතිපතිවරයා විසින් මහේස්ත්‍රාත්වරයා වෙත දන්වනු ලබන අවස්ථාවක එම තැනැත්තා අත් අඩංගුවට ගෙන ඔහු සිරභාරයේ රඳවා තැබීමට අවශ්‍ය යම් පියවර මහේස්ත්‍රාත්වරයා විසින් වහාම ගත යුතු ය.

ප්‍රශ්නවලට පිළිතුරු දීමේ යුතුකම.

65. (1) අන්කිසි නීතියක පටහැනිව කුමක් සඳහන් වුවද, යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ සිරභාරයට ගෙන රඳවා ගනු ලැබූ යම් තැනැත්තකු, එසේ සිරභාරයට ගෙන නතර කර ගැනීමේ කාලසීමාව ඇතුළත පොලිස් නිලධරයකු විසින් හෝ යුද්ධ හමුදාපති, නාවික හමුදාපති හෝ ගුවන් හමුදාපති විසින් බලය දෙනු ලැබූ අන්කිසි නිලධරයකු විසින් හෝ ප්‍රශ්න කරනු ලැබීමට යටත් විය යුතුය. තවද තමාගෙන් අසනු ලැබූ ප්‍රශ්නයට පිළිතුරු දීම එසේ ප්‍රශ්න කරනු ලැබූ තැනැත්තාගේ යුතුකම විය යුතුය.

(2) (1) වැනි ඡේදය යටතේ සිරභාරයට ගෙන රඳවා ගෙන ඇති යම් තැනැත්තෙකුගෙන් ප්‍රශ්න කිරීමේ කාර්යය සඳහා හෝ ඒ ප්‍රශ්න කිරීමට සම්බන්ධ වෙනත් යම් කාර්යයක් සඳහා ඒ තැනැත්තා මේ නියෝගයෙහි (1) වැනි ඡේදයේ සඳහන් යම් නිලධරයකු විසින් ඔහු රඳවා ගෙන හෝ සිරභාරයේ තබා ගෙන ඇති යම් ස්ථානයකින් ඉවත් කොට එක් වරකට දින හතකට නොවැඩි කාලයක් එම නිලධරයාගේ තාවකාලික භාරයෙහි තබා ගත හැකිය.

තොරතුරු ලබා ගැනීමේ හෝ භාණ්ඩයක් පරීක්ෂා කිරීමේ බලය.

66. (1) මේ නියෝගවල ඇතුළත් විශේෂ විධිවිධානවලට හානියක් නොමැතිව, නියම බලධරයා විසින් හෝ ඔහු වෙනුවෙන්, ඒ සඳහා ඉල්ලීමක් කළ විටක, මහාජන ආරක්ෂාව සඳහා හෝ මහාජන සාමය පවත්වා ගෙන යාම සඳහා හෝ හදිසි අවස්ථා නියෝගයක කාර්‍ය සඳහා හෝ ලබා ගැනීමට හෝ පරීක්ෂා කරනු ලැබීමට, අවශ්‍ය යයි නැතහොත් යෝග්‍ය යයි බලධරයාට හෝ ඉල්ලීම කරන තැනැත්තාට අදහස්වන, ඉල්ලීමෙහි සඳහන් කරනු ලැබූ තොරතුරක් හා එසේ සඳහන් කරනු ලැබූ ලෙස තම ස්වාමිත්වයෙහි ඇති භාණ්ඩයක්, ඉල්ලීමෙහි සඳහන් කරනු ලැබූ ඒ බලධරයාට හෝ තැනැත්තාට යම් තැනැත්තකු විසින් සැපයිය යුතුය. නැතහොත් ඉදිරිපත් කළ යුතුය. තවද මේ නියෝගය යටතේ යථා පරිදි ඔහු වෙත කරනු ලැබූ ඉල්ලීමක් ප්‍රකාර, යම් තොරතුරක් හෝ තම ස්වාමිත්වයෙහි ඇති භාණ්ඩයක් සැපයීම හෝ ඉදිරිපත් කිරීම යම් කෙනෙකු පැහැර හැරියහොත් ඔහු වරදකට වරදකරු විය යුතුය.

(2) මේ නියෝගයෙහි " භාණ්ඩය " යන්නට යම් පොතක්, ගිණුමක් හෝ ලේඛනයක් ඇතුළත් වෙයි.

67. —

තහනම් කරනු ලැබූ සංවිධාන.

68. (1) (අ) මහාජන ආරක්ෂාවට, මහාජන සාමය පවත්වාගෙන යාමට හෝ අත්‍යවශ්‍ය සේවාවන් පවත්වාගෙන යාමට හානිකර කාර්‍ය සඳහා ; හෝ

(ආ) මේ නියෝගවල 38 වෙනි නියෝගයෙහි (2) වෙනි ඡේදයෙහි (අ) අනුච්ඡේදයෙහි හෝ (ආ) අනුච්ඡේදයෙහි හෝ 24 වෙනි නියෝගයෙහි (අ) සිට (උ) තෙක් අනුච්ඡේදවල සඳහන් කරනු ලැබූ කාර්යයන් අතුරෙන් යමක් සඳහා

සංවිධානය විසින් හෝ එහි සාමාජිකයන් හෝ අනුගාමිකයන් විසින් ක්‍රියා කිරීමේ අන්තරාය ඇතැයි හෝ සංවිධානය හෝ එහි සාමාජිකයන් හෝ අනුගාමිකයන් යොදවා ගැනීමේ අන්තරාය ඇතැයි යම් සංවිධානයක් සම්බන්ධයෙන් අගමැති සෑහීමට පත්වන අවස්ථාවක, ඒ සංවිධානය තහනම් කරනු ලැබූ සංවිධානයක් යයි ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ආඥාවකින් අගමැති විසින් ප්‍රකාශයට පත් කළ හැකිය.

(2) මේ නියෝගයේ (1) වෙනි ඡේදය යටතේ යම් සංවිධානයක් තහනම් කරනු ලැබූ සංවිධානයක් යයි ප්‍රකාශයට පත් කරනු ලැබූ අවස්ථාවක, තහනම් කරනු ලැබූ සංවිධානය මගින් පවත්වා ගෙන යනු ලබන හෝ කලින් පවත්වා ගෙන යනු ලැබූ කටයුතුවලට සමාන කටයුතුවල නියුක්ත සෙසු සෑම සංවිධානයකටම හා සෑම පුද්ගලයකුටම හෝ පුද්ගල මණ්ඩලයකටම හෝ තැනැත්තන් සමූහයකටම, ඒ සංවිධානය, පුද්ගලයා හෝ පුද්ගල මණ්ඩලය හෝ තැනැත්තන් සමූහය තහනම් කරනු ලැබූ සංවිධානයක් වූ පරිදි මේ නියෝගය අදාළ විය යුතුය.

(3) කිසිම තැනැත්තකු විසින්—

(අ) තහනම් කරනු ලැබූ සංවිධානයක් විසින් හෝ එහි යම් සාමාජිකයකු විසින් හෝ කළමනාකරුවකු විසින් පළ කරනු ලැබූ හෝ පළ කරනු ලැබී යයි හැඟෙන යම් ලිඛිත හෝ මුද්‍රිත ද්‍රව්‍ය සකස් කිරීම, මුද්‍රණය කිරීම, හෝ බෙද හැරීම, හෝ එබඳු ද්‍රව්‍ය සකස් කිරීමට, මුද්‍රණය කිරීමට හෝ බෙද හැරීමට යම් ආකාරයකින් සම්බන්ධව සිටීම ; හෝ

(ආ) සංවිධානය විසින් හෝ එහි යම් කළමනාකරුවකු විසින් කරනු ලැබූ හෝ කරනු ලැබී යයි හැඟෙන යම් ආඥාවක්, තීරණයක්, ප්‍රකාශයක් හෝ උපදේශයක්, හෝ ඊට අදාළ වන යම් තොරතුරක් යම් ආකාරයකින් අන් කිසි තැනැත්තකුට දැනුම් දීම හෝ දැනුම් දීමට තැත් කිරීම ; හෝ

(ඇ) සංවිධානයේ හෝ එහි යම් සාමාජිකයන්ගේ හෝ කළමනාකරුවන්ගේ හෝ යම් රැස්වීමක් කැඳවීම, හෝ ඊට සහභාගිවීම ; හෝ

(ඈ) සංවිධානයට බැඳෙන ලෙස හෝ ඊට ආධාර කරන ලෙස අන්කිසි තැනැත්තකු හට ආරාධනා කිරීම හෝ උනන්දු කිරීම ; හෝ

(ඉ) සංවිධානයේ කාර්‍ය සඳහා මුදලින් හෝ අන් ලෙසකින් ආධාර ඉල්ලීම හෝ එකතු කිරීම හෝ ඉහත දැක්වෙන පරිදි යම් ආධාරයක් දීම ; හෝ

(ඊ) සංවිධානයේ කළමනාකරුවකු හෝ සාමාජිකයකු වශයෙන් තම තත්ත්වය අනුව, හෝ තමා ඒ තත්ත්වය අනුව ක්‍රියා කරන බව විශ්වාස කරන ලෙස අන් කිසි තැනැත්තකු පෙළඹී විය හැකි අන්දමේ කරුණු යෙදී තිබියදී, යම් ක්‍රියාවක් හෝ දෙයක් කිරීම හෝ කිරීමට තැත් කිරීම ; හෝ

(උ) එම සංවිධානයේ යම් සාමාජිකයකු හෝ එම සංවිධානයේ සාමාජිකයකු යයි සැක කරනු ලබන යම් පුද්ගලයකු රඳවා තබාගැනීම හෝ සඟවා තබාගැනීම

නොකළ යුතුය.

(4) නීතිපති විසින් හෝ සංවිධානයේ යම් සාමාජිකයකු හෝ සංවිධානයේ ණය හිමියකු විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට, යම් සංවිධානයක් මේ නියෝගයට අදාළ වන සංවිධානයක් යයි මහාධිකරණයට පෙනී ගියහොත්, සංවිධානය විසින් හෝ එය සඳහා හිමි කරගනු ලැබූ දේපළ අධිකරණයේ අවසරය නොමැතිව බැහැර කිරීමක් වැළැක්වීමට අවශ්‍ය යයි පෙනී යන අන්දමේ ආඥාවක් කිරීම ද, ඉහත දැක්වෙන පරිදි යම් දේපළක් සම්බන්ධව හා සංවිධානයේ කටයුතු සම්බන්ධව පරීක්ෂණයක් පවත්වා වාර්තාවක් සකස් කරනු ලබන ලෙස නියම කිරීම ද, සංවිධානයේ ගණන් බේරා වසා දැමීම හා විසුරුවා හැරීම සඳහාත්, එබඳු යම් පරීක්ෂණයක්, හා වාර්තාවක් සහ සංවිධානයේ ගණන් බේරා වසා දැමීම හා විසුරුවා හැරීම සම්බන්ධයෙන් දරනු ලැබූ යම් වියදම් පිළිබඳව හෝ ඒ සඳහාත්, අධිකරණයේ අනුමතිය ඇතිව ඉල්ලීමේ දිනයට පෙර හෝ ඉන්පසුව නීත්‍යානුකූලව බැඳුනු සංවිධානයේ ණයතුරුස් නිදහස් කිරීම පිළිබඳව හෝ ඒ සඳහාත් එබඳු යම් දේපලක් ඉහත දැක්වුණු පරිදි යෙදවීම සඳහාත් යුක්ති සහගත හා සාධාරණ යයි අධිකරණයට පෙනී යන අන්දමේ අතිරේක ආඥාවන් කිරීම ද, අධිකරණය විසින් කළ හැකිය. තවද, ඉහත දැක්වුණු පරිදි යොදවනු ලැබීමට අධිකරණය විසින් නියම නො කරනු ලබන එබඳු යම් දේපලක් ජනරජය වෙත සන්තක කළ යුතුයයි අධිකරණය විසින් අණ කළ යුතුය.

(5) මේ නියෝගයෙහි " කළමනාකරු " යන්නෙන්, යම් සංවිධානයක් සම්බන්ධව, සංවිධානයේ යම් නිලධාරියකු ද සංවිධානයේ කළමනාකාරත්වයට හෝ පාලනයට සහභාගි වන, නැතහොත් කළමනාකාර හෝ පාලන තත්ත්වයක් දරන හෝ දරන බව හඟවන යම් තැනැත්තෙක් ද අදහස් වේ.

**බෝම්බ ආදියෙන් තුවාලලත් පුද්ගලයන්ට සහාය වීම.**

69. (1) තුවක්කුවක්, බෝම්බයක්, පුපුරණ ද්‍රව්‍යයක් හෝ වෙනත් මාරක ද්‍රව්‍යයක් හෝ උපක්‍රමයක් පාවිච්චි කිරීමේ හේතුවෙන් තුවාල ලබා ඇතැයි පෙනෙන තුවාලකරුවකුට යම් වෛද්‍යාධාරයක් දෙන්නා වූ හෝ එකී තුවාලකරුවෙකුට වෛද්‍යාධාර ඉල්ලා සිටිනු ලබන්නා වූ යම් පුද්ගලයකු විසින් එකී තුවාලකරුගේ අනන්‍යතාවය පිළිබඳ විස්තරත් එම තුවාලයේ විස්තර සහ හැකි සෑම අවස්ථාවකදීම, එය සිදුවී ඇත්තේ කුමණ හේතූන් යටතේ ද යනුත් සටහන් කරගෙන ළඟම පිහිටි පොලිස් ස්ථානයට එම විස්තර වහාම සැපයිය යුතුය.

(2) (1) වෙනි ඡේදයෙහි සඳහන් එම විස්තර සැපයීම වුවමනාවෙන්ම නොකරන යම් පුද්ගලයකු වරදකට වරදකරු විය යුතුය.

**ආණ්ඩුවේ දිසාපතිවරයෙකුගේ බලතල, යුතුකම් හා කාර්යයන් සම්බන්ධතා නිලධරයෙකු විසින් පාවිච්චි කිරීම හෝ ඉෂ්ට කිරීම කළ හැකි බව.**

70. (1) ආඥාවෙහි නියමිත, ශ්‍රී ලංකාවේ යම් ප්‍රදේශයක් සඳහා සම්බන්ධතා නිලධරයකු ලෙස යම් තැනැත්තකු නාමයෙන් හෝ නිලයෙන් අගමැති විසින් ආඥාවක් මගින් පත් කළ හැකිය.

(2) ශ්‍රී ලංකාවෙහි යම් ප්‍රදේශයක් සඳහා ආඥාවක් මගින් සම්බන්ධතා නිලධරයකු අගමැති විසින් පත් කළ විටක ඒ නිලධරයා විසින් ලිඛිත නීතියක් යටතේ හෝ අන් ලෙසකින් දිසාපති වෙත පැවරුණු හෝ නියමිත සියලු බලතල යුතුකම් හෝ කටයුතු ඒ ප්‍රදේශය තුළ ක්‍රියාවේ යෙදවිය යුතුය. ඉෂ්ට කළ යුතුය. නැතහොත් කළ යුතුය. තවද ඒ කාර්යය සඳහා ඒ ලිඛිත නීතියෙහි දිසාපති ගැන වූ හැම සඳහන් කිරීමක්ම ඒ ප්‍රදේශය පිළිබඳව අදාළ කිරීමෙහි දී, ඒ සම්බන්ධතා නිලධරයා ගැන වූ සඳහන් කිරීමක් ලෙස තේරුම් ගත යුතුය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී